# HARTI



## වාර්ෂික වාර්තාව
## வருடாந்த அறிக்கை
## ANNUAL REPORT

## 2024

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
ஹெக்டர் கொப்பேகடுவ கமநல ஆராய்ச்சி, பயிற்சி நிறுவகம்
Hector Kobbekaduwa Agrarian Research and Training Institute

# පටුන

| | | |
|---|---|---|
| **පරිච්ඡේදය - 01** | | |
| ආයතන පැතිකඩ/විධායක සාරාංශය | | 01-10 |
| 1.1 | හැඳින්වීම | 02 |
| 1.2 | සංවිධාන ව්‍යුහය | 04 |
| 1.3 | පාලක මණ්ඩලය | 06 |
| 1.4 | පාලක මණ්ඩල රැස්වීම් | 07 |
| 1.5 | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් | 07 |
| 1.6 | විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය | 08 |
| 1.7 | පර්යේෂණ හා පුහුණු කමිටුව | 08 |
| 1.8 | විධායක සාරාංශය | 10 |
| **පරිච්ඡේදය - 02** | | |
| ප්‍රගතිය සහ අනාගත දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග සහ අනාගත ඉලක්ක | | 11- 44 |
| 2.1 | පර්යේෂණ අංශ | 11 |
| 2.2 | පර්යේෂණ ප්‍රගතිය | 12 |
| 2.3 | අධ්‍යාපන හා පුහුණු අංශය | 27 |
| 2.4 | දත්ත කළමනාකරණ අංශය | 33 |
| 2.5 | තොරතුරු හා සන්නිවේදන අංශය | 34 |
| 2.6 | පුස්තකාලය | 38 |
| 2.7 | බාහිර සහයෝගීතාවයන් | 39 |
| **පරිච්ඡේදය - 03** | | |
| වාර්ෂික මූල්‍ය කාර්යසාධනය | | 44-72 |
| 3.1 | අවසන් ගිණුම | 45 |
| 3.2 | විගණන නිරීක්ෂණ | 62 |
| 3.3 | විගණන පිළිතුරු | 69 |
| **පරිච්ඡේදය - 04** | | 73 |
| කාර්යසාධක දර්ශක | | |
| **පරිච්ඡේදය- 05** | | **74-77** |
| තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීමේ කාර්යසාධනය හා ක්‍රියාකාරී සැලැස්ම ප්‍රගතිය | | |
| **පරිච්ඡේදය- 06** | | **78-79** |
| මානව සම්පත් පැතිකඩ | | |
| **පරිච්ඡේදය- 07** | | **80- 85** |
| අනුකූලතා වාර්තාව | | |

# 01 වැනි පරිච්ඡේදය
# ආයතන පැතිකඩ/විධායක සාරාංශය



## 1.1 හැඳින්වීම

හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය (Hector Kobbekaduwa Agrarian Research and Training Institute - HARTI) 1972 අංක 05 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද කෘෂිකර්ම අමාත්‍යාංශය ට අනුබද්ධිත ව්‍යවස්ථාපිත ආයතනයකි. ගොවිකටයුතු සහ ග්‍රාමීය සංවර්ධනය ට අදාළ සමාජ - ආර්ථික පර්යේෂණ සිදුකිරීම සහ එම පර්යේෂණයන් හි සොයා ගැනීම්, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත යොමු කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යභාරයකි. සමාජ - ආර්ථික හා ග්‍රාමීය සංවර්ධනයේ කෘෂිකාර්මික පැතිකඩ පිළිබඳ විමර්ශනය කිරීමට බලය පැවරී ඇති ආයතනය ද මෙම ආයතනය යි. වසර 53ක ඉතිහාසය පුරා රාජ්‍ය සහ පුද්ගලික අංශ, පර්යේෂකයන් සහ පොදු ජනතාව වෙනුවෙන් උසස් තත්ත්වයේ දත්ත හා තොරතුරු ලබාදීමේ වැදගත් කාර්යභාරයක් මෙම ආයතනය විසින් ඉටු කරනු ලැබ ඇත. වැඩමුළු සංවිධානය කිරීම තුළින් සියලුම පාර්ශ්වකරුවන් ට පර්යේෂණවල සොයා ගැනීම් හුවමාරු කිරීම සඳහා පහසුකම් සැපයීම අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ. එක් එක් ක්ෂේත්‍රයන් ට අදාළ ව සංවිධානය කෙරෙන පුහුණු වැඩසටහන් තුළින් ආකල්ප සංවර්ධනය, ගොවීන්, නිලධාරීන් ඇතුළු අනෙකුත් පාර්ශ්වයන්ගේ කුසලතා සහ දැනුවත්භාවය ඉහළ නැංවීම මෙම ආයතනයෙන් ඉටු කෙරෙන තවත් වැදගත් කාර්යභාරයන් ලෙස සඳහන් කළ හැකි ය.

**දැක්ම**

- තිරසාර ගොවිජන හා ග්‍රාමීය සංවර්ධනය සඳහා නව දැනුම ජනනය කර බෙදා හැරීමේ ප්‍රමුඛයා වීම.

**මෙහෙවර**

- පර්යේෂණ හා පුහුණු කිරීම් ඔස්සේ ගොවිජන හා ග්‍රාමීය ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම.

**ඉලක්ක**

- දැනුම උත්පාදනය කිරීම සහ කාලෝචිත ලෙස ව්‍යාප්ත කිරීම තුළින් ප්‍රතිපත්ති ක්‍රියාවලිය වඩාත් ඵලදායී මට්ටමකට පත් කිරීම.
- ජාතික ප්‍රතිපත්තිමය ගැටලු සම්බන්ධයෙන් ස්වාධීන තක්සේරුවක් ලබාදීමෙන් මහජනතාව දැනුවත් කිරීම.
- ආයතනයේ කාර්ය මණ්ඩලය සහ දැනුමේ පදනම සඳහා ආයෝජනය කිරීම මඟින් සමාජ-ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණය ට ඇති හැකියාව ශක්තිමත් කිරීම.
- පුහුණුව තුළින් ග්‍රාම සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම.

**අරමුණු**

- ප්‍රතිපත්ති සම්පාදකයින්, ගොවීන් සහ වෙළෙඳුන් වෙත වෙළෙඳපොළ තොරතුරු කාලෝචිත ලෙස බෙදා හැරීම.
- ගොවිජන ප්‍රතිපත්ති ඉදිරි දර්ශක හඳුනාගැනීම.
- කෘෂිකාර්මික ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණ සැලසුම් කිරීම හා ප්‍රමුඛතා සැකසීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධාන, විශ්වවිද්‍යාල, ජාත්‍යන්තර සහ කලාපීය පර්යේෂණායතන / නියෝජිතායතන සමඟ සබඳතා ගොඩනඟා ගැනීම.
- කැප වූ, දක්ෂ හා තෘප්තිමත් සේවක කණ්ඩායමක් සම්බන්ධ කර ගැනීම.

**උපාය මාර්ග**

- පර්යේෂණ හා පුහුණු කමිටුව (Research and Training Committee - RTC) ශක්තිමත් කිරීම
- තේමාවන් අදාළ ක්ෂේත්‍ර පිළිබඳ එකඟත්වය ලබා ගැනීම
- විවිධ වර්ගයේ ප්‍රකාශනවල ඒකාකාරතාව සහතික කිරීම
- පර්යේෂණ යෝජනාවක් සකස් කිරීමේ දී සාහිත්‍ය සමාලෝචනය වැඩි දියුණු කිරීම
- ප්‍රකාශයට පත් කිරීමට පෙර සියලු ම පර්යේෂණ වාර්තා සම-සමාලෝචනයෙන් පසු බාහිර සමාලෝචනයන් වෙත යොමු කිරීම
- ආයතන සහරාවේ සෑම කලාපයක ම වගකීම අදාළ අංශයට පැවරීම
- වෘත්තීය සංස්කාරකවරුන්ගේ සේවාවන් සුරක්ෂිත කිරීම සඳහා අනුශාසකවරුන්ගේ සහාය ලබා ගැනීම
- සිංහල සහ දමිළ භාෂාවෙන් වැඩි පර්යේෂණ වාර්තා ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කිරීම
- ජ්‍යෙෂ්ඨ මට්ටමේ පර්යේෂකයන් බඳවා ගැනීම
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හරහා විදේශීය පර්යේෂකයන් සම්බන්ධ කර ගැනීමේ හැකියාව සොයා බැලීම.
- විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධතා තහවුරු කර ගැනීම
- වසර අවසානයේ දී පර්යේෂණ සොයා ගැනීම් තුළින් ලබා ගත් දැනුම බෙදා හැරීම සඳහා ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ පැවැත්වීම
- කාර්ය සාධනය මත පදනම් වූ මැනිය හැකි ඇගයීම් පද්ධතියක් හඳුන්වා දීම
- ධාරිතාවයන් හා පහසුකම් වැඩි දියුණු කිරීම
- මුද්‍රිත ප්‍රකාශනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම

## 1.2 සංවිධාන ව්‍යුහය


සභාපති සහ
පාලක මණ්ඩලය
අධ්‍යක්ෂ
පර්යේෂණ සහ පුහුණු
කමිටුව
ලේඛකාධිකාරී
අතිරේක අධ්‍යක්ෂ
අංශ ප්‍රධාන
ආහාර
පද්ධතිය
අංශය
අංශ ප්‍රධාන
ග්‍රාමීය
සංවර්ධනය
අංශය
අංශ ප්‍රධාන
අධ්‍යාපනය සහ
පුහුණු කිරීම
අංශය
අංශ ප්‍රධන
පරිසරය
අංශය
අංශ ප්‍රධාන
තොරතුරු සහ
සන්නිවේදනය
අංශය
අංශ ප්‍රධාන
දත්ත
කළමනාකරණය
අංශය
පර්යේෂණ කාර්ය
මණ්ඩලය
පරිපාලනය
කාර්ය මණ්ඩලය
වැඩසටහන්
ඒකක කාර්ය මණ්ඩලය
ප්‍රකාශන ඒකකය
පුස්තකාලයාධිපති

# HECTOR KOBBEKADUWA AGRARIAN RESEARCH & TRAINING INSTITUTE

## ORGANIZATION CHART 2015

HARTI




| | |
|---|---|
| 1. Director | 01 |
| 2. AD-Addtional Director | 01 |
| 3. Registrar | 01 |
| 4. Head/RF (Research Fellow) MFPA-Marketing Food Policy | 05 |
| 5. Head/RF HRID-Human Resourse & Institute Development | |
| 6. Head/RF APPE-Agricultural Policy & Project Evaluation | |
| 7. Head/RF ARM-Agricultural Resourse Management | |
| 8. Head/RF EWRM-Environment Water Resourse Management | |
| 9. SRO-Senior Research Officer | 19 |
| 10. IA-Internal Auditor | 01 |
| 11. Asst.Dir.(Admin)-Assistant Director (Administration) | 01 |
| 12. Accountant | 02 |
| 13. SSO-Senior Statictical Officer | 01 |
| 14. Editor | 02 |
| 15. AR(P)-Assistant Registrar (Programme) | 01 |
| 16. SIPO-Senior Information & Publication Officer | 01 |
| 17. Librarian | 01 |
| 18. SDA-Senior Data Analyst | 01 |
| 19. SAP-Senior Analyst Programmer | 01 |
| 20. RO-Research Officer | 24 |
| 21. PA-Personal Assistant to the Director | 01 |
| 22. AO-Accounts Officer | 01 |
| 23. AO-Administrative Officer | 02 |
| 24. SO-Statistical Officer | 12 |
| 25. IPO-Information & Publication Officer | 04 |
| 26. Asst.Laibrarian | 01 |
| 27. DA-Data Analyst | 02 |
| 28. AP-Analyst Programmer | 01 |
| 29. SA-Statistical Assistant | 30 |
| 30. IAA-Internal Audit Assistant | 01 |
| 31. TA-Transport Assistant | 01 |
| 32. TA-Technical Assistent | 02 |
| 33. CTA-Computer Technical Assistent | 01 |
| 34. BK-Book Keeper | 01 |
| 35. HK-House Keeper | 01 |
| 36. VAT.Visual Aide Technician | 02 |
| 37. Library Assistant | 02 |
| 38. Management Assistant | 54 |
| 39. Drivers | 18 |
| 40. CBK-Circuit Bunglow Keeper | 01 |
| 41. Binding Operator | 01 |
| 42. Office Aide | 33 |
| Labours | |
| Conference Hall Attendent | |
| Hostel Attendent | |
| Printing Aide | |
| Library Attendent | |
| Total | 235 |

## 1.3 පාලක මණ්ඩලය - 2024

| | | |
|---|---|---|
| ජානක ධර්මකීර්ති මහතා | පාලක මණ්ඩල සභාපති (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | ලේකම් - කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| එම්.පී.එන්.එම්. වික්‍රමසිංහ මහතා | පාලක මණ්ඩල සභාපති (2024 ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා) | ලේකම් - කෘෂිකර්ම, ඉඩම්, පශුසම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය |
| ඩී.පී. වික්‍රමසිංහ මහතා | පාලක මණ්ඩල සභාපති (2024 දෙසැම්බර් සිට) | ලේකම් - කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය |
| ආචාර්ය ජී.ජී. බන්දුල මහතා | අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී 2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| පී.එම්.එච්. ප්‍රියදර්ශනී මහත්මිය | අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී (2024 ඔක්තෝම්බර් සිට නොවැම්බර් දක්වා) | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| මහාචාර්ය ඒ.එල්. සන්දික මහතා | අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී (2024 දෙසැම්බර් සිට) | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| පී. මාලතී මහත්මිය | පාලක මණ්ඩල සාමාජිකා (2024 ජනවාරි සිට පෙබරවාරි දක්වා) | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| කේ.එන්.එස්. රණතුංග මිය | පාලක මණ්ඩල සාමාජිකා (2024 අප්‍රේල් සිට අගෝස්තු දක්වා) | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| කේ.ඩී. බන්දුල ජයසිංහ මහතා | පාලක මණ්ඩල සාමාජික (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | ඉඩම් කොමාසාරිස් ජනරාල්, ඉඩම් කොමාසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව |
| ඒ.එච්.එම්.එල්. අබේරත්න මහතා | පාලක මණ්ඩල සාමාජික (2024 ජනවාරි සිට ජුනි දක්වා) | ගොවිජන සංවර්ධන කොමාසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| යූ.බී. රෝහණ රාජපක්ෂ මහතා | පාලක මණ්ඩල සාමාජික (2024 අගෝස්තු සිට) | ගොවිජන සංවර්ධන කොමාසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| ඉංජි. අජිත් ගුණසේකර මහතා | පාලක මණ්ඩල සාමාජික (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| එච්.ඒ. ආශා හපුආරච්චි මෙනවිය | පාලක මණ්ඩල සාමාජිකා (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| ජී.ඩී.එස්.එන්. චන්ද්‍රසේන මහත්මිය | පාලක මණ්ඩල සාමාජිකා (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | අතිරේක ලේකම් (කෘෂිකර්ම සංවර්ධන- I), කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය |
| පුබුදිකා එස්. බණ්ඩාර මහත්මිය | පාලක මණ්ඩල සාමාජිකා (2024 ජනවාරි සිට ජුනි දක්වා) | ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන), ඉඩම් අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| සුජීවා එස් ගුරුගේ මහත්මිය | පාලක මණ්ඩල සාමාජිකා (2024 ජූලි සිට අගෝස්තු දක්වා) | ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන), ඉඩම් අමාත්‍යාංශය |
| ඩී.ජී. නිලූකා කුමාරි මෙනවිය | පාලක මණ්ඩල සාමාජිකා (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | අධ්‍යක්ෂ, මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |
| ඒ. ලක්කතාස් මහතා | පාලක මණ්ඩල සාමාජික (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | අතිරේක ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය |
| එච්.අයි.ඩී.ඩී. හෙට්ටිආරච්චි මහත්මිය | පාලක මණ්ඩල සාමාජිකා (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | අධ්‍යාපන අධ්‍යක්ෂ (කෘෂිකර්ම සහ පරිසර), අධ්‍යාපන අමාත්‍යාංශය |
| එම්.බී.එල්. රහුමාන් මහතා | පාලක මණ්ඩල සාමාජික (2024 පෙබරවාරි සිට අගෝස්තු දක්වා) | අතිරේක ලේකම් (පරිපාලන), වාරිමාර්ග අමාත්‍යාංශය |
| ඊ.ඒ. ඒකනායක මෙනවිය | පාලක මණ්ඩල සාමාජිකා (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | සහකාර ලේකම්, වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය |
| එන්.ඒ.ඒ. විජේසිරි මහතා | පාලක මණ්ඩල සාමාජික (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | ප්‍රාදේශීය කළමනාකරු, මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලය |
| මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු මහතා | පාලක මණ්ඩල සාමාජික (2024 ජනවාරි සිට අගෝස්තු දක්වා) | පීඨාධිපති / කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |

## 1.4 පාලක මණ්ඩල රැස්වීම් - 2024

| රැස්වීම පැවැත් වූ දිනය | සහභාගී වූ සාමාජිකයින් ගණන |
|---|---|
| 1. 2024 පෙබරවාරි 29 | 09 |
| 2. **2024** අප්‍රේල් 30 | **13** |
| 3. **2024** ජූනි 28 | 12 |
| 4. 2024 අගෝස්තු 29 | 11 |

## 1.5 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් - 2024

රැස්වීම් ගණන - 03

රැස්වීම් පැවැත් වූ දිනය - 2024 පෙබරවාරි 28
2024 ජූලි 29
2024 සැප්තැම්බර් 09

## 1.6 විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්වය

| | | |
|---|---|---|
| ඩී.ජී. නිලූකා කුමාරි මහත්මිය | සභාපති | **අධ්‍යක්ෂ, මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය** |
| ජී.ඩී.එස්.එන්. චන්ද්‍රසේන මහත්මිය | සාමාජිකා | අතිරේක ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය |
| ඊ.ඒ. ඒකනායක මෙනවිය | සාමාජිකා | සහකාර ලේකම්, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය |
| ඒ. ලක්කතාස් මහතා | සාමාජික | අතිරේක ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය, (2024 සැප්තැම්බර් සිට) |
| එම්.බී.එල්. රහුමාන් මහතා | සාමාජික | අතිරේක ලේකම් (පරිපාලන), වාරිමාර්ග අමාත්‍යාංශය, (2024 සැප්තැම්බර් සිට) |
| ඊ.ඩබ්.ජී.කේ. ප්‍රියදර්ශන මහතා | නිරීක්ෂක | ප්‍රධාන අභ්‍යන්තර විගණක, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය |
| **එම්.අයි. වේලාරත්න මෙනවිය** | නිරීක්ෂිකා | විගණන අධිකාරී, විගණකාධිපති දෙපාර්තමේන්තුව |

## 1.7 පර්යේෂණ හා පුහුණු කමිටුව

| අනු අංකය | නම | තනතුර / ආයතනය |
|---|---|---|
| 01 | ගෞරවනීය මහාචාර්ය විජිතපුර විමලරත්න හිමි | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව, කලා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය |
| 02 | මහාචාර්ය එල්.එම්. අබේවික්‍රම | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කෘෂිකාර්මික ආර්ථික සහ ව්‍යාප්ති දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය |
| 03 | එම්.එම්.එම්. අහියර් මහතා | පර්යේෂණ නිලධාරි, ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය |
| 04 | මහාචාර්ය ඩී.පී.එස්. චන්ද්‍රකුමාර | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 05 | මහාචාර්ය එන්.ඩී.කේ. දයාවංශ | මහාචාර්ය, කෘෂිකාර්මික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| 06 | ආචාර්ය පී.බී. ධර්මසේන | ප්‍රධාන විද්‍යාඥ, පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය |
| 07 | දිලීපා එම්. ඇදගමගේ මහත්මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, තීරණ විද්‍යා දෙපාර්තමේන්තුව, කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 08 | ආචාර්ය ඒ.පී.එස්. ප්‍රනාන්දු | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිකාර්මික පද්ධති දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික පීඨය, රජරට විශ්ව විද්‍යාලය |
| 09 | ආචාර්ය ෆ්‍රැන්ක් නිරංජන් | උපදේශක, හිටපු අතිරේක අධ්‍යක්ෂ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා වන ශ්‍රී ලංකා කවුන්සිලය |
| 10 | ආචාර්ය ෆ්‍රෙඩ්රික් අබේරත්න | උපදේශක, හිටපු කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| 11 | මහාචාර්ය එච්.එම්. ගුණතිලක | උපදේශක, හිටපු අධ්‍යක්ෂ (පරිසරය සහ ආරක්ෂිත ආරක්ෂක |
| 12 | මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කෘෂිකාර්මික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |

| | | |
|---|---|---|
| 13 | මහාචාර්ය කේමින්ද හේරත් | මහාචාර්ය, කෘෂි ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය වයඹ විශ්ව විද්‍යාලය |
| 14 | ආචාර්ය පී.එච්.ඒ.පී.සී. ගිරිහගම | ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා වන ශ්‍රී ලංකා කවුන්සිලය |
| 15 | මහාචාර්ය මංජුල පී. සුමිත් මාගමගේ | මහාචාර්ය, පශු සම්පත් නිෂ්පාදන දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික විද්‍යා පීඨය, සබරගමුව විශ්ව විද්‍යාලය |
| 16 | ඉංජිනේරු ඩී.ඩී. ප්‍රභාත් විතාරණ | උපදේශක,හිටපු ප්‍රධානී - ජල කළමනාකරණ අංශය, කෘෂිකාර්මික සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 17 | මහාචාර්ය ඩී.වී.පී. ප්‍රසාද | මහාචාර්ය, කෘෂිකාර්මික ආර්ථික හා ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| 18 | මහාචාර්ය ප්‍රසාන්ති ගුණවර්ධන | මහාචාර්ය, වන හා පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 19 | ආචාර්ය ප්‍රියංග දුණුසිංහ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව, කලා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය |
| 20 | ආචාර්ය එල්.පී. රූපසේන | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිකාර්මික පද්ධති දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික පීඨය, රජරට විශ්ව විද්‍යාලය |
| 21 | ආචාර්ය කේ. සූරියකුමාර | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිකාර්මික ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික පීඨය, යාපනය විශ්ව විද්‍යාලය |
| 22 | ආචාර්ය එම්. සමාඩ් | උපදේශක, හිටපු ප්‍රධානී - දකුණු ආසියා කාර්යාලය ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය |
| 23 | මහාචාර්ය එච්.එම්.සමන් කේ. හේරත් | මහාචාර්ය, පීඨාධිපති, සත්ත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය |
| 24 | ආචාර්ය ශාන්ත විජේසිංහ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 25 | ආචාර්ය තිවහාරි ගෙරෙතරන් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිකාර්මික ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම පීඨය, නැගෙනහිර විශ්ව විද්‍යාලය |
| 26 | මහාචාර්ය ටියුඩර් සිල්වා | සම්මානනීය මහාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |

## 1.8 විධායක සාරාංශය



2024 දී ගොවිජන ක්ෂේත්‍රයේ විවිධ අංශ ඉලක්ක කරගනිමින් ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන භාවිතය ට ගනිමින් පර්යේෂණ අධ්‍යයන 11ක් ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනයන්, ග්‍රාමීය සංවර්ධනය සහ තිරසාර කෘෂිකර්මාන්තය කෙරෙ හි විශේෂ අවධානයක් යොමු කරමින් මාතෘකා කිහිපයක් යටතේ ක්‍රියාත්මක විය.

**ග්‍රාමීය අංශ සංවර්ධනය:** ග්‍රාමීය ආර්ථිකය තුළ නැඟී එන අංශ ගවේෂණය කිරීම සඳහා අධ්‍යයන දෙකක් දියත් කරන ලදී. එනම් කෘෂි සංචාරක ව්‍යාපාරය සහ නවක කෘෂි ව්‍යාපාරයන් හි ප්‍රගමනය, තිරසාර ව්‍යවසායකත්වය සඳහා ඵලදායී මැදිහත්වීම් සැලසුම් කිරීම යනුවෙනි. මෙම අංශ ග්‍රාමීය ජීවනෝපාය සහ ආර්ථික වර්ධනය ඉහළ නැංවීමේ ප්‍රධාන ධාවකයන් ලෙස සැලකේ. 2024 දෙසැම්බර් අවසානය වන විට අධ්‍යයනයන් 75%ක භෞතික ප්‍රගතියක් වාර්තා කොට ඇත.

**ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව:** ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල් මුහුණ දෙන අභියෝගයක් වන ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම ආර්ථික සැලසුම්වල මූලික අරමුණකි. මෙකී අංශය ඉලක්ක කර ගනිමින් ප්‍රතිපත්ති නිර්දේශ සැපයීම සඳහා අධ්‍යයන දෙකක් 2024 දී ආරම්භ කරන ලදී. පළමුවැන්න, අනාගත ආහාර ඉල්ලුම හැඩගැස්වීමේ තීරණාත්මක ජන විකාශයක් වන නාගරික යෞවනයන් අතර ආහාර පරිභෝජන රටා සහ හැසිරීම් පරීක්ෂා කිරීමයි. දෙවන අධ්‍යයනයෙන් අවධානය යොමු කරන්නේ තිරසාර ආහාර ප්‍රතිපත්ති නිර්මාණය කිරීම සඳහා අත්‍යවශ්‍ය පෝෂ්‍යදායී ආහාරවල පිරිවැය සහ දැරිය හැකි මිල ගණන් කෙරෙහි ය. 2024 වර්ෂය අවසාන වන විට මෙම අධ්‍යයනවල භෞතික ප්‍රගතිය 75%කි.

**දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය:** දේශගුණික සුහුරු කෘෂිකාර්මික විසඳුම් ක්‍රියාවට නැංවීම අරමුණු කොට ගනිමින් ගනිමින් අධ්‍යයන හතරකට 2024 දී ප්‍රමුඛත්වය දී තිබේ. මෙම අධ්‍යයනයන් ඔස්සේ දේශගුණික විපර්යාසවල ට ගොවීන් අනුවර්තනය වීම, තිරසාර පෝෂක කළමනාකරණය සහ පරිසර හිතකාමීත්වය අවබෝධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරයි.

1. **ශ්‍රී ලංකාවේ වී ගොවිතැන කෙරෙහි දේශගුණික තත්ත්වයන් හි ඔරොත්තු දීමේ හැකියාවන් සඳහා වන පුරෝකථනයන් ට ගොවීන්ගේ අනුගත වීම අධ්‍යයනය -** පූර්ව කාලගුණ අනාවැකි භාවිතා කරමින් ගොවීන් දේශගුණය ආශ්‍රිත වෙනස්කම්වල ට අනුගත වන ආකාරය විමර්ශනය කරන මෙම අධ්‍යයනයේ භෞතික ප්‍රගතිය 75%කි.

2. **ඉහළ වී නිෂ්පාදනයක් සඳහා තිරසර පෝෂක කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය -** පෝෂක කළමනාකරණය සඳහා පුළුල් ප්‍රවේශයක් වන මෙම අධ්‍යයනය පාරිසරික සමතුලිතතාවය ප්‍රවර්ධනය කරන අතර ම වීවල ඵලදායිතාව වැඩි දියුණු කිරීම අරමුණු කරයි. මෙම අධ්‍යයනයේ භෞතික ප්‍රගතිය 75%කි.

3. පහත රට තෙත් කලාපයේ වී මූලික පාරිසරික පද්ධතියේ සහභාගීත්ව සංරක්ෂණය සහ නිෂ්පාදන ශක්තිමත් කිරීම - වී පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සහ ඒවායේ ඵලදායිතාව ඉහළ නැංවීම කෙරෙ හි අවධානය යොමු කර ඇති මෙම අධ්‍යයනයෙන් 70%ක භෞතික ප්‍රගතියක් වාර්තා කොට ඇත.

4. **වර්මි කොම්පෝස්ට් සහ කාබනික දියර පොහොර නිෂ්පාදනය සහ ගොවිතැනේ නියුක්තවීම ප්‍රවර්ධනය කිරීම -** කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් මෙම අධ්‍යයනය පරිසර හිතකාමී කෘෂිකාර්මික පිළිවෙත් වෙත මාරු වීමට සහාය වේ. 2024 දෙසැම්බර් අවසානය වන විට එහි භෞතික ඉලක්කවලින් 100%ක් සපුරා ගෙන ඇත.

**වටිනාකම් දාම අධ්‍යයනයන්:** අඹ සහ අන්නාසි අගයදාමවල ගිවිසුම්ගත ගිවිසුම් ගවේෂණය කිරීම සඳහා මෙන් ම ශ්‍රී ලංකාවේ විශේෂ ආර්ථික මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය සහ තිරසාරභාවය පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයන දෙකක් දියත් කරන ලදී. මෙම අධ්‍යයනයන් පිළිවෙළින් 75%ක සහ 50%ක භෞතික ප්‍රගතියක් ලබා තිබේ.

**වෙළෙඳපොළ තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදාහැරීමේ ව්‍යාපෘතිය -** කෘෂිකාර්මික වෙළෙඳපළ තොරතුරු, විශේෂයෙන් ආහාර ද්‍රව්‍යවල මිල ගණන් එකතු කිරීම, සම්පාදනය කිරීම සහ බෙදා හැරීම, එම කාල සීමාව තුළ එහි 100%ක භෞතික ප්‍රගතියක් වාර්තා කරයි. මෙහි දී, සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකා (සිංහල හා ඉංග්‍රීසි) මාසික තොරතුරු විවරණිකා (ඉංග්‍රීසි) ප්‍රකාශය ට පත් කෙරේ. 2024 දී සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයන්

බහුවිධ ක්ෂේත්‍ර හරහා සැළකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ඒවා ග්‍රාමීය සංවර්ධනය, ආහාර සුරක්ෂිතතාව, වගිනාකම්දාමය සහ තිරසාර කෘෂිකාර්මික භාවිතයන් යන පුළුල් අරමුණු සමඟ පෙළගැසී ඇති අතර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ අනාගත සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ප්‍රතිපත්ති නිර්දේශ ලබා දෙනු නිසැක ය. මෙම සියලු අධ්‍යයනයන් වාර්තාවේ සහ ප්‍රතිපත්ති සංෂිප්තයේ පළමු කෙටුම්පත 2024 දෙසැම්බර් 31 වන දිනට ප්‍රගතිය වාර්තා කරයි.

## පුහුණු වැඩටහන්-2024

2024 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් හතරක් පැවැත්වීමට සැලසුම් කළ අතර මේ වන විට සැසි 43ක් අවසන් කොට තිබේ. මන්නාරම, වව්නියාව සහ මඩකලපුව යන ප්‍රදේශවල පවත්වන ලද ආහාර සුරක්ෂිතතාව පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන් 19ක් ඊට ඇතුළත් වන අතර ඊට පුහුණු ලාභීහු 753 දෙනෙක් සහභාගී වූහ. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම කෙරෙ හි අවධානය යොමු කරන ලද එක්දින දැනුවත් කිරීමේ වැඩසටහන් 20ක් හම්බන්තොට හා කුරුණෑගල යන දිස්ත්‍රික්කවල දී පැවත් වූ අතර ඒ සඳහා ගොවීන් 927 දෙනකු සහභාගී වූහ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ දෙවන අදියර සඳහා ව්‍යාපාර ආරම්භ කළ පුහුණුලාභීන් 105 දෙනෙකු සහභාගී වූ අතර. කෘෂි ව්‍යවසායකයින් ගොඩනැඟීම සඳහා තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් ගම්පහ, රත්නපුර සහ මහනුවර යන දිස්ත්‍රික්කවල පවත්වන ලදී. මේ සඳහා තරුණ තරුණියන් 73 දෙනෙකු සහභාගී වූහ. සමස්තයක් වශයෙන් මෙම පුහුණු වැඩසටහන් මඟින් 2024 දී 1858 දෙනෙකු පුහුණු කොට තිබේ.

## ප්‍රකාශන - 2024

2024 වර්ෂය අවසන් වන විට පර්යේෂණ වාර්තා තුනක් සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත නවයක් ප්‍රකාශයට පත් කර ඇත. මෙයට අමතර ව, Sri Lanka Journal of Agrarian Studies සඟරාවේ (වෙළුම 20, අංක 1 සහ 2) සහ ගොවි කටයුතු අධ්‍යයනය (වෙළුම 14, අංක 1) ප්‍රකාශයට පත් කරන ලදී. “ගොවිජනතා” ත්‍රෛමාසික සඟරාවේ කලාප දෙකක් (වෙළුම 26, අංක 1-2 සහ 3) මෙන් ම ජාතික අලුත් සහල් මංගල්‍යය 2024 සඳහා විශේෂ ප්‍රකාශනයක් ද, මූල්‍යාධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන කාන්තා ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් SMEs Guide SL නම් මාසික සඟරාවේ පළමු කලාපය ද මෙම වසරේදී ප්‍රකාශයට පත් කරන ලද අතර මානව-වනජීවී ගැටුම සහ දේශගුණික විපර්යාස පිළිබඳ සිංහල කෘති දෙකක් ද ප්‍රකාශයට පත් විය.

ආයතනයේ Youtube නාළිකාව වෙනුවෙන් වාර්තා වැඩසටහන් 39ක් (සිංහලෙන් 33ක් සහ දෙමළෙන් 6ක්) නිෂ්පාදනය කරන ලද අතර එය ආයතනික Youtube නාළිකාවේ උඩුගත කරමින් සිය දැනුම ව්‍යාප්ත කිරීමේ උත්සාහයන් තවදුරටත් පුළුල් කළේ ය. ශ්‍රී ලාංකිකයින්ට නවතම කෘෂිකාර්මික හා ව්‍යවසාය පුවත් සහ කෘෂිකාර්මික තාක්ෂණයන් වෙත ප්‍රවේශය ලබාදෙමින් "Govimina.com, Kamanalam.com සහ SMEsGuideSl.com යන වෙබ් අඩවි ත්‍රිත්වය ද මෙම වසර තුළ ආරම්භ කරන ලදී.

මහා භාණ්ඩාගාර අරමුදල්වල ට අමතර ව, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), ඩෙව් ප්‍රෝ ආයතනය (DevPro Guarantee Ltd), Oxfarm, Unique Land Use GmbH වැනි ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගී පර්යේෂණ අධ්‍යයන සහ උපදේශන සේවා ලබා දෙන ලදී. මෙම සම්බන්ධතා, සහයෝගීතාවයන් සහ හවුල්කාරිත්වයන් තුළින් ආයතනයේ විෂය පථය තවදුරටත් පුළුල් කිරීමේ හැකියාව පවතී.

ආයතනයෙ හි කටයුතු ඉහළ ම ප්‍රමිතීන් ට අනුකූල ව සිදුකිරීම සඳහා පාලක මණ්ඩලය විසින් සපයන ලද සහයෝගය සහ මඟපෙන්වීම පිළිබඳව ද මම කෘතඥ වෙමි. අවසාන වශයෙන්, 2024 වසරේ පර්යේෂණ සහ සහායක කාර්ය මණ්ඩලය විසින් පෙන්නුම් කළ අසීමිත කැප කිරීම් හේතුවෙන් 2024 වර්ෂය සාර්ථක වර්ෂයක් කර ගැනීමට හැකිවීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය ලද සුවිශේෂී ජයග්‍රහණයක් බව සඳහන් කළ යුතු ය.

**මහාචාර්ය ඒ.එල්.සන්දික**
**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි**

# 02 වැනි පරිච්ඡේදය
# ප්‍රගතිය සහ ඉදිරි දැක්ම



## 2.1 පර්යේෂණ අංශ

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, ආහාර පද්ධති අංශය, පරිසර අංශය, ග්‍රාමීය සංවර්ධන අංශය, අධ්‍යාපන හා පුහුණු අංශය සහ දත්ත කළමනාකරණ අංශය, තොරතුරු හා සන්නිවේදන අංශය යන පර්යේෂණ අංශ හය හරහා ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, සියලු ම පර්යේෂණ අංශ මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ හිඟය යි. 2024 රජයේ බඳවා ගැනීම් අත්හිටුවීම හේතුවෙන් මෙම තත්ත්වය නිර්මාණය වී තිබේ. මෙම තත්ත්වය තුළ පර්යේෂණ නිලධාරීන්, සංඛ්‍යාන නිලධාරීන් සහ සහායකයින් ද ඇතුළු සීමිත ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයක් සමඟ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සිදුවී ඇත.

**ආයතනයේ ක්‍රියාත්මක වන පර්යේෂණ අංශ සම්බන්ධ සංෂිප්ත සටහනක් පහත දැක් වේ.**

### i. ආහාර පද්ධති අංශය

චක්‍රීය ආර්ථික දෘෂ්ටිකෝණයකින් ආහාර පද්ධති අංශය, ශ්‍රමය, බලශක්තිය සහ අපද්‍රව්‍ය මඟින් මෙහෙයවනු ලබන පරිභෝජනය, නිෂ්පාදනය, සැකසීම සහ බෙදා හැරීම ඒකාබද්ධ කරන අතර ප්‍රතිපත්ති සහ දේශගුණය ප්‍රධාන බලපෑම් ලෙස හඳුනා ගනී. මෙම පුළුල් විෂය පථය විධිමත් කිරීම සඳහා ආහාර පද්ධති අංශය ආහාර භාවිතය, ආහාර ප්‍රවේශය සහ ආහාර ලබා ගැනීමේ හැකියාව යන මූලික කුළුණු තුනක් කෙරෙහි අවධානය යොමු කරයි.

### ii. පරිසර අංශය

දේශගුණය වෙනස් වීම කෘෂිකාර්මික සමාජ සංරක්ෂණ-නැඹුරු, කුඩා පරිමාණ ගොවිතැන සහ නව්‍ය ජල කළමනාකරණය දෙසට මාරු වීමට බල කරයි. පරිසර අංශය මෙම දිගුකාලීන සුසමාදර්ශී මාරුව වැළඳ ගනිමින්, කෘෂිකාර්මික ප්‍රජාවන් තුළ ඔරොත්තුදීමේ හැකියාව සහ තිරසාරභාවය සහතික කරන උපාය මාර්ග සමඟ එහි වගකීම පෙළගස්ව යි.

**iii. ග්‍රාමීය සංවර්ධන අංශය**

ග්‍රාමීය සංවර්ධන අංශය ග්‍රාමීය බලගැන්වීම සඳහා ඒකාබද්ධ හා සාකල්‍ය ප්‍රවේශයන් අවධාරණය කරයි. එය වත්මන් ග්‍රාමීය තත්ත්වයන් සහ ඒවායේ මූල හේතු යන දෙකම විමර්ශනය කරයි. සමාජීය, ආර්ථික සහ පාරිසරික කම්පන මුලින් ම බලපාන්නේ මතුපිට මට්ටමේ දරිද්‍රතාවයෙන් ඔබ්බට ගැඹුරු වන දරිද්‍රතාවය තීරණාත්මක සැලකිල්ලක් ලෙස පවතින ග්‍රාමීය ජනගහනයට බැවින් මෙම කාර්යය විශේෂයෙන් අදාළ වේ.

**iv. අධ්‍යාපන සහ පුහුණු අංශය**

වර්තමාන වේගවත් වෙනස හඳුනා ගනිමින් අධ්‍යාපන සහ පුහුණු අංශය සාම්ප්‍රදායික කෘෂිකාර්මික පුහුණුවෙන් ඔබ්බට යයි. එහි අවධානය යොමු වී ඇත්තේ යල් පැනයාමේ අවදානමක් ඇති පටු, විනය-විශේෂිත දැනුම වෙනුවට, ඉගෙන ගන්නන් අන්තර් විනය මෙවලම් සහ අනුවර්තනය කළ හැකි කුසලතාවලින් සන්නද්ධ කිරීම කෙරෙහි ය.

**vi. දත්ත කළමනාකරණ අංශය**

දත්ත කළමනාකරණ අංශය, බිම් මට්ටමේ දත්ත ග්‍රහණය කර ගැනීම ට සහ ආයතන හරහා තොරතුරු ප්‍රවාහය ප්‍රශස්ත කිරීමට මධ්‍යම මධ්‍යස්ථානයක් ගොඩනඟ යි. සංඛ්‍යා ගණනය කිරීමට අමතර ව, පර්යේෂණ කණ්ඩායම් සහ කොටස්කරුවන් සමඟ සහයෝගයෙන් ක්‍රියාකාරී ව දත්ත රැස් කරයි, මහජනතාව, අධ්‍යයන ප්‍රජාව සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා තත්‍ය කාලීන තොරතුරු ව්‍යාප්ති පද්ධති සංවර්ධනය කරයි.

**vi. තොරතුරු සහ සන්නිවේදන අංශය**

තොරතුරු අධික ලෙස පැටවීම සහ තොරතුරු බහුල යුගයක, තොරතුරු සහ සන්නිවේදන අංශය ඉලක්කගත, පැහැදිලි සහ ප්‍රවේශ විය හැකි දත්ත අලෙවිකරණ උපාය මාර්ග නිර්මාණය කර යි. එය පරිශීලක ඉලක්කවල ට ප්‍රතිදාන සකස් කරන අතර බහු සන්නිවේදන නාළිකා ඔස්සේ බෙදා හැරීම ස්වයංක්‍රීය කරයි, තිරසාර, පරිශීලක කේන්ද්‍රීය තොරතුරු පරිසර පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා දත්ත අංශය සමඟ සමීප ව කටයුතු කරයි.

## 2.2 පර්යේෂණ ප්‍රගතිය

වර්ෂ 2023 සහ 2024 තුළ සිදු කළ පහත සඳහන් පර්යේෂණ අධ්‍යයනයන් හි ප්‍රකාශන ක්‍රියාවලිය 2024 වර්ෂයේ දී අවසන් කරන ලදී.

i. ශ්‍රී ලංකාවේ කුකුළු ආහාර නිෂ්පාදනය : ආර්ථික අර්බුදයේ බලපෑම්, ප්‍රතිචාර සහ ඉදිරි ගමන
ii. ශ්‍රී ලංකාවේ සැකසූ පලතුරු හා එළවළු කර්මාන්තයේ විභවතා, බාධක හා අපේක්ෂාවන් පිළිබඳ අධ්‍යයනය
iii. දේශගුණික සුහුරු කෘෂිකාර්මික විසඳුම් ක්‍රියාවට නැංවීම: දත්ත මත පදනම් වූ ක්‍රියාත්මක කිරීම

පහත සඳහන් පර්යේෂණ අධ්‍යයන 2024 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී.

**01. අඹ සහ අන්නාසි ගොවීන් මෙන්ම ගැනුම්කරුවන් අතර වන කෘෂිකාර්මික ගිවිසුම් පිළිබඳ අධ්‍යයනය**

- මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල
- පර්යේෂණ කණ්ඩායම : එම්.ඩී.ඩී. පෙරේරා, එස්.පී. ප්‍රනාන්දු, ඒ. කේ. ඒ. දිසානායක, යූ.ඩී.ආර්. උදාරි
- පර්යේෂණ අරමුණ : ශ්‍රී ලංකාවේ නැවුම් පලතුරු උප අංශයේ ( අඹ සහ අන්නාසි) පවතින කෘෂිකාර්මික ගිවිසුම් ඇඟයීම සහ වෙළඳපළ සම්බන්ධතා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යෝජනා කිරීම සඳහා එම ගිවිසුම්වල ලක්ෂණ හඳුනා ගැනීම.
- තිරසාර සංවර්ධන ඉලක්කය: SDG 01

**ප්‍රධාන අරමුණ ට අදාළ ප්‍රමුඛ සොයා ගැනීම්:**

i. ප්‍රධාන වශයෙන් අවිධිමත් ආකෘති සහ අතරමැදි ආකෘති ගිවිසුම් නිරීක්ෂණය කරනු ලැබේ. 'අවිධිමත් ආකෘතිය' ලෙස තනි පුද්ගල ව්‍යවසායකයින් හෝ එකතුකරන්නන් සෘතුමය පදනමක් මත නිෂ්පාදකයන් සමඟ අවිධිමත් ලෙස ගිවිසුම්ගත වීම හඳුනා ගත හැකි ය. 'අතරමැදි ආකෘතිය' ලෙස පලතුරු අපනයනකරුවන් හෝ සුපිරි වෙළෙඳසැල්වල හෝ ප්‍රධාන ව්‍යාපාරිකයෙක් නිල වශයෙන් හෝ අවිධිමත් ලෙස එකතු කරන්නෙකු (හෝ අතරමැදියන්) සමඟ ගිවිසුම් ඇති කර ගන්නා අතර ඔහු පසුව නිෂ්පාදකයින් ගණනාවක් සමඟ අවිධිමත් ලෙස ගිවිසුම් ඇති කර ගනී.

ii. අඹ සඳහා විධිමත් ලිඛිත ගිවිසුම් ඇත්තේ ගොවීන්ගෙන් 0.5%කට පමණි. අන්නාසි සඳහා වන ගිවිසුම් (99%) වාචික, අවිධිමත් ගිවිසුම් වේ. එකතුකරන්නන් සහ නිෂ්පාදකයින් විසින් අන්‍යෝන්‍ය වශයෙන් පහසු නියමයන් සහ කොන්දේසි යටතේ ගිවිසුම් සිදු කරනු ලැබේ.

iii. සියයට 36% ක් වගාකරුවන් රජයේ පූර්ණ හෝ සැලකිය යුතු සහයෝගයක් සහ සහයෝගීතාවයක් නියාමනය, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අපේක්ෂා පළ කරති.

**ප්‍රධාන නිර්දේශ:**

i. අවිධිමත් ආකෘතික ගිවිසුම්වල සාර්ථකත්වය රඳා පවතින්නේ බොහෝ අවස්ථාවල රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන ආධාරක සේවාවන් මත ය. එබැවින්, මෙම අංශය වෙත රජයේ පුළුල් මැදිහත්වීමක් නිර්දේශ කෙරේ.

ii. විධිමත් සහ වගකිවයුතු ගිවිසුම්, නිෂ්පාදනවල ගුණාත්මකභාවය, මිලකරණ යාන්ත්‍රකරණයන්, බලහත්කාරයන් සහ ආරවුල් නිරාකරණය (Force majeure and dispute resolution) කෙරෙහි අවධාරණය යොමු කරන වඩා හොඳ කොන්ත්‍රාත්තු සහිත, තත්කාලීන මිල දත්ත ඇතුළත්, ඩිජිටල් වෙළෙඳපොළ වේදිකාවක් සමඟ පවතින අඹ සහ අන්නාසි අගයදාම සංවර්ධනය නිර්දේශ කෙරේ.

iii. තොරතුරු සහ ධාරිතා ගොඩනැඟීමට ප්‍රවේශය වැඩි දියුණු කිරීම: ධාරිතා ගොඩනැඟීම (Capacity building) සහ යහපත් කෘෂිකාර්මික භාවිතයන් (Good Agricultural Practices) පිළිගැනීමට සහ ප්‍රවර්ධනය කිරීමට ගොවීන්, ව්‍යාපාරිකයින් සහ අගය දාමයේ (Value chain) අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සෘජුව වැඩ කිරීම, ගුණාත්මක යෙදවුම් සැපයීම, වගකීම් සහිත කොන්ත්‍රාත්තු පවත්වා ගැනීම සහ කොන්ත්‍රාත්තු පිළිබඳව අඛණ්ඩ ව අධීක්ෂණය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම නිර්දේශ කෙරේ.

iv. වටිනාකම්දාම මූල්‍යකරණයට (Value chain financing) පහසුකම් සපයන සන්ධාන ගිවිසුම් ප්‍රවර්ධනය (Alliance agreement) කරන සක්‍රීය පරිසරයක් ස්ථාපිත කිරීම. අගයදාමයේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා තාක්ෂණික දැනුම, තොරතුරු, ප්‍රාග්ධන සහාය සහ සම්බන්ධීකරණය සපයන්නෙකු ලෙස රජය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීම නිර්දේශ කෙරේ.

## 02. වී වගාව සඳහා කාබනික පොහොර භාවිතය සම්බන්ධයෙන් ගොවීන්ගේ අභිරුචිය පිළිබඳ ගවේෂණය

- මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල
- පර්යේෂණ කණ්ඩායම : ආර්.එම්.ඩී.එච්. රත්නායක, ඩී.ටී.පී.එස්. ධර්මවර්ධන
- පර්යේෂණ අරමුණ : වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා ගොවීන් පරිසර හිතකාමී පෝෂක කළමනාකරණ ප්‍රවේශයන් භාවිතා කිරීම සහ ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ රුචිකත්වය පිළිබඳ ගවේෂණය කිරීම.
- තිරසාර සංවර්ධන ඉලක්කය : SDG 02




**ප්‍රධාන අරමුණ ට අදාළ ප්‍රමුඛ සොයා ගැනීම්**

I. නියැදියේ ගොවීන් 50%ක් වී වගාව සඳහා කාබනික පොහොර යොදා ගැනීම සඳහා ස්ව- කැමැත්තෙන් ම යොමු වී ඇති අතර ගොවීන් 47%ක් ගොවිපොළ මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදනය ද සිදු කළ ද ඒ සඳහා ප්‍රමාණවත් අමුද්‍රව්‍ය නොමැතිවීම විශාල අභියෝගයක් ව පවතී.

II. වී ගොවිහු තම වගාව ට කාබනික පොහොර භාවිතා කිරීමේ දී පරිශීලක හිතෛෂී ඝන තත්ත්වයේ ඇති පොහොර (86%) විශේෂයෙන් ම කැට පොහොර විධිමත් ලෙස සහතිකකරණයකින් යුතු ව (97%) බාහිර නිෂ්පාදකයින් මඟින් (70%), ප්‍රධාන ලෙස රජයෙන් ලබා ගැනීමට වැඩි රුචිකත්වයක් දක්වති.

III. බහුතරයක් ගොවින් කාබනික පොහොර භාවිතය සහ වගාව තුළින් ලැබෙන පාරිසරික සහ සෞඛ්‍යමය ප්‍රතිලාභ සම්බන්ධයෙන් අවබෝධයකින් යුක්ත වුව ද, ඒවා ප්‍රායොගික ව භාවිත කිරීම සම්බන්ධයෙන් මනා දැනුවත්භාවයක් නොමැතිවීම මෙන් ම, වෙළෙඳපොළ තුළ ප්‍රමාණවත් ගුණාත්මක බවින් උසස් කාබනික පොහොර නොමැති වීම සහ යෙදීම සඳහා වැඩි ශ්‍රමයක් අවශ්‍ය වීම, කාබනික පොහොර භාවිතය අවම වීමට හේතු වී ඇත.

**ප්‍රධාන නිර්දේශ**

I. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ගොවිපළ ආදර්ශන ස්ථාපිත කිරීම හරහා කාබනික කෘෂිකාර්මික වත්පිළිවෙත් පිළිබඳ වී ගොවීන්ගේ ශක්‍යතාව වැඩිදියුණු කිරීම.

II. විවිධ අමුද්‍රව්‍ය භාවිතය දිරිමත් කිරීම, ප්‍රජා පාදක නිෂ්පාදන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සහ වැඩි දියුණු කළ කාබනික පොහොර නිෂ්පාදන ක්‍රම හඳුන්වා දීම වැනි ප්‍රවේශයන් ඔස්සේ උසස් තත්ත්වයේ කාබනික පොහොර නිෂ්පාදනය සහ වෙළෙඳපොළේ සුලභතාවය වැඩි දියුණු කිරීම.

III. පරිසර හිතකාමී වී වගාවන් සම්බන්ධ ප්‍රතිපත්ති තීරණවල දී බිම් මට්ටමේ ගොවීන්ගේ ඒ සමබන්ධ රුචිකත්වය පිළිබඳ අවධානය යොමු කිරීම.

මේ වන විට, අධ්‍යයනයේ සොයාගැනීම් ජාතික මූලික අධ්‍යයන ආයතනය වෙත යොමු කර ඇති අතර ඔවුන් හා එකතු වී අවසන් වාර්තාව ආහාර සුරක්ෂිතතාවය හා කෘෂිකර්මාන්තය සඳහා වූ පාර්ලිමේන්තු අංශික අධීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත ව ඇත.

## 03. ශ්‍රී ලංකාවේ නාගරික නව යෞවනයන්ගේ ආහාර පරිභෝජන රටාවන් සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු ප්‍රවර්ධනය සඳහා ඇති දිරිගැන්වීම්, බාධක සහ බලපෑම් පිළිබඳ අධ්‍යයනය.

- මූල්‍ය ප්‍රභවය : රජයේ ඒකාබද්ධ අරමුදල.
- පර්යේෂණ කණ්ඩායම : රෝෂිණී රඹුක්වැල්ල, රුචිනි විදානපතිරණ, දුමින්ද ප්‍රියදර්ශන, රවීනා උදාරි, සංගීත් ප්‍රනාන්දු, ජයමිණී චම්පිකා
- පර්යේෂණ අරමුණ : ශ්‍රී ලංකාවේ පාසල් යන නව යොවුන් වියේ දරුවන් අතර ආහාර පරිභෝජන හැසිරීම් සහ රටාවන් විමර්ශනය කිරීම සහ නව යොවුන් වියේ දරුවන් අතර සෞඛ්‍යසම්පන්න ආහාර පුරුදු ප්‍රවර්ධනය කිරීම සඳහා උපාය මාර්ග සහ ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීම.
- තිරසාර සංවර්ධන ඉලක්කය: SDG 2

**ප්‍රධාන අරමුණ ට අදාළ ප්‍රමුඛ සොයා ගැනීම්**

I. සිසුන් බහුතරයකගේ ආහාර වේල ප්‍රධාන වශයෙන් "බත්" මත පදනම් වූ අතර පලතුරු, එළවළු සහ ධාන්‍ය වර්ග පරිභෝජනය පහළ මට්ටමක පැවතුණි. එසේ ම, ක්ෂණික සහ සැකසූ ආහාර හා කාබනික බීම වර්ග පරිභෝජනය ද සැලකිය යුතු මට්ටමක පැවතුණි. සිසුන්ගෙන් 50%ක ට වැඩි පිරිසක් ආහාර වේල් (ප්‍රධාන වශයෙන් උදේ ආහාරය) මග හැරීමේ ප්‍රවණතාවයක් දැක්වූ අතර 80%ක් පමණම ලාභදායි, අඩු පෝෂණයෙන් යුත් කෙටි කෑම දෛනිකව භාවිතයට නැඹුරු වී ඇති බවක් දැකගත හැකි විය.

II. සම වයසේ මිතුරන්ගේ බලපෑම්, ආපනශාලා ප්‍රතිපත්තිය සහ කමිටු කාර්යක්ෂම නොවීම, බොහෝ පාසල්වල විධිමත් පෝෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක නොවීම මෙන් ම කෙටි සහ ක්ෂණික ආහාර ප්‍රවර්ධනය සඳහා බාධා නොමැති වීම හේතුවෙන් සිසුන් සෞඛ්‍යසම්පන්න ආහාර සඳහා අනුගත වීමේ අඩු නැඹුරුවක් දැකිය හැකි ය.

III. පහසුව පිළිබඳ වැඩි අවධානයත් සමඟ පවුලේ ආහාර පිළිවෙත්වල අස්ථාවර ස්වභාවය, ආහාර සම්බන්ධයෙන් මව්පියන්ගේ අධීක්ෂණය සහ අවධානය සීමා වීම, සම වයස් මිතුරන්ගේ හැසිරීම් සහ සමාජ මාධ්‍ය මඟින් ඇති කරවන ජනප්‍රියතාවය නව යොවුන් දරුවන්ගේ ආහාර පරිභෝජන පුරුදු හැඩගැස්වීම් කෙරෙහි බලපා තිබේ.

**ප්‍රධාන නිර්දේශ**

I. ආපනශාලා රෙගුලාසි ශක්තිමත් කිරීම, සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු පිළිබඳ ප්‍රතිපත්ති, නීති රීති ශක්තිමත් කිරීම, විධිමත් ආකාරයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (සිසුන් සහ ගුරුවරුන් උදෙසා), පාසල් විෂය මාලාව ට ඒ පිළිබඳ කරුණු ඇතුළත් කිරීම, සමාජ මාධ්‍ය හරහා දැනුවත් කිරීම.

II. පශු සම්පත් අමාත්‍යාංශය මඟින් කිරිහල් පාසල් තුළ ස්ථාපනය කිරීම, හෙළ බොජුන් සංකල්පය යටතේ දේශීය සහ සෞඛ්‍යසම්පන්න ආහාර ළමුන්ගේ රුචිකත්වයට ගැළපෙන ආකාරයට පාසල් තුළ ස්ථාපනය කිරීම, ඒ ඒ කාලවල ට සහ ප්‍රදේශවල ට ආවේනික පලතුරු ළමුන් අතර ජනප්‍රිය කරවීම සඳහා පාසල් තුළ පලතුරු අලෙවිසැල් ස්ථාපනය කිරීම, තෝරාගත් පාසල් සඳහා ඉහළ ශ්‍රේණිවලට ද පෝෂ්‍යදායී ආහර වේලක් ලබා දීම, දෙමාපියන් සහ ප්‍රාදේශීය ප්‍රජාව සම්බන්ධ කර ගැනීම මඟින් කෙටි සහ ක්ෂණික ආහාර වෙනුවට පෝෂ්‍යදායී ආහාර ළමුන් අතර ජනප්‍රිය කරවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

III. ළමුන් රුචිකරන රසයට සහ ආකාරයට ගැළපෙන පරිදි පෝෂ්‍යදායී ආහාර සැකසීමේ ක්‍රමවේදයන් පිළිබඳ දෙමාපියන් සහ ආපනශාලා දැනුවත් කිරීම, ආපනශාලා වැඩි දියුණු කිරීම, පාසල් උත්සව අවස්ථාවල සාම්ප්‍රදායික ආහාර ප්‍රවර්ධනය ට අවශ්‍ය ඉඩකඩ සැකසීම සහ ඒ සඳහා සිසුන් දිරිගැන්වීමේ මෙන් ම අභිප්‍රේරණය කිරීමේ වැඩසටහන් සැකසීම (සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ ව)

## 04. ශ්‍රී ලංකාව තුළ කෘෂි සංචාරක ව්‍යාපාරය, තිරසාර ජීවනෝපාය සංවර්ධන ඇති කිරීම උදෙසා යොදාගැනීම.

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රභවය | : | ඒකාබද්ධ අරමුදල |
| පර්යේෂණ කණ්ඩායම | : | නොරිකා ගොඩවත්ත, සාගරිකා හිටිහාමු, උත්පලා ජයසිංහ, එස්.පී. ප්‍රනාන්දු |
| පර්යේෂණ අරමුණ | : | මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ කෘෂි සංචාරක ව්‍යාපාරය තිරසාර ජීවනෝපාය සංවර්ධන ඇති කිරීම සඳහා යොදාගැනීමේ විභවයන් හඳුනා ගැනීම ය. |

**ප්‍රධාන අරමුණු :**

- ගොවි ප්‍රජාව අතර කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා කෘෂි සංචාරක ව්‍යාපාරය ට බලපාන සාධක (අභියෝග සහ අවස්ථා) හඳුනා ගැනීම.
- දේශීය ජීවනෝපාය සංවර්ධනය කෙරෙහි පාර්ශ්වකරුවන් ට බලපාන සාධකවල බලපෑම් හඳුනා ගැනීම.
- දේශීය සහ ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන ඵලදායි කෘෂි සංචාරක ව්‍යාපෘති ගවේෂණය කිරීම සහ එමඟින් ග්‍රාමීය වශයෙන් ව්‍යාපාර ආකෘතියක් සංවර්ධනය කිරීමට ඇති විභවයන් හඳුනා ගැනීම.
- තිරසාර සංවර්ධන ඉලක්කය : SDG 1,8,17




**ප්‍රධාන අරමුණ ට අදාළ ප්‍රමුඛ සොයා ගැනීම්**

i. කෘෂි සංචාරක විභවය

අධ්‍යයන ප්‍රදේශයේ ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රජා පාදක (Community-based tourisum) සංචාරක ප්‍රවේශය තුළ කෘෂිකාර්මික අංශයේ උප කාණ්ඩ පහක් හඳුනාගෙන ඇත. ඒවා නම්, වී වගාව සහ සංචාරක ව්‍යාපාරය, එළවළු වගාව සහ සංචාරක ව්‍යාපාරය, වී සහ එළවළු වගාවන් සහ සංචාරක ව්‍යාපාරය, කුළුබඩු උද්‍යාන සහ සංචාරක ව්‍යාපාරය, කුරුඳු වගාව + සැකසුම් සහ සංචාරක ව්‍යාපාරය යනාදි වශයෙනි. මෙම උප කාණ්ඩ ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරය සඳහා ප්‍රබල විභවයන් ප්‍රදර්ශනය කරයි. ශ්‍රී ලංකාවේ කුළුබඩු සහ කුරුඳු උප කාණ්ඩය සැලකිය යුතු ගෝලීය ආකර්ෂණයක් දිනාගෙන ඇත. සමීක්ෂණයට ලක් කළ ගොවීන්ගෙන් 70%ක් කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා විවිධාංගීකරණය කිරීමට කැමැත්ත පළ කළ හ. අධ්‍යයන ප්‍රදේශය තුළ වී, එළවළු, කුළුබඩු සහ කුරුඳු සමඟ සංචාරක ව්‍යාපාරය වැනි කෘෂිකාර්මික අංශ ප්‍රබල විභවයක් පෙන්නුම් කරයි.

ii. ගොවිපළ ට සහ සමාජය ට කෘෂි සංචාරක ව්‍යාපාරයේ ප්‍රතිලාභ

කෘෂිකාර්මික උපකාණ්ඩ පහේ ම, බොහෝ ප්‍රතිචාර දැක් වූ (100%) ගොවීන් කෘෂි සංචාරක ව්‍යාපාරයේ මූලික ප්‍රතිලාභය ලෙස අතිරේක ආදායම හඳුනා ගෙන ඇත. සහභාගිවන්නන්ගෙන් 65%ක් විසින් කෘෂිකාර්මික සේවා සැපයීම සමඟ සම්බන්ධ වීම ප්‍රධාන වාසියක් ලෙස හඳුනා ගෙන තිබේ. මේ අතර, 35%ක් කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රජා සහභාගීත්වය සඳහා අවස්ථා ලබා දෙන බව විශ්වාස කරයි. තවත් 17%ක් සාම්ප්‍රදායික ගොවිතැන් පිළිවෙත් සංරක්ෂණය කිරීමේ දී එහි කාර්යභාරය ඉස්මතු කර දක්වයි. මෙම ප්‍රදේශ සඳහා ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරය ප්‍රායෝගික වේ. කෘෂි සංචාරක ව්‍යාපාරය ආගන්තුක සත්කාරය, මග පෙන්වීම සහ හස්ත කර්මාන්ත නිෂ්පාදනය තුළින් දේශීය රැකියා අවස්ථා, විශේෂයෙන් කාන්තාවන් සහ තරුණයින් සඳහා ඉහළ නැංවීමක් සිදුකරයි. ප්‍රජා පාදක කෘෂිකාර්මික මුලපිරීම්, සමාජ සහජීවනය ශක්තිමත් කරයි. ග්‍රාමීය උරුමයන් ප්‍රවර්ධනය කළ ද, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විෂමතාවයක් ඉස්මතු කරමින් කෘෂි සංචාරක ව්‍යාපෘතිවල සහභාගිවන්නන්ගෙන් කාන්තාවන් නියෝජනය කරන්නේ 20%ක් පමණ පහළ අගයකි.

iii. කෘෂි සංචාරක ව්‍යාපාරයේ අභියෝග

උප කාණ්ඩ පහක් හරහා ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 63%ක් විසින් වාර්තා කරන ලද වඩාත් ම වැදගත් ගැටලුව මූල්‍ය බාධාවන් වේ. ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිකම තවත් ප්‍රධාන අභියෝගයක් වන අතර එය සහභාගිවන්නන්ගෙන් 47%ක් විසින් හඳුනාගෙන ඇත. කෘෂි සංචාරක ව්‍යාපාර ගැන දැනුම සහ කුසලතා නොමැතිකම 35%කට ප්‍රශ්නයක් වන අතර අලෙවිකරණ අභියෝග කෘෂි සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින අයගෙන් 31%කට බලපායි. තවත් 20%ක් නියාමන ගැටලු අභියෝගයක් ලෙස සලකනු ලබන අතර ආරම්භක ආයෝජන පිරිවැය 11% කට අභියෝගයක් වී තිබේ. ඉඩම් හිඟය තවත් ප්‍රමුඛ ගැටලුවක් ලෙස හඳුනා ගෙන ඇති අතර ඩිජිටල් අලෙවිකරණ හිඩැස් ද බාධාවක් ලෙස හඳුනාගෙන සිටියි. කෘෂි සංචාරක ව්‍යාපාරයේ ක්‍රියාකරුවන්ගෙන් 75%ක් ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් වේදිකා භාවිතා නොකරන අතර සංචාරකයින්ගෙන් 15%ක් පමණක් මාර්ගගත නාලිකා හරහා කෘෂි සංචාරක අඩවි සොයා ගත් බව හඳුනා ගත හැකි විය.

**ප්‍රධාන නිර්දේශ**

i. කෘෂි සංචාරක විභවයන්

වී, එළවළු, කුළුබඩු සහ කුරුඳු සංචාරක ව්‍යාපාරය වැනි කෘෂි සංචාරක උප කාණ්ඩ ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරයක් සඳහා ප්‍රබල විභවයක් පෙන්නුම් කරයි. මෙම අංශ විවිධාංගීකරණය වූ අත්දැකීම් ලබා දෙන අතර සම්පත් භාවිතය උපරිම කරයි. මෙම ප්‍රජා පාදක කෘෂි සංචාරක ආකෘති ගොවීන්ට සහ අදාළ ප්‍රජාවට සාර්ථක ව යොමුකළ හැකි ය. දේශීය නිෂ්පාදකයින් සමඟ සංචාරකයින් සම්බන්ධ කිරීම සඳහා කැප වූ කෘෂිකාර්මික වෙළෙඳපොළවල් නිර්මාණය කිරීම සහ කෘෂිකාර්මික ප්‍රදේශවල සාධාරණ ප්‍රතිලාභ සහතික කිරීම.

ii. කෘෂි සංචාරක ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම

තිරසාර අංශයක් ලෙස කෘෂි සංචාරක ව්‍යාපාරය නියාමනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා පැහැදිලි ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, කෘෂි සංචාරක ව්‍යවසායකන් සඳහා බදු ප්‍රතිලාභ සහ සහනාධාර වැනි දිරිගැන්වීම් ලබා දීම, කෘෂිකාර්මික විශේෂිත ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ සංචාරක, කෘෂිකර්ම සහ ග්‍රාමීය සංවර්ධන අධිකාරීන් සම්බන්ධීකරණය කිරීම.

iii. යටිතල පහසුකම් සහ පහසුකම් ශක්තිමත් කිරීම

කාර්යක්ෂම ග්‍රාමීය ප්‍රවාහනය, සම්බන්ධතාව, නවාතැන් සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම, කෘෂිකාර්මික ප්‍රදේශවල අමුත්තන්ගේ මධ්‍යස්ථාන සහ සලකුණු සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීම.

iv. ධාරිතා ගොඩනැඟීම සහ පුහුණුව (Capacity Building and Training - CBTs)

දේශීය ගොවීන් සහ ග්‍රාමීය ප්‍රජාවන් කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදු නොකරයි. ප්‍රජා පාදක සංචාරක ක්‍රියාකාරකම්, ආගන්තුක සත්කාර කළමනාකරණය සහ සංචාරක කුසලතා පිළිබඳව ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් සැපයීම. කෘෂි සංචාරක ව්‍යාපාරයේ ආර්ථික හා සංස්කෘතික ප්‍රතිලාභ පිළිබඳ ප්‍රාදේශීය ප්‍රජාව දැනුවත් කිරීම වැඩි දියුණු කිරීම. සාර්ථක කෘෂිකාර්මික ආදර්ශයන් අනුකරණය කිරීම සඳහා ගොවීන් අතර දැනුම බෙදා ගැනීම දිරිමත් කළ යුතු ය.

v. රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම

රජයේ ආයතන, පුද්ගලික ආයෝජකයින් සහ ප්‍රාදේශීය ප්‍රජාවන් අතර සහයෝගීතාවය දිරිමත් කිරීම, ගොවීන්, සම්පත් සහ ලාභ බෙදා ගන්නා සමුපකාර ආකෘතීන් ට සහාය වීම.

vi. ඩිජිටල් අලෙවිකරණය සහ තාක්ෂණය භාවිතා කිරීම

කෘෂි සංචාරක ගමනාන්ත සහ සංචාරකයින් සමඟ අත්දැකීම් දැනුම් දීම ට මාර්ගගත වේදිකා සහ ජංගම යෙදුම් සංවර්ධනය කිරීම සහ භාවිතා කිරීම, කෘෂි සංචාරක ස්ථාන වෙන්කරවා ගැනීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම.

vii. තිරසාරභාවය සහ පරිසර සංරක්ෂණය කෙරෙහි අවධානය යොමු කිරීම

කාබනික ගොවිතැන සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැනි පරිසර හිතකාමී භාවිතයන් දිරිමත්කිරීම, කෘෂිකාර්මික සංවර්ධනය, පාරිසරික සංරක්ෂණ ඉලක්ක සමඟ සමපාත වන බවට සහතික වීම.

viii. මූල්‍ය ආධාර සහ ක්ෂුද්‍ර ණය පහසුකම් වැඩි දියුණු කිරීම

කුඩා පරිමාණයේ කෘෂිකාර්මික ව්‍යවසායකයින් සඳහා අඩු පොලී ණය සහ ප්‍රධාන සඳහා ප්‍රවේශය පහසු කිරීම, සංචාරක ක්ෂේත්‍රයට පිවිසෙන ගොවීන්ගේ අවදානම් අවම කිරීම සඳහා රක්ෂණ යෝජනා ක්‍රම සඳහා සහාය වීම.

ix. ශක්තිමත් ජාල සහ හවුල්කාරිත්වයන් ගොඩනැඟීම

දැනුම සහ භාවිතයන් හුවමාරු කර ගැනීම සඳහා දේශීය හා ජාත්‍යන්තර කෘෂි සංචාරක ජාලයන් ස්ථාපිත කිරීම, නව්‍ය කෘෂි සංචාරක ආකෘතීන් සංවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

x. කෘෂිකාර්මික මුලපිරීම් අධීක්ෂණය සහ ඇගයීම

කෘෂි සංචාරක ව්‍යාපාරයේ සමාජ-ආර්ථික හා පාරිසරික බලපෑම් තක්සේරු කිරීමට අධීක්ෂණ රාමුවක් ක්‍රියාත්මක කිරීම.

xi. ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම

ජාත්‍යන්තර ව්‍යාපාර හරහා මෙම අංශ ප්‍රවර්ධනය කරමින් ශ්‍රී ලංකාව අද්විතීය කෘෂි සංචාරක ගමනාන්තයක් ලෙස සන්නාම ගත කිරීම. ජාත්‍යන්තර සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ඉලක්කගත අලෙවිකරණ ව්‍යාපාර පැවැත්වීම. ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ කුළුබඩු උද්‍යාන සහ සාම්ප්‍රදායික කුඹුරු වැනි දේශයට අවේනික ක්‍රියාකාරකම් ඉස්මතු කිරීම. මෙම ප්‍රදේශ සඳහා ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරය ප්‍රායෝගික වේ, කෘෂි සංචාරක ව්‍යාපාරය ආගන්තුක සත්කාරය, මග පෙන්වීම සහ හස්ත කර්මාන්ත නිෂ්පාදනය තුළින් දේශීය රැකියා අවස්ථා, විශේෂයෙන් කාන්තාවන් සහ තරුණයින් සඳහා ඉහළ නංවයි. ප්‍රජා පාදක කෘෂිකාර්මික මුලපිරීම් සමාජ සහජීවනය ශක්තිමත් කරන අතර ග්‍රාමීය උරුමයන් ප්‍රවර්ධනය කරයි.

## 05. ශ්‍රී ලංකාවේ වී ගොවිතැන කෙරෙහි දේශගුණික තත්ත්වයන් හි ඔරොත්තුදීමේ හැකියාවන් සඳහා වන පුරෝකථනයන් ට ගොවීන්ගේ අනුගත වීම.

- මූලා ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල
- පර්යේෂණ කණ්ඩායම : තුෂාරා ධර්මවර්ධන, දිනුෂා රත්නායක, සඳුනි චතුරිකා
- පර්යේෂණ අරමුණ : ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ වී ගොවීන් බෝග කළමනාකරණය සඳහා තීරණ ගැනීමේ දී දේශගුණ අනාවැකි භාවිතා කර තිබේ ද සහ කෙසේ ද යන්න ගවේෂණය කිරීම, එවැනි භාවිතාවන් හරහා ප්‍රතිලාභ අත්වන්නේ ද යන්න සහ ප්‍රත්‍යස්ථ කෘෂිකාර්මික පද්ධති සඳහා සුළු පරිමාණ වී ගොවීන් විසින් දේශගුණික තොරතුරු උකහා ගැනීමට ඇති අවස්ථා සහ බාධක හෙළිදරව් කිරීම.
- තිරසාර සංවර්ධන ඉලක්කය: SDG 01,02,13

**ප්‍රධාන අරමුණ ට අදාළ ප්‍රමුඛ සොයාගැනීම්**

I. නියැදියේ වී ගොවීන්ගෙන් 50%කට ආසන්න ප්‍රමාණයක් දේශගුණික තොරතුරු වෙත ප්‍රවේශවීම සඳහා රූපවාහිනිය මත විශ්වාසය තැබූ අතර 28%ක් පමණ **ස්මාර්ට්** දුරකථන හරහා දේශගුණික තොරතුරු වෙත ප්‍රවේශ විය (විශේෂයෙන් නවීන තාක්ෂණය පිළිබඳව හුරුපුරුදු තරුණ ගොවීන්).

II. නියැදිය ගොවීන් අතර වී ගොවීන්ගෙන් 63%ක් නියඟය සහ ගංවතුර වැනි දේශගුණික උවදුරුවලින් බෝග හානි අවම කිරීම සඳහා දේශගුණික තොරතුරු භාවිතා කර ඇත.

III. ගොවීන්ගෙන් 23%ක් වඩාත් විශ්වාසදායක සහ නිවැරදි දේශගුණික තොරතුරු ලබාදීම ට යෝජනා කළ අතර 20%ක් නිරන්තර යාවත්කාලීන කිරීම්වල අවශ්‍යතාවය පෙන්වා දුන්හ. එලෙස ම, 19%ක් කාලෝචිත ලෙස එම තොරතුරු බෙදා හැරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ හ.

**ප්‍රධාන නිර්දේශ**

I. ගොවිජන සේවා මධ්‍යස්ථාන, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය අතර ඍජු සම්බන්ධතා ශක්තිමත් කරමින් දේශගුණික තොරතුරු බෙදා හැරීම සඳහා රජයේ දැනට ක්‍රියාත්මක වන යාන්ත්‍රණය ශක්තිමත් කළ යුතුය.

II. "ඩිජිටල්" මාධ්‍ය හරහා දේශගුණික තොරතුරු බෙදා හැරීමේ දී පහසුවෙන් ප්‍රවේශ විය හැකි, තේරුම් ගත හැකි සහ දේශීය භාෂාවලින් සැපයීම සහතික කළ යුතු ය.

III. "ඩිජිටල්" මාධ්‍ය හරහා දේශගුණික තොරතුරු බෙදා හැරීම ග්‍රාමීය මට්ටමින් ප්‍රදේශයේ ජීවත්වන තරුණ, ප්‍රගතිශීලී ගොවීන් විසින් ප්‍රවර්ධනය කළ යුතු ය.

IV. ග්‍රාමීය මටටමින් වඩාත් ක්‍රියාකාරී ගොවීන්, සෙසු ගොවීන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීමට වඩාත් හොඳින් ස්ථානගත වී ඇති බැවින්, දේශගුණික තොරතුරු බෙදා හැරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන් ව සම්බන්ධ කරගැනීම සඳහා පහසුකම් සැලසිය යුතු ය.

V. කෘෂි ව්‍යාප්ති නිලධාරීන් ගෝලීය වශයෙන් යාවත්කාලීන වූ දේශගුණික තොරතුරු පුරෝකථන මෘදුකාංග පිළිබඳ දැනුවත් කිරීම.

VI. ගොවීන් වෙත ලබා දෙන දේශගුණික තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා ගොවීන් අතර ආකල්පමය වෙනසක් ඇති කිරීම.

## 06. ගැඩවිල් පොහොර සහ කාබනික ද්‍රව පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රවර්ධනය කිරීම

- මූල්‍ය ප්‍රභවය: රජයේ ඒකාබද්ධ අරමුදල
- පර්යේෂණ කණ්ඩායම: රේණුකා වීරක්කොඩි
- පර්යේෂණ අරමුණු:

ප්‍රශස්ත බෝග වගාවක් සඳහා හොඳින් දිරාපත් වූ කාබනික පොහොර මෙට්රික් ටොන් 10ක් හෙක්ටයාරයක වගා භූමියක ට එකතු කළ යුතුබව (අක්කරයට කිලෝ ග්‍රෑම් 4050ක්) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කරයි. මෙම නිර්දේශය ක්‍රියාවට නැංවීම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ බොහෝ නිලධාරීන් මෙන් ම ගොවිහු ද අභියෝගයක් සේ සලකති. කාබනික පොහොර විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම/හෝ සපයා ගැනීම හා හැසිරවීම දුෂ්කරය යන ආකල්පය ඊට බෙහෙවින් හේතු වී තිබේ. සාම්ප්‍රදායික කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලිය හා සැසඳූ විට ලොව විශිෂ්ඨතම ස්වභාවික පොහොරක් වන ‘ගැඩවිල් කොම්පෝස්ට්’ හෙවත් ‘වර්මි කොම්පෝස්ට්’ නිෂ්පාදකයන් විසින් තහවුරු කර ඇති ආකාරය ට වැඩි කොම්පෝස්ට් ප්‍රමාණයක් කෙටි කලකින් නිෂ්පාදනය කර ගැනීම විශාල අභියෝගයක් නොවේ. එබැවින්, අධ්‍යාපනික, පුහුණු, හා සන්නිවේදන වැඩසටහන් දියත් කරමින් ගැඩවිල් කොම්පෝස්ට් නිෂ්පාදනය හා භාවිතය ප්‍රවර්ධනය කිරීම මෙම ගවේෂණාත්මක අධ්‍යයනයේ අරමුණ විය. ප්‍රජාව සමඟ පිරිවැය සඵලදායි ලෙස සන්නිවේදනය කිරීම සඳහා නව මාධ්‍ය භාවිතා කරමින් පුනර්ජනනීය ගොවිතැන් පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමට දායක වීම මේ ගවේෂණයේ පුළුල් අරමුණ යි.

**ප්‍රමුඛ සොයාගැනීම්**

i. ගැඩවිලි පණු පොහොර සම්බන්ධයෙන් නිර්මාණය කර ආයතනික Youtube නාලිකාව ට උඩුගත කළ වීඩියෝ පට හතර සම්බන්ධයෙන් ලැබෙන ප්‍රතිචාරවල ට අනුව, විධිමත් කෘෂි ව්‍යාප්ති සේවය මඟින් ආවරණය වන/නොවන ගොවි ප්‍රජාවක් නව මාධ්‍ය ඔස්සේ තාක්ෂණය හඹා යන බව තහවුරු වේ.

ii.වගා කටයුතු සඳහා කාබනික පොහොර නිෂ්පාදනය, භාවිතය හා හැසිරවීම සම්බන්ධයෙන් පවතින අභියෝගය ජය ගත හැකි මෙන් ම පාංශු පුනර්ජනනය ඔස්සේ වැඩි අස්වනු සහතික කරන විශිෂ්ඨතම ස්වභාවික පොහොරක් ලෙස ජනතාව ගැඩවිල් පොහොර කෙරෙහි විශ්වාසය තබා ඇති බව ආයතනය මඟින් පරිපාලනය කරනු ලබන 1000කට ආසන්න සාමාජිකත්වයක් සහිත WhatsApp සාමූහිකය හරහා සිදුකරන නිරන්තර සන්නිවේදනය මඟින් සනාථ වේ.

iii.එම WhatsApp සාමූහිකය හරහා දැනුවත් කිරීමෙන් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සඳහා 2023-2024 දෙවසර තුළ 700ක් පමණ සහභාගී වූ අතර පුහුණුලාභීන් අතරින් 61%ක් මෙම තාක්ෂණය භාවිත කරන බව පශ්චාත් පුහුණු ඇගයීම මඟින් සනාථ විය.

iv. විශාල අවකාශයක ව්‍යාප්ත වී සිටින (රට තුළ හා ඉන් පිටත) ගොවි ප්‍රජාවන් වෙත ඉතා ඉක්මනින්, අඩු වියදමකින්, නව තාක්ෂණය රැගෙන යාම සඳහා නව මාධ්‍ය කාර්යක්ෂම සේවාවක් ඉටු කරන බව මේ ගවේෂණය තහවුරු කරයි. එමෙන් ම, කෘෂි තාක්ෂණය හඹා යන්නාගේ පුළුල් විෂය පථය, විධිමත් කෘෂි ව්‍යාප්ති සේවාවේ අසම්පූර්ණ ආවරණය මෙන්ම පර්යේෂණ හා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා අතර දුර්වල සම්බන්ධතාවය ද මේ ගවේෂණය මඟින් තහවුරු වේ.

v. සමස්තයක් ලෙස, මෙම ගවේෂණයේ පුළුල් අරමුණ වන පුනර්ජනනීය ගොවිතැන් පිළිවෙත් ප්‍රවර්නය කිරීම සඳහා ප්‍රජාව යොමුකර ගැනීමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම ට ගැඩවිල් පොහොර වැඩසටහන සහ නව මාධ්‍ය භාවිතය ඉහළ දායකත්වයක් සපයන බව ඉහත ඇඟයීම තුළින් තවදුරටත් සනාථ වේ. පුනර්ජනනීය ගොවිතැන් පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම ප්‍රකාශයට පත්කරන ලද ප්‍රකාශන සඳහා පවතින ඉහළ ඉල්ලුම මඟින් ඒ බව තවදුරටත් සනාථ වේ.

vi.කෙසේ වුව ද, පොදු සමාජය, නිලධාරීන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් අතර ගැඩවිල් කොම්පෝස්ට් සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුවත්භාවයක් නැතිවීම හේතුවෙන් එය ජනතාව අතර විශාල ලෙස ප්‍රචලිත වී නැත. වෙළෙඳපොළ තුළ ද එයට ප්‍රමාණවත් ඉඩක් හිමි වී නොමැත.

**ප්‍රධාන නිර්දේශ**

i. රසායනික පොහොර භාවිත කරමින් අඛණ්ඩ ව සිදුකරන ඒක බෝග වගාව හේතුවෙන් හායනය වී ඇති පස පුනර්ජනනය කිරීමේ විකල්පයක් වශයෙන් ගැඩවිල් කොම්පෝස්ට් තාක්ෂණය රට තුළ ප්‍රචලිත කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් සහ ව්‍යාප්තිකයන් පියවර ගත යුතු ය.

ii. මෙවැනි වටිනා තාක්ෂණික ක්‍රම ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා සම්ප්‍රදායික කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් බවට පත් කළ යුතු ය. ඒ සඳහා ව්‍යාප්ති සංවිධානයේ මෙන් ම තාක්ෂණික ප්‍රචාරණ ක්‍රියාවලියේ වෙනස්කම් කළ යුතු ය. එනම්, ව්‍යාප්ති සංවිධානයේ මෙහෙයුම් ව්‍යුහයන් ස්ථාවර (TACIT) දැනුම අඩංගු තොරතුරු ගබඩා ලෙස ක්‍රියා කළ යුතු අතර අන්තර්ජාලය හරහා තත්කාලීන තොරතුරු කාර්යක්ෂම ව ලබාදීම සඳහා විද්‍යුත් ඉගෙනුම් හා සන්නිවේදන පහසුකම් සහිත විය යුතු ය.

iii. පර්යේෂණ ආයතනවල ජනනය වී ඒකරාශී වුව ද, ජනතාව අතර ට වේගයෙන් සම්ප්‍රේෂණය නොවන දැනුම හා තාක්ෂණික ක්‍රම වේගවත් ව, පුළුල් ව ප්‍රජාව අතරට රැගෙන යාම සඳහා අගනා විකල්පයක් වන නව මාධ්‍ය භාවිතය කෙරෙහි රජයේ ව්‍යාප්ති සේවය වැඩි අවධානයක් යොමු කළ යුතු එහි සඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ව්‍යාප්තිකාරකයන්ගේ නිරන්තර හා දැඩි සුපරීක්ෂණයට සහ වේගවත් සන්නිවේදනයට යටත් ව එය සිදු කළ යුතු ය.

iv. තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා නව මාධ්‍ය භාවිතා කිරීමේ දී තාක්ෂණ අනුවර්තන ක්‍රියාවලියේ විවිධ අවස්ථා පසුකරන පරිශීලකයින් ට අවශ්‍ය දැනුම් විවිධත්වය ආවරණය කළ යුතු ය. එලෙස විවිධ අවධීන් සඳහා ගැලපෙන පරිදි වැඩසටහන්වල අන්තර්ගතය සැකසීම මඟින් වඩාත් ඵලදායි ලෙස තාක්ෂණය භාවිතා කිරීම සහතික වේ.

## 07. පහතරට තෙත් කලාපයේ වී වගාව මත පදනම් වූ පරිසර පද්ධතිය සහභාගීත්ව සංරක්ෂණය හා නිෂ්පාදකතාව ඉහළ නැංවීම

- මූලා‍ය ප්‍රභවය: රජයේ ඒකාබද්ධ අරමුදල
- පර්යේෂණ කණ්ඩායම: රේණුකා වීරක්කොඩි
- පර්යේෂණ අරමුණු:

වී වගාව මත පදනම් වූ පරිසර පද්ධති, බහු ක්‍රියාකාරී වගා පද්ධති වශයෙන්, මිනිසාට හා පරිසරයට බොහෝ සේවාවන් සපය යි. එබැවින්, වී නිෂ්පාදනය ඉක්මවා ගිය වැදගත්කමක් එවැනි වගා පද්ධති සතු වේ. තව ද, වී ගොවිතැනට ආවේනික වූ සමාජ-සංස්කෘතික සන්දර්භය ගොවි ප්‍රජාවේ ජීවිතයට සමීපව සම්බන්ධ වී තිබේ. රටේ සහනාධාර බෝග ලැයිස්තුවේ ඉහළින් ම ඇති බෝගය වී වන අතර ශ්‍රී ලංකාවේ අස්වැද්දූ කුඹුරු ඉඩම්වල සෑම බිම් අඟලකම වී වගා කිරීමේ වගකීමක් ද පවතියි. මේ සියලු වටිනාකම්වල ට එරෙහි ව ශ්‍රී ලංකාවේ පහත රට තෙත් කලාපීය කුඹුරු ඉඩම් අත්හැර දැමීම, පුරන් වීම, වෙනත් භාවිතයන් වෙත යොමු කිරීම හා ගොඩකිරීම සුලභ වශයෙන් සිදු වේ. පාදුක්ක ගොවි ජන සේවා බල ප්‍රදේශයේ පහළ හංවැල්ල - 445 ග්‍රාම නිලධාරී වසමේ පුරන් වී පැවති ගොඩපොරගොඩැල්ල යාය පදනම් කරගනිමින් දියත් කරන ලද මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ පහතරට තෙත් කලාපයේ වී වගාව මත පදනම් වූ පරිසර පද්ධතියේ නිෂ්පාදකතාව ඉහළ නැංවීම සහ සංරක්ෂණය සඳහා සහභාගීත්ව ප්‍රවේශයක් කෙතරම් ඵලදායි වේ ද යන්න ගවේෂණය කිරීමයි.

**ප්‍රමුඛ සොයාගැනීම්**

I. වැසි ජලය ක්‍රමවත් ව බැස යන ඇළ මාර්ග පද්ධති අවහිර වී ජලාපවහනය දුර්වල වීම සහ ගංවතුරට යටවීම හේතුවෙන් වසර 50කට ආසන්න කාලයක් පුරන් වී පැවති ගොඩපොරගොඩැල්ල යාය 2024 යල කන්නයේ දී නැවත අස්වැද්දීම සඳහා ගොවි සංවිධානයේ සෑම එකාවන් ව සිය මුදල් හා ශ්‍රමය කැප කළ අතර එහි දී අදාළ නිලධාරීන් ගේ මැදිහත්වීම මෙන් ම බිත්තර වී මිල දී ගැනීම සඳහා රාජ්‍ය නොවන සංවිධානයක සහයෝගය ලබාදීමට කටයුතු කිරීම ගොවින් ඒ සඳහා තවදුරටත් දිරිමත් වීමට හේතු විය. ඒ අනුව, පහත රට තෙත් කලාපීය පුරන් කුඹුරු නැවත අස්වැද්දීම සඳහා අනුගමනය කළ සහභාගිත්ව ප්‍රවේශය සාර්ථක අත්දැකීමකි.

II. නිලධාරීන්ගේ මඟ පෙන්වීම හා යාය ගොවි සංවිධානයේ අභිමතය පරිදි පාරම්පරික වී ප්‍රභේදයක් වන රත්දැල් වගා කළ ද අඩ සියවසක පමණ කාලයකට පසු මුහුණ දුන් දරුණු ගංවතුර තත්ත්වය හේතුවෙන් වගාව පූර්ණ වශයෙන් හානි වූ අතර ගොවි ප්‍රජාව ඉන් දැඩි ලෙස අධෛර්යමත් වනු දක්නට ලැබුණි. එසේ වුව ද, නිලධාරීන්ගේ අඛණ්ඩ මැදිහත්වීම සහ දිරිගැන්වීම මධ්‍යයේ මහ කන්නය සාර්ථක කරගන්නට ගොවීන්ට හැකි විය. ඒ අනුව, ගොවි කටයුතු ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ නිරන්තර මැදිහත්වීම හා සුපරීක්ෂණය සංවර්ධිත යායවල අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමට දායක විය.

III. යාය සංවර්ධනයේ දී හුදෙක් ජලාපවහන පද්ධතිය නො සලකා හැර ලියැදි සංවර්ධනය කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදීමෙන් එම උත්සාහය ප්‍රතිඵලදායක නොවීය. එබැවින්, යාය සංවර්ධනයේ දී යායේ පෝෂිත ප්‍රදේශය, ජලාපවහන පද්ධතිය, අනෙකුත් යාය සමඟ පවතින සබඳතා සහ ප්‍රජාවේ අභිප්‍රායයන් වැනි යායේ ගොවි කටයුතු කෙරෙහි යම් අහිතකර බලපෑමක් එල්ල කළ හැකි සාධකවල හැසිරීම කෙරෙහි නිසි අවධානය යොමු කිරීම ද වැදගත් වේ.

**ප්‍රධාන නිර්දේශ**

I. පහත රට තෙත් කලාපීය වී වගාව මත පදනම් වූ පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීමට සහ එහි නිෂ්පාදකතාව ඉහළ නැංවීම සඳහා යාය මට්ටමෙන් පවත්නා අභියෝග, විශේෂයෙන් ආමන්ත්‍රණය කරන ඉලක්කගත ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම වැදගත් වේ. ඒ සඳහා යාය මට්ටමේ යායේ විවිධ පාර්ශ්වකරුවන්ගෙන් යුත් සහභාගිත්ව ප්‍රවේශයක් අනුගමනය කරමින් යාය සංවර්ධනයේ හා කළමනාකරණයේ හිමිකාරිත්වය ලබා ගැනීම සඳහා ගොවි ප්‍රජාව දිරි ගැන්වීම සහ සවිබල ගැන්වීම මඟින් යායේ වගා කටයුතුවල අඛණ්ඩභාවය තහවුරු කිරීමට පියවර ගත යුතු ය.

II. අදාළ ගොවි සංවිධාන සමඟ සහයෝගයෙන් කෘෂිකර්ම නිලධාරීන්ගේ නිරන්තර මැදිහත්වීම හා අධීක්ෂණය මත සංවර්ධිත යායවල දිගුකාලීන ශක්‍යතාව රඳා පවතී. ඔවුන් හුදකලා කිරීමට වඩා ගොවීන් පෙළඹවීමේ හා සවිබල ගැන්වීමේ ආධාරක පරිසරයක් පෝෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. එලෙස සහයෝගීතාව පෝෂණය කිරීමෙන් හා මග පෙන්වීම ලබාදීමෙන් ගොවීන් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සඳහා යොමුවීමටත්, ඔවුන්ගේ ඉඩම් සඳහා ආයෝජනය කිරීමට සහ සාමූහික ව ආයෝජනය කිරීමටත් වැඩි නැඹුරුවක් දක්වන බැවින් සංවර්ධිත යායවල අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමට එවැනි ප්‍රවේශයන් ඔස්සේ පියවර ගත යුතු ය.

III. කුඹුරු යාය සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී ඒවා අවභාවිතයට හා/හෝ අත්හැරීමට හේතු වූ සාධක නැවත ඉස්මතු වීම වැලැක්වීමේ සහ ඉන් ගොවිකටයුතුවල ට අනිසි බලපෑම් එල්ලවීමේ අවදානම අවම කිරීමේ විකල්ප, යාය සංවර්ධන වැඩ සටහනට ඇතුලත් විය යුතු ය. විශේෂයෙන්, දේශගුණික හදිසි තත්වයන්ගෙන් සිදුවන ආපදා අවම කිරීමේ විකල්ප අඩංගු විය යුතු ය.

## 08. කෘෂිකර්මය පදනම් කරගත් නව ව්‍යාපාරයන් හි ප්‍රගතිය: තිරසාර ව්‍යවසායකත්වය සඳහා ඵලදායී මැදිහත්වීම් සැලසුම් කිරීම.

- මූල්‍ය ප්‍රභවය: ඒකාබද්ධ අරමුදල
- පර්යේෂණ කණ්ඩායම : එච්.ජේ.සී.ජයසූරිය
- පර්යේෂණ අරමුණ : ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය පදනම් කරගත් නව ව්‍යාපාරයන් හි ප්‍රගතිය කෙරෙහි ව්‍යවසායකත්ව සංවර්ධන මැදිහත්වීම්වල බලපෑම තේරුම් ගැනීමට සහ ව්‍යවසායකත්ව සංවර්ධන මැදිහත්වීම්වලදී අනුගමනය කළ යුතු සුදුසු ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමට ඇති අදාළත්වය සොයා බැලීම
- තිරසාර සංවර්ධන ඉලක්කය : SDG 08,09




**ප්‍රමුඛ සොයා ගැනීම්**

i. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 68%කට පෙර රැකියා අත්දැකීම් තිබූ අතර, 46% ක් පෙර ව්‍යාපාරයක නියැලී සිටියහ. එසේ තිබියදීත්, අතීත ව්‍යාපාර ඇති අයගෙන් 58%ක් අසාර්ථකත්වයන් වාර්තා කළහ. මෙයින් ඇඟවෙන්නේ රැකියාවේ හෝ ව්‍යවසායකත්වයේ පූර්ව අත්දැකීම් ව්‍යවසායක අභිප්‍රාය පෝෂණය කළ ද එය අනිවාර්යයෙන්ම සාර්ථකත්වය සහතික නොකරන බවයි. බොහෝ නවක ව්‍යවසයන් විකල්ප ආදායම් මාර්ග ලෙස පවත්වාගෙන යාම, අවදානම් ගැනීම සහ අවස්ථා මත පදනම් වූ හැසිරීම සඳහා උදාහරණ වන අතර එය සාර්ථක ව්‍යවසායක ලක්ෂණයන් ලෙස විග්‍රහ කළ හැකිය.

ii. ප්‍රාථමික දත්ත මඟින් පැහැදිලි වන අන්දමට ගුණාත්මක අමුද්‍රව්‍ය සඳහා ප්‍රවේශය, ඉහළ පිරිවැය සහ ප්‍රමාණවත් වෙළෙඳපළ දැනුමක් නොමැතිකම ව්‍යවසායකයින් මුහුදෙන මූලික ගැටලු ලෙස හඳුනාගත

හැකි ය. නිදසුනක් වශයෙන් බිම්මල් වගා කරන්නන් ඉහළ යන නිෂ්පාදන පිරිවැය සහ දුර්වල ගුණාත්මක යෙදවුම් හේතුවෙන් ගැටලුවල ට මුහුණ දී සිටීම දැක්විය හැකි ය. බොහෝ ව්‍යවසායකයින් ට විශ්වාසදායක සැපයුම්කරුවන් නොමැති අතර යෙදවුම්වල ගුණාත්මකබව පිරිහීම හේතුවෙන් ඇතැම අවස්ථාවන්හි දී පාඩුවලට මුහුණ දීමට සිදුවී තිබේ. බොහෝ ව්‍යවසායකයින් තුළ වෙළෙඳපළ ප්‍රවණතා, ගැනුම්කරුවන් සහ අපනයන ක්‍රියාවලීන් සම්බන්ධයෙන් දැනුවත්භාවය සහ ප්‍රවේශතාවය සීමිත වූ අතර, බොහෝ විට ව්‍යවසායකයෝ ලාභ නො ලබන හෝ තිරසාර නොවන ව්‍යාපරයන් හි සිරවී සිටිය හ.

iii. ව්‍යවසායකයින්ගෙන් 90%ක් වාර්තා කළේ ඔවුන්ට ලැබුණු සහායන් ඔවුන්ගේ අවශ්‍යතාවයට නො ගැළපුණු හෝ කාලානුරූපී ව අවශ්‍යතාය ව සමඟ නො ගැලපෙන බවයි. බොහෝ දෙනෙකුට ඔවුන්ගේ වඩාත්ම තීරණාත්මක ආරම්භක අවධියෙන් පසුව හෝ ඔවුන්ගේ ව්‍යාපාර ආකෘතියට නො ගැළපෙන, ද්‍රව්‍යමය හෝ මූල්‍යමය සහාය ලැබී තිබුණි. තරුණ හා දැනුමැති ව්‍යවසායකයින් ඍජු මූල්‍ය ප්‍රදානවල ට වඩා අඩු පොලී ණය සහ උපායමාර්ගික මගපෙන්වීමට කැමැත්තක් දැක් වූ අතර අනෙක් අය යෝග්‍ය තාක්ෂණික පුහුණුව සහ තත්ත්ව සහතික සඳහා උපකාර අවශ්‍ය බව අවධාරණය කළ හ.

**ප්‍රධාන නිර්දේශ**

i. ව්‍යවසායක ගමන ට අනුකූලව බහු-අදියර සහාය පද්ධති සැලසුම් කිරිම සහ දියත් කිරීම:

- පූර්ව-ආරම්භය: ව්‍යාපාර අදහස් නිර්ණය කිරීම, යෝජනා සංවර්ධනය සහ මූලික මූල්‍ය සාක්ෂරතාවය තහවුරු කිරීම ඉලක්ක සහායන්

- මුල් අදියර: ප්‍රායෝගික තාක්ෂණික පුහුණුව, නිෂ්පාදන සංවර්ධන සහාය සහ තනි පුද්ගල මග පෙන්වීම්.

- වර්ධන අදියර: වෙළෙඳපළ සම්බන්ධතා පහසුකම් සැපයීම, සහතික කිරීමේ සහාය (උදා: GAP, HACCP), සහ අපනයන-සූදානම් මඟ පෙන්වීම.

මෙමඟින් ව්‍යවසායකයින්ට වඩාත්ම අවශ්‍ය වූ විට අදාළ සහාය ලැබෙන බව සහතික කරයි, සම්පත් භාවිතය කාර්යක්ෂම වීම සහ තිරසාරභාවයව තහවුරු වේ.

ii. වෙළෙඳපළ ප්‍රවේශය සහ සැපයුම් දාමයන් හි ඔරොත්තුදීමේ හැකියාව වැඩි දියුණු කිරීම. මේ සඳහා,

- නිෂ්පාදන තීරණ සඳහා මඟ පෙන්වීම ට ඉවහල් වන වෙළෙඳපළ පර්යේෂණ පුහුණුව සහ ඉල්ලුම් පුරෝකථනය කළ හැකි මෙවලම් භාවිතය
- පිරිවැය අඩු කිරීමට සහ ගුණාත්මක බව සහතික කිරීමට අමුද්‍රව්‍ය සැපයුම් මධ්‍යස්ථාන පිහිටුවීම,

- ව්‍යවසායකයින්, ගැනුම්කරුවන්, සැපයුම්කරුවන් සහ අපනයන පහසුකම් සපයන්නන් සමඟ සම්බන්ධ කිරීම සඳහා ඩිජිටල් වේදිකා සැකසීම

යන කාරණා ඒකාබද්ධ කරන ලද සහාය සේවා සැපයීමේ ජාතික රාමුවක් සංවර්ධනය කිරීම.

මෙම නිර්දේශය මඟින් වෙළෙඳපළ දැනුවත්භාවය සහ යෙදවුම් සඳහා ප්‍රවේශ්‍යතාවයේ පරතරය අවම කිරීමට අවස්ථාව උදා වන අතර එමඟින් ව්‍යාපාරයේ ලාභදායිතාවය සහ අඛණ්ඩතාවය ඉහළ නැංවීමට හැකි වේ.

iii. ඒකාබද්ධ ආයතනික සම්බන්ධීකරණ ආකෘතියක් ස්ථාපිත කිරීම.

- විවිධ රාජ්‍ය ආයතන (උදා: DOA, SED, NEDA, DEA) සම්බන්ධ කරන මධ්‍යගත ව්‍යවසායක සහාය පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම.

- ඩිජිටල් ලුහුබැඳීමේ/සොයාබැලීමේ සහ යොමු කිරීමේ පද්ධතියක් (උදා: වාර්තාවේ යෝජනා කර ඇති පරිදි QR කේත මත පදනම් වූ ලියාපදිංචිය).

- එක් එක් ආයතනය සඳහා ඔවුන්ගේ මූලික ශක්තීන් මත පදනම්ව පැහැදිලිව නිර්වචනය කරන ලද භූමිකාවන් ලබා දී, ඒ සඳහා ක්‍රියාත්මකවීම ට දිරි ගැන්වීම.

- ව්‍යවසායකයින් විවිධ ආයතනයන් හි විවිධ සහාය අදියර හරහා ගමන් කරවන ආකාරයේ අනුක්‍රමික සේවා සැපයීමේ උපකාරක ජාලයක් ස්ථාපනය කිරීම.

මෙය එකම පුද්ගලයා වෙත එකම ආකාරයේ සහායන් විවිධ ආයතන/ව්‍යාපෘති හරහා නැවත නැවත ලැබීම වළක්වයි, සම්පත් ප්‍රශස්ත උපයෝජනයට මඟ පාදයි එමෙන් ම පුළුල් හා බාධාවකින් තොරව අවභා සහායන් ප්‍රතිලාභීන් වෙත ට සම්ප්‍රේශණය වීම සහතික කරයි, අවසානයේ වඩාත් සුසංයෝගී ප්‍රතිඵලදායී සහ සැලකිය යුතු බලපෑමක් සිදුකළ හැකි මැදිහත්වීමේ ආකෘතියක් නිර්මාණය කරයි.

## දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති

### 01. ඩිජිටල් විභවය අගුළු හැරීම: ශ්‍රීලංකාවේ කෘෂිකාර්මික අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ප්‍රගතිය සඳහා වන අභියෝග සහ විභවතා





- **මූල්‍ය ප්‍රභවය** : භාණ්ඩාගාර අරමුදල්
- **පර්යේෂණ කණ්ඩායම** : එම්. ඩී. සුසිලා ලුර්දු, සංගීත් ප්රනාන්දු, සාගරිකා හිටිහාමු
- **පර්යේෂණ අරමුණ** : ශ්‍රී ලංකාවේ ඩිජිටල් ව්‍යාප්ති සේවාවන් භාවිතයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා විසඳුම් යෝජනා කිරීමට ඒ සම්බන්ධයෙන් වූ වත්මන් පසුබිම පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක නියැළීම.
- තිරසාර සංවර්ධන ඉලක්ක : SDG 2

**ප්‍රධාන අරමුණ ට අදාළ ප්‍රමුඛ සොයා ගැනීම්:**

i. ගොවීන්ගෙන් 74%ක ට සහ නිලධාරීන්ගෙන් 95%ක ට ස්මාර්ට් ජංගම දුරකතන (Smart mobile phone) හිමිකම පවතී. ස්මාර්ට් ජංගම දුරකතන භාවිතයේ අඩු ප්‍රවීණතාවය සහ තාක්ෂණික වශයෙන් නිරන්තරයෙන් යාවත්කාලීන නොවීම යන කරුණු හේතුවෙන් ස්මාර්ට් ජංගම දුරකතනයක් හිමි සෑම ගොවියෙක් ම ඩිජිටල් කෘෂි ව්‍යාප්ති සේවාවට නැඹුරුවක් නො දක්වති.

ii. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකාර්මික තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC) විසින් ගොවීන් සඳහා විශේෂයෙන් සකස් කළ ඩිජිටල් ජංගම දුරකතන යෙදුම් පිළිබඳව අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන්ගෙන් 91%කගේ දැනුවත්භාවයක් නො මැත.

iii. සමාජ මාධ්‍ය ජාලා සහ ගුවන් විදුලි ගොවි සේවා යන ඩිජිටල් මෙවලම්වල ට අමතර ව ගොවීන්ගේ ව්‍යාප්ති සේවා අවශ්‍යතාවය වෙනුවෙන් සකස් කළ ඩිජිටල් කෘෂිකාර්මික යෙදුම් (යෙදුම්) පැවතිය ද ඒවා පිළිබඳව ගොවීන් ට සහ නිලධාරින් ට නිසි දැනුවත්කිරීමක් සිදු නොවීම

(93%), ඩිජිටල් කෘෂිකාර්මික යෙදුම් වෙත ප්‍රවේශවීමේ නො දැනුවත්කම (39%), ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකථන යෙදුම් යාවත්කාලීන නොවීම සහ තොරතුරු යාවත්කාලීන නොවීමෙන් මෙවලම් පිළිබඳ නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය නොමැති වීම (29%), ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතය සම්බන්ධයෙන් ගොවීන් මෙන්ම නිලධාරීන් ද මුහුණ දෙන දෙන ප්‍රධාන ගැටලු වේ.

**ප්‍රධාන නිර්දේශ**

I. බිම් මට්ටමේ සිටින කෘෂිකාර්මික අංශයට අදාළ නිලධාරීන්ට (කෘෂිකර්ම උපදේශක නිලධාරී, තාක්ෂණික සහායක නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරී) ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්තිය, භාවිතය හා ප්‍රවේශය පිළිබඳව දැනුම ලබාදීම.

II. එම පුහුණුව ලත් නිලධාරීන් හරහා සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයක ම තෝරාගත් ගොවි සංවිධාන හා කාන්තා සංවිධාන මට්ටමෙන් ගොවීන් ට ඩිජිටල් කෘෂි ව්‍යාප්තිය ට නැඹුරුවීමට ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

III. සමාජ මාධ්‍ය ජාලාවන් හි කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ දැනුම හා තොරතුරු ව්‍යාප්තිය රාජ්‍ය මැදිහත් වීම හරහා නියාමනයට ලක් කිරීම.

## 02. ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන: ක්‍රියාකාරීත්වය හා තිරසරභාවය

- මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල.
- පර්යේෂණ කණ්ඩායම : ප්‍රසන්න විජේසිංහ, එන්.පි.ජී. සමන්ත, දුමින්ද ප්‍රියදර්ශන, ජයමිණි චම්පිකා, සංගීත් ප්‍රනාන්දු, අනුපා දිසානායක, එම්.ආර්.එෆ්. සෆ්රා.
- පර්යේෂණ අරමුණ : ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම හා සමාජ-ආර්ථික මානයන් විශ්ලේෂණය කිරීම.
- තිරසාර සංවර්ධන ඉලක්කය : SDG 2, 2.c

2024 වර්ෂය අවසන් විට අදාළ අධ්‍යයනයේ ක්ෂේත්‍ර දත්ත රැස් කිරීම සිදුවෙමින් පැවතුණේය.



## කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් භාර දුන් අධ්‍යයන

### 01. පසු අස්වනු හානි අවමකිරීම සඳහා ලබා දී ඇති ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීම

- මූල්‍ය ප්‍රභවය : මහා භාණ්ඩාගාරය
- පර්යේෂණ කණ්ඩායම : ඩබ්.එච්.දුමින්ද ප්‍රියදර්ශන
- පර්යේෂණ අරමුණ : පසු අස්වනු හානිය අවම කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පසු අස්වනු කළමණාකරණ ආයතනය (IPHT) හරහා 2019 - 2023 කාලසීමාව තුළ එළවළු සහ පලතුරු නිෂ්පාදකයින් සහ ව්‍යාපාරිකයින් වෙත ලබා දී ඇති ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය මඟින් අපේක්ෂිත අරමුණු ඉටුවී තිබේ ද, යන්න පිළිබඳ සොයා බැලීම.
- තිරසාර සංවර්ධන ඉලක්කය : SDG 2



**ප්‍රධාන අරමුණ ට අදාළ ප්‍රමුඛ සොයා ගැනීම්**

i. සහනදායී පදනම මත ලබා දී ඇති ප්ලාස්ටික් ඇසුරුම් භාවිතා කළ හැකි මට්ටමේ පවතින අතර ඒවා සමස්ථ වෙළෙඳපොළ සංසරණය සඳහා භාවිතා නොවන බව අනාවණය විය. ගොවීන් තම නිෂ්පාදන ගොවිපොළ තුළ හැසිරවීම සහ බොහොමයක් ගොවීන් සුපිරිවෙළෙඳසැල් සඳහා තම නිෂ්පාදන රැගෙන යාමට පමණක් අදාළ ඇසුරුම් භාවිතා කරන බව දක්නට ලැබුණි.

ii. මෙම ලබාදීමේ කාර්යයත් සමඟ පෙර පැවති සම්ප්‍රදායික වෙළෙඳපොළ රටාවන් වෙනස්කර මෙම කූඩ ලබාගෙන ඇති ගොවීන්ගෙන් 75%ක් පමණ සුපිරි වෙළෙඳසැල් සඳහා මෙම ඇසුරුම් භාවිතා කරමින් තම එළවළු සහ පලතුරු ප්‍රවාහනය කිරීම දක්නට ලැබුණි.

iii. සාමාන්‍ය වෙළෙඳපොළ තුළ පවතින පසු අස්වනු හානි තත්ත්වයන් අවම කිරීම ට මෙම ඇසුරුම් ලබාදීම සෘජුව ම හේතු වී නොමැත. එනම්, ඒ සඳහා වෙළෙඳපොළ තුළ නිෂ්පාදකයාගේ සිට අවසන් පාරිභෝගිකයා දක්වා වන අලෙවිකරණදාමය තුළ සෑම පාර්ශ්වයක් තුළ ම මෙම ප්ලාස්ටික් ඇසුරුම් සුලභ විය යුතු වුව ද, එසේ වී නොමැති තත්ත්වයක් දැකගත හැකි විය.

iv. ප්‍රවාහනය ඇතුළු අත්‍යවශ්‍ය යටිතල පහසුකම්වල පවතින ගැටලු සහගත තත්ත්වයන් මත, ඇසුරුම් පැවතිය ද ඒවා භාවිතා නො කරන බව දැකගත හැකි විය.

**ප්‍රධාන නිර්දේශ**

i. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන තුළ ප්ලාස්ටික් ඇසුරුම් භාවිතා කර නිෂ්පාදන රැගෙන එන නිෂ්පාදකයි ට සහ රැගෙන යන ව්‍යාපාරිකයින්ට ඒ සඳහා වෙන් වූ අලෙවි කුටි කිහිපයක් ආර්ථික මධ්‍යස්ථානය තුළ ආරම්භ කිරීම.

ii. පසු අස්වනු කළමණාකරණය යනු එක් පාර්ශ්වයකට පමණක් ඇසුරුම් කූඩ ලබාදීම තුළින් සිදුකළ හැකි කාර්යයක් නොවන බැවින් විශේෂයෙන් ප්‍රවාහනය තුළින් සිදුවන හානි අවම කරගැනීම සඳහා ඒ වෙනුවෙන් මැදිහත් වන සියලු පාර්ශවයන් සතුව මෙම ඇසුරුම් සංසරණය විය යුතු බව සහ මේ ආශ්‍රිතව අවශ්‍ය යටිතල පහසුකම් රාජ්‍ය අංශය විසින් ලබා දීම.

iii. සියලුම එළවළු සහ පලතුරු සඳහා මෙම ප්ලාස්ටික් කූඩ භාවිතය එකවර ක්‍රියාත්මක කළ නො හැකි බැවින් ඉහළ පසුඅස්වනු හානි පවතින එළවළු සහ පලතුරු වර්ගයන්ගෙන් අවම වශයෙන් පහක් හෝ තෝරාගෙන ඒ සඳහා සියලු පාර්ශ්වය ට මෙම ප්ලාස්ටික් කූඩ භාවිතය අනිවාර්යය කිරීම.

iv. සුපිරි වෙළෙඳසැල්, හෝටල්, අපනයන ඇතුළු සෘජු අලෙවි මාර්ග වෙත පිවිසෙන නව ව්‍යවසායක මට්ටමේ නිෂ්පාදකයින් වෙත සහනදායී පදනම මත තත්ත්වයෙන් ඉහළ ප්ලාස්ටික් කූඩ ලබාදීම තුළ ක්‍රමානුකූලව පසුඅස්වනු හානිය අවම කරගත හැකි වීම.

## 2.3 අධ්‍යාපන හා පුහුණු අංශය

01. **කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන II වන අදියර: ''නවක කෘෂි ව්‍යවසායකයින්ට තම කෘෂි ව්‍යාපාර සාර්ථක ව, අඛණ්ඩ ව සහ තිරසාර ව පවත්වාගෙන යාමට අවශ්‍ය සහාය ලබා දීමේ පුහුණු වැඩසටහන''.**





- මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල
- පුහුණු කණ්ඩායම : මාතලේ දිස්ත්‍රික්කය තුළ පවත්වනු ලැබූ පළමු අදියරේ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සහභාගී වූ පුහුණුලාභීන් අතුරින් සමීක්ෂණයක් මඟින් ලද තොරතුරු ඇසුරින් කිසියම් ව්‍යාපාරික අවස්ථාවක් ආරම්භ කරන ලද තරුණ කණ්ඩායමක් මෙම වැඩසටහනේ ඉලක්ක ගත කණ්ඩායම විය.
- වැඩසටහනේ අරමුණ : නවක ව්‍යවසායකයින් විසින් ආරම්භකර ඇති ව්‍යාපාරයන් හි දී ඔවුන්ට මුහුණ දීමට සිදු වන විවිධ අභියෝග හමුවේ එම ව්‍යාපාරයන් අඛණ්ඩව සහ තිරසර ලෙස පවත්වාගෙන යාමට වැදගත්වන දැනුම සහ කුසලතා වර්ධනය කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.
- තිරසාර සංවර්ධන ඉලක්කය: SDG 8,9
- පුහුණුව ලබා දුන් ආයතනය හෝ කණ්ඩායම: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාපාර සංවර්ධන ඒකකය, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මෙම වැඩසටහන සඳහා සම්පත්දායකත්වය සපයන ලදි.

පුහුණු වැඩසටහන් පැවැත්වූ ස්ථාන සහ දින:

- මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය රැස්වීම් ශාලාව - 2024.07.30
- දඹුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය රැස්වීම් ශාලාව - 2024.07.31
- රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය රැස්වීම් ශාලාව - 2024.08.01

**සහභාගී වූ සංඛ්‍යාව**

- මාතලේ 27 දෙනෙකු, දඹුල්ල 36 දෙනෙකු, රත්තොට 31 දෙනෙකු ලෙස මාතලේ දිස්ත්‍රික්කයෙන් මුළු ප්‍රතිලාභීන් 94 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සම්බන්ධ වී තිබේ.

**පුහුණු වැඩසටහනේ ස්වභාවය:** එක්දින පුහුණු වැඩසටහන

**පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණ ට අදාළ අපේක්ෂිත ප්‍රතිඵල**

i. ග්‍රාමීය ආර්ථිකයට ශක්තියක් සැපයිය හැකි සාර්ථක, ශක්තිමත් සහ ස්ථාවර තරුණ කෘෂි ව්‍යවසායකයින් පිරිසක් බිහිවීම.

ii. අභියෝග ජය ගනිමින් තම ව්‍යාපාර අඛණ්ඩ ව පවත්වාගෙන යාමට නවක ව්‍යවසායකයින් සවිබල ගැන්වීම.

iii. ඒ හරහා ප්‍රතිලාභීන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ යාම සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

**පුහුණු වැඩසටහන අවසානයේ සහභාගීවූවන් ට ලැබෙන ප්‍රතිලාභ:**

- නවක ව්‍යවසායකයින් මුහුණ දෙන අභියෝග හමුවේ එම ව්‍යාපාරයන් අඛණ්ඩ ව තිරසරව පවත්වාගෙන යාමට වැදගත් වන දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය වීම.

**වැඩසටහන පිළිබඳ සහභාගීවූවන්ගේ ප්‍රතිචාර :**

- සමස්තයක් ලෙස වැඩසටහන ඉතා සාර්ථක බවත්, ඉදිරයේ දී තවත් මෙවනි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙසත් ඉල්ලීම.

පුහුණු වැඩසටහන පිළිබඳ කරුණු සන්නිවේදනය කිරීම සඳහා ජාතික පුවත්පත්වල ට සම්පාදිත ලිපි/ සහභාගී වූ විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්/ සමාජ මාධ්‍ය ලිපි :

- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ Facebook සහ You Tube පිටු හරහා වැඩසටහන් පිළිබඳව ප්‍රචාරයක් සහ තොරතුරු බෙදා හැරීමක් සිදු කරන ලදී. එයට අමතර ව ගොවිමිණ පුවත්පත සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ගොවිකටයුතු පුහුණු පුවත් සඟරාවන් හි මේ පිළිබඳ තොරතුරු ඇතුළත් කරන ලදී.

## 02. කෘෂි ව්‍යවසායකයන් සංවර්ධනය සඳහා ග්‍රාමීය තරුණ ප්‍රජාව පෙළඹවීමේ තෙදින නේවාසික පුහුණු වැඩසටහන් මාලාව





- මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල
- ඉලක්ක පුහුණු කණ්ඩායම : මහනුවර, ගම්පහ හා රත්නපුර දිස්ත්‍රික්කයන් හි නවක කෘෂි ව්‍යවසායකයින් සහ ව්‍යවසායක අවස්ථාවන් ආරම්භ කිරීමට බලාපොරොත්තුවෙන් ඒ සඳහා සැලකිය යුතු මට්ටමේ සූදානමක් පවතින, තරුණ කණ්ඩායමක් අතරින් අයදුම්පත් හා සම්මුඛ පරීක්ෂණ හරහා තොරා ගන්නා ලද 25 දෙනා බැගින් වූ කණ්ඩායම් තුනක් මෙම වැඩසටහනේ ඉලක්කගත කණ්ඩායම් විය.

**පුහුණු වැඩසටහනේ අරමුණු :**

- ආකල්ප හා කුසලතා වර්ධනය තුළින් තරුණ ප්‍රජාව කෘෂි ව්‍යවසායකයින් ලෙස ගොඩනැංවීම සඳහා සවිබල ගැන්වීම මූලික අරමුණ විය.
- තිරසාර සංවර්ධන ඉලක්කය : SDG 08,09




**පුහුණුව ලබා දුන් ආයතනය හෝ කණ්ඩායම :**

මෙය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යෙ දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ වැඩසටහනකි. ඒ සඳහා සම්පත් දායකත්වය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යවසාය සංවර්ධන ඒකකය හා තරුණ ගොවිජන මූලස්ථානය, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, අපනයන මණ්ඩලය සහ සාර්ථක කෘෂි ව්‍යවසායකයින් මඟින් සපයා ගනු ලැබිය.

**පුහුණු වැඩසටහන් පැවැත් වූ ස්ථාන සහ දින:**

- මහනුවර - සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - ගන්නොරුව 2024.11.06 සිට 2024.11.08 දක්වා
- ගම්පහ - මානව සමපත් සංවර්ධන හා කළමණාකරණ පුහුණු ආයතනය - 2024.12.02 සිට 2024.12.04 දක්වා
- රත්නපුර - ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය-පහතරට මධ්‍යස්ථානය - 2024.12.26 සිට 2024.12.28 දක්වා

සහභාගී වූ සංඛ්‍යාව: මහනුවර 25 දෙනෙකු, ගම්පහ 25 දෙනෙකු, රත්නපුර 21 දෙනෙකු ලෙස දිස්ත්‍රික්ක තුනෙහි 71 දෙනෙක් මෙම වැඩසටහන සඳහා පුහුණුලාභීන් ලෙස සහභාගි වූහ.

පුහුණු වැඩසටහනේ ස්වභාවය : තෙදින නේවාසික පුහුණු වැඩසටහන

**පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණට අදාළ අපේක්ෂිත ප්‍රතිඵල :**

i.කෘෂි ව්‍යවසායකයින් ට දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය තුළින් සවිබල ගන්වන ලද නවක ව්‍යවසායක කණ්ඩායම් බිහි වීම.

ii.නව නිෂ්පාදන විවිධාංගීකරණය සහ නව වෙළෙඳපොළ අවස්ථාවන් වෙත යොමු වීම තුළින් ඔවුන්ගේ ආදායම් මට්ටම වර්ධනය වීම.

iii.සේවා සපයන ආයතන සමඟ ශක්තිමත් සම්බන්ධතාවන් ගොඩනඟා ගැනීම හරහා සාර්ථක ඉදිරි ගමනක් වෙත අවතීර්ණ වීම.

**පුහුණු වැඩසටහන අවසානයේ සහභාගීවූවන් ට ලැබෙන ප්‍රතිලාභ:**

- ව්‍යවසායකත්ව ආකල්ප, කුසලතා දැනුම වර්ධනය වී ශක්තිමත් ව්‍යවසායකයින් ලෙස ඉදිරියට යාමට පෙළඹීම.

**වැඩසටහන පිළිබඳ සහභාගීවූවන්ගේ ප්‍රතිචාර:**

සමස්ථයක් ලෙස වැඩසටහන ඉතා සාර්ථක බවත්, ඉදිරියේ දී ඔවුන්ගේ ප්‍රගතිය සොයා බලමින් අවශ්‍ය සහාය ගැනීම සඳහා වැඩසටහන් සකස් කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය. එසේ ම, තවත් කණ්ඩායම් සඳහා මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලීම සිදු කෙරිණ.

පුහුණු වැඩසටහන පිළිබඳ කරුණු සන්නිවේදනය කිරීම සඳහා ජාතික පුවත්පත්වළට සම්පාදිත ලිපි/ සහභාගී වූ විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්/ සමාජ මාධ්‍ය ලිපි:

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය Facebook පිටුව හරහා සියලු වැඩසටහන් සම්බන්ධ තොරතුරු හුවමාරුකර ගැනීම සිදු කරන ලදී. එසේ ම, ජාතික රූපවාහිනියේ රන් අරුණැල්ල වැඩසටහන හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ YouTube පිටුව හරහා මෙම වැඩසටහන් පිළිබඳව වාර්තාමය වැඩසටහන් ප්‍රචාරය කරන ලදී.

**02. ආහාර සුරක්ෂිතතාවය සඳහා ප්‍රජා සවිබල ගැන්වීම: ගෘහ ඒකක මට්ටමෙන් අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන**



- **මූල්‍ය ප්‍රභවය:** ඒකාබද්ධ අරමුදල
- **පුහුණු කණ්ඩායම:** සක්‍රීය කාන්තා සංවිධානයක සාමාජිකත්වය සහිත, පුහුණුකරුවන් විසින් ලබා දෙන පණිවිඩය තවත් එවැනි ම පිරිසකට සන්නිවේදනය කිරීමේ ධාරිතාවකින් යුත් වයස අවුරුදු 20ත් 50ත් අතර ගෘහණියන් මෙම වැඩසටහන් සඳහා පුහුණුලාභීන් ලෙස තෝරා ගන්නා ලදි.
- **පුහුණු වැඩසටහනේ අරමුණ :** ග්‍රාමීය ප්‍රදේශයන්, සීමිත සම්පත් සහිත වටපිටාවක ජීවත් වන ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යාම සඳහා ගෘහ ඒකක මට්ටමෙන් සිදු කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රජාවේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම මෙම දැනුවත් කිරීම් වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය.
- **තිරසාර සංවර්ධන ඉලක්කය:** SDG 2

**පුහුණුව ලබා දුන් ආයතනය හෝ කණ්ඩායම :**

- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල
- ශ්‍රී ලංකා මහ බැංකුව - ත්‍රිකුණාමලය

**පුහුණු වැඩසටහන පැවැත්වූ ස්ථානය සහ දිනය :**

- මන්නාරම දිස්ත්‍රික්කය - මාන්තායි බටහිර, මඩු, මුසලි, නානත්තන්, මන්නාරම ප්‍රා.ලේ.කා - 2024.02.19-2024.02.22

- වව්නියා දිස්ත්‍රික්කය - වව්නියා උතුර, වව්නියාව, වෙන්ගලචෙඩ්ඩිකුලම්, වව්නියාව දකුණ ප්‍රා.ලේ.කා 2024.03.11 - 2024.03.14

- මඩකලපු දිස්ත්‍රිකකය - කාත්තන්කුඩි, පෝරතිවුපත්තු, මන්මුනෙයි දකුණ, එරාවූර්පත්තු, මන්මුනෙයි බටහිර- 2024.02.13 - 2024.02.17

**සහභාගී වූ සංඛ්‍යාව :** මන්නාරම දිස්ත්‍රික්කය - ප්‍රතිලාභීන් 200, වව්නියා දිස්ත්‍රික්කය - ප්‍රතිලාභීන් 153, මඩකලපු දිස්ත්‍රිකකය - ප්‍රතිලාභීන් 440
පුහුණු වැඩසටහනේ ස්වභාවය: එක්දින

වැඩමුළුවේ ප්‍රධාන අරමුණ ට අදාළ  අපේක්ෂිත ප්‍රතිඵල

- ගෘහ ඒකකයන් හි ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගැනීම සඳහා ගෘහ ඒකක මට්ටමෙන් අනුගමනය කළහැකි ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීම.
- ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගැනීම සඳහා ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව භාවිතයට ගැනීම සඳහා පෙළඹෙන පිරිසක් අදාළ ප්‍රදේශයන් තුළින් බිහිවීම
- අදාළ ප්‍රදේශයන් හි සහ පොදුවේ සමස්ථ රටෙ හි ම ආහාර සුරක්ෂිතතාවය ස්ථාවර ව පවත්වාගැනීම

**පුහුණු වැඩසටහන අවසානයේ සහභාගීවූවන් ට ලැබෙන ප්‍රතිලාභ:**

- ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය වර්තමානයේ මුහුණ දෙන අභියෝග හා පිළියම්, ගෙවත්ත ආශ්‍රිත බෝග හා සත්ත්ව නිෂ්පාදන නිපදවීම, ආහාර සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම, මූල්‍ය සාක්ෂරතාව සහ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම, ආහාර පරිභෝජනයේ පෝෂණීය පැතිකඩ හා ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් වීම.

**වැඩසටහන පිළිබඳ සහභාගී වූවන්ගේ ප්‍රතිචාර**

සහභාගීවූවන්ගේ ප්‍රතිචාර අනුව පැහැදිලි වූ ප්‍රධාන කරුණු 2කි. එනම්,

1. පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලද්දේ ශ්‍රී ලංකාව දරිද්‍රතා මට්ටම ඉහළ දිස්ත්‍රික්කයන් හි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන්  තෝරාගත් කාන්තා සංවිධාන නායිකාවන් සහ නිලධාරීන් වන අතර සහභාගීවූවන් සඳහන් කළේ, එය ගොවිජන සේවා මට්ටමෙන් ද සිදු කළ යුතු බවයි.

2. පුහුණු වැඩසටහනෙන් ආවරණය කළ ක්ෂේත්‍ර කාන්තාවන් ට ඉතා වැදගත් බවත්, විශේෂයෙන් මූල්‍ය සාක්ෂරතාව සහ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීමේ සැසිය කාන්තාවන් මුහුණ දෙන මූල්‍ය හා බැංකු කටයුතු පිළිබඳ ගැටලු අවම කිරීමට දායක වූ බවයි.

පුහුණු වැඩසටහන පිළිබඳ කරුණු සන්නිවේදනය කිරීම සඳහා ජාතික පුවත්පත්වල ට සම්පාදිත ලිපි/ සහභාගී වූ විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්/ සමාජ මාධ්‍ය ලිපි :

- ගොවිජනතා සඟරාව, ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ලිපිය, 1-2 කලාපය, 26 වෙළුම, 2024 ඔක්.- දෙසැ.

## 4. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම



- **අරමුදල් මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල**

- පුහුණු කණ්ඩායම: පී.සී.ජේ. ද සිල්වා, සුසිලා ලූර්දු, චින්තක ජයසූරිය සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සම්පත්දායකයින්.
- පුහුණු වැඩසටහනේ අරමුණ: ගොවිජන සංවර්ධන පනතේ සඳහන් ආකාරයට ගොවි සංවිධාන තම රාජකාරි ඉටු කරන බව සහතික කිරීම
- තිරසර සංවර්ධනය ඉලක්කය: SDG 2
- ප්‍රතිලාභී ආයතනය/ කණ්ඩායම: ගොවිජන පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන්ගේ නියෝජිතයින්.

**පුහුණු වැඩසටහන් පැවැත්වෙන දින සහ ස්ථාන :**

**හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන 10ක එක්දින පුහුණු වැඩසටහන් 10ක් සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන 15ක එක්දින පුහුණු වැඩසටහන් 15ක් වශයෙන් පුහුණු වැඩසටහන් 25ක් පවත්වන ලදි.**

සහභාගී වූවන් සංඛ්‍යාව: 406

**අපේක්ෂිත ප්‍රතිඵල :**

- FOs විසින් ලේඛන නිසි ලෙස නඩත්තු කිරීම සහ ගිණුම් තබා ගැනීම
- ගොවි සංවිධානවල වගකීම් සහ පනත මඟින් පැවරී ඇති බලය පිළිබඳ දැනුමක් ඇති ගොවි සංවිධාන සාමාජිකයින්
- සංවර්ධන ගොවි ප්‍රජාව සඳහා ගොවි සංවිධානවල වැදගත්කම සහ විභවයන් අවබෝධ කර ගැනීම

**සහභාගීවූවන් විසින් ලබා ගන්නා ලද ප්‍රතිලාභ :**

- ගොවි ප්‍රජාවගේ සංවර්ධනය සඳහා ස්ථාපිත සංවිධානයක් ලෙස ගොවි සංවිධානවල බලය, වගකීම සහ විභවය පිළිබඳ දැනුම, ගිණුම් තබා ගැනීමේ කුසලතා, අභිප්‍රේරණය සහ දැක්ම පුළුල් කිරීම මෙන්ම තනි තනිව හා ප්‍රජාවක් ලෙස සංවර්ධනය වීමට ආකල්ප වර්ධනය කිරීම.

**සහභාගීවූවන්ගේ ප්‍රතිචාර සහ ප්‍රතිපෝෂණ:**

- සහභාගිවන්නන්ගේ ප්‍රතිපෝෂණ සහ ප්‍රතිචාර වාචික ව සහ නිශ්චිත ඇගයීම් පත්‍රිකාවක් හරහා ලබා ගන්නා ලදී. සහභාගිවන්නන්ගේ ප්‍රතිචාර වැඩසටහන ඇගයීම ඉතා වැදගත් වන අතර එය ප්‍රාදේශීය මට්ටමේ සිට ගොවි ප්‍රජාවේ පුළුල් කොටසකට සහභාගී වී ප්‍රතිලාභ ලබා ගත හැකි වන ආකාරයට ප්‍රාදේශීය මට්ටමේ සිට ගොවිපළ තොරතුරු මට්ටම දක්වා ව්‍යාප්ත කළ යුතු ය.

## 2.4 දත්ත කළමණාකරණ අංශය

### කෘෂිකාර්මික අලෙවි තොරතුරු ව්‍යාප්තිය (Agriculture Marketing Information System - AMIS)




වෙළෙඳපොළ මිල හා තොරතුරු එක් රැස් කිරීම, සැකසීම, විශ්ලේෂණය කිරීම හා බෙදාහැරීම මෙම ව්‍යාප්තියේ ප්‍රධාන අරමුණ වේ. විශේෂයෙන් ම, ගොවිපළ මිල, තොග මිල හා සිල්ලර මිල ගණන් ලංකාවේ ප්‍රධාන නිෂ්පාදන හා පාරිභෝගික ප්‍රදේශ ආවරණය වන පරිදි වෙළෙඳපොළවල් 45ක් තුළින් රැස් කිරීම සිදු කරනු ලබයි. ගොවිපළ මිල ගණන් ප්‍රදේශ 27කින් ද, තොග මිල ගණන් ප්‍රදේශ 37කින් හා සිල්ලර මිල ගණන් ප්‍රදේශ 45කින් එක් රැස් කරනු ලැබේ. එමෙන් ම, ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි අයිතම 150ක පමණ මිල ගණන් ඒක් රැස් කරනු ලැබේ. එම තොරතුරු දෛනික ව, සතිපතා හා මාසික ආහාර ද්‍රව්‍ය විවරණිකා ලෙස ප්‍රකාශයට පත් කරනු ලබයි. තව ද, මොබිටෙල් "6666" කෘෂි මිල දර්ශකය මඟින් ලංකාවේ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථාන හා තොග වෙළෙඳපොළ 10ක තොග මිල බෙදා හැරේ. වෙළෙඳපොළ දත්ත හා තොරතුරු වෙබ් අඩවිය (www.harti.gov.lk) හරහා, Whatsapp කණ්ඩායම්, Emal කණ්ඩායම් මඟින් අඛණ්ඩ ව බෙදා හරිනු ලබයි.

මෙම වෙළෙඳපොළ තොරතුරු එක් රැස්කිරීම හා බෙදා හැරීම කාර්යක්ෂම හා ඵලදායී කිරීම සඳහා ස්වයංක්‍රීය තොරතුරු පද්ධතියක් (Automated Cloud System) නිර්මාණය කර ඇත. දැනට මෙම නව පද්ධතිය පවතින පද්ධතියට සමගාමී ව අත්හදා බැලීම සිදුකරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයන්, අමාත්‍යාංශ, රාජ්‍ය හා පුද්ගලික ආයතන, විශ්වවිද්‍යාලවල සිසුන් ඇතුළු තොරතුරු භාවිතා කරන්නන්හට ඔවුන්ගේ ඉල්ලීම්වල ට අනුව ලබා දීමේ කටයුතු ද දත්ත කළමණාකරන අංශයේ ප්‍රධාන කාර්යභාරයක් වේ.



## 2.5 තොරතුරු හා සන්නිවේදන අංශය


















"ගොවිකටයුතු අධ්‍යයනය" 14 වෙළුම 01 වැනි කලාපය (2023) සහ Sri Lanka Journal of Agrarian Studies, Vol 20, No 01, 2023 ප්‍රකාශයට පත් කිරීම.




**01. ජාතික අලුත් සහල් මංගල්‍ය - 2024 විශේෂ සමරු කලාපය මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීම.**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉල්ලීමක ට අනුව තොරතුරු හා සන්නිවේදන අංශය පුද්ගලික ආයතනවල 100%ක් මූල්‍ය අනුග්‍රහය සහිත ව ජාතික අලුත් සහල් මංගල්‍යය - 2024 විශේෂ සමරු කලාපයේ පිටපත් 1000ක් මුද්‍රණය කරන ලදි.

ගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමිය සහ කෘෂිකර්ම අමාත්‍යතුමා ද ඇතුළු සම්භාවනීය අමුත්තන් පිරිසකගේ සහාගීත්වයෙන් අනුරාධපුර ජය ශ්‍රී මහ බෝ සමිඳුන් අභියස පැවැති ජාතික අලුත් සහල් මංගල්‍යයේ දී මෙම පිටපත් ගරු ජනාධිපතිතුමා ඇතුළු ආරාධිත අමුත්තන් හට සහ මෙම අවස්ථාව ට සහභාගී වූ ගොවිජනතාව ඇතුළු පිරිස වෙත නොමිලේ පිරිනමන ලදි.

**02. "ගොවිජනතා" සඟරාවේ කලාප 4 ක් ප්‍රකාශයට පත් කිරීම.**

ආයතනය විසින් ත්‍රෛමාසික ව ප්‍රකාශයට පත්කරනු ලබන 'ගොවිජනතා ත්‍රෛමාසික සඟරාවේ' කලාප 04ක් පසුගිය 2024 දී ප්‍රකාශයට පත්කරන ලදි. ගොවිජනතා සඟරාව සඳහා ආයතනයේ පර්යේෂණ නිලධාරීන්, විමර්ෂණ නිලධාරීන් සහ විද්වතුන් විසින් ලිපි සපයන ලද අතර මෙහි පිටපත් අලෙවි කිරීම සහ විශ්වවිද්‍යාල, ගොවිජන සේවා මධ්‍යස්ථාන ඇතුළු ආයතන වෙත ලබා දෙන ලදි.

03. "ගොවිකටයුතු අධ්‍යයනය" 14 වෙළුම 01 වැනි කලාපය (2023) සහ Sri Lanka Journal of Agrarian Studies, Vol 20, No 01, 2023 ප්‍රකාශයට පත් කිරීම.

04. Govimina.com සහ kamanalam.com වෙබ් අඩවි ද්විත්වය ආරම්භ කිරීම

Devpro Gurantee Ltd හි මූල්‍යාධාර මත 2024 දී Govimina.com සහ kamanalam.com වෙබ් අඩවි ද්විත්වය ආරම්භ කරන ලදි. කෘෂිකර්මාන්තය ට සම්බන්ධ රාජ්‍ය ආයතනවල සහ පෞද්ගලික අංශයේ සම්බන්ධීකරණයෙන් මෙහි ලිපි සම්පාදනය සිදු කෙරේ. 2024 වර්ෂයේ දී ලිපි 400කට ආසන්න සංඛ්‍යාවක් උඩුගත කරන ලදි.

05. Devpro Gurantee Ltd හි මූල්‍යාධාර මත 2024 දී SMEs Guide SL.COM වෙබ් අඩවිය සහ SMEs Guide SL මාසික සඟරාව ආරම්භ කරන ලදි.

06. සමාජ මාධ්‍ය පළකිරීම් 2024

Youtube වැඩසටහන්: පසුගිය 2024 වර්ෂය තුළ පරිපූර්ණ වීඩියෝ 38ක් සහ කෙටි විඩියෝ 53ක් අන්තර්ජාලය ට මුදාහැර ඇත. පරිපූර්ණ වීඩියෝ 38 පහත දැක් වේ.




1. බරත් වැඩි, කිරිත් වැඩි, ලෙඩත් අඩු "කොට්ටුකච්චි"- එළු පාලනය - 2 කොටස https://youtu.be/sq4hc2gB1u8"
2. එළු පාලනය" - අඩු වියදම් සත්ත්ව පාලනයක්, කිරිගව පාලනයේ නිරත අයට ඉතා පහසුවෙන් කරන්න https://youtu.be/i52GoYAMavQ
3. ආනන්ද සමරකෝන්ගේ හෙළිදරව්ව "අද කුස්සිය වෙනස් වෙලා මිනිස්සු ලෙඩ වෙන්න මේකත් හේතුවක්" https://youtu.be/mbP1DJ5G8Y8
4. සරසවි සිසුන්ටත් දැනුම බෙදන අපූරු ගොවියා - "දොඩම් වගාවෙන් විශාල

20 මී මැසි පාලනය තාක්ෂණික පුහුණුව - 2 - මී මැසි පෙට්ටි නඩත්තුව සහ පරීක්ෂාව https://youtu.be/IQuNia0SeK4
21 මාසෙට ලක්ෂ හයක් හතක් උපයන්න අවස්ථාවක් https://youtu.be/AfpzUCL9bUg
22 ගොවිජනතාව නඟා සිටුවීමට ගොවි සංවිධාන සතු බලතල. https://youtu.be/ue3d1CFg95g
23 ප්‍රමාණවත් ආරක්ෂිත සහල් තොග රජය සතු ද? https://youtu.be/WOB6WGW5g0A
24 "අතීතය ගුරුවරයෙක්"ආනන්ද සමරකෝන් මහතා විසින් සිදුකළ දේශනය https://youtu.be/cUe2tlBqz_0

ආදායමක් ගන්න පුළුවන්" https://youtu.be/1NX3ShfCwM4

5. ජේර වචන ගුරුතුමා,"මේකෙ හොඳ අමතර ආදායමක් උපරිමය ට මිල බැස්සත් ඒත් ලාබයි https://youtu.be/RUgP15kH4Uo
6. සුබ නැකතට පුරන් කුඹුරු අස්වද්දමු https://youtu.be/mQxD3Nep9a8
7. සයිලේජ් නිෂ්පාදනය නිවැරදිව කරන ආකාරය https://youtu.be/PvD7uZpjza0
8. අද මම සාර්ථක කෘෂි ව්‍යවසායකයෙක් https://youtu.be/Xj59YHN9Pd0
9. කිරිගව පාලනයේදී ඉතා වැදගත් වන ඇසොල්ලා වගාව නිවැරදි ව කරන ආකාරය https://youtu.be/IZbOrO3jwmA
10. முதல் அறுவடை மூலம் 200000 வருமானம் https://youtu.be/TU_X3t-1jOw
11. කිරිගව පාලනයේ දී ඉතා වැදගත් තෘණවගාව නිවැරදි ව කරන ආකාරය https://youtu.be/crNsuYNaIHs
12. මී මැසි ජනපදයක් නිවැරදිව ගෘහගත කරන ආකාරය https://youtu.be/9S-eQ2u4jBI
13. විසිතුරු මල් වගාවට ඔබත් කැමති ද? https://youtu.be/8YlFHHAFiTg
14. කිරිගව පාලනයේ දී ඉතා වැදගත් වන TMR සකසන අයුරු https://youtu.be/AeSbMRz9xKM
15. முயற்சியின் மூலம் நீங்களும் இது போல் வெற்றி பெறலாம் https://youtu.be/MovWM05i7Ac
16. කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරින් සතු විය යුතු ගුණාංග https://youtu.be/BGr0F1jePq
17. මී මැසි පාලනය https://youtu.be/Wtx2y3PB23I
18. நான் இப்போது ஒரு வெற்றிகரமான தொழிலதிபர் - பாரம்பரிய அரிசிக்கு நல்ல கேள்வி உள்ளது https://youtu.be/LzQcB-Nk3ZU
19. වරදින්නේ නැති කෘෂිකාර්මික ව්‍යාපාරයක් https://youtu.be/Fta0eP6PLeU

25 කිරිගව පාලනයෙන් මාසයකට රුපියල් 600,000ක් ආදායමක් https://youtu.be/pgYmV-duO-Y

26 නිතර ම මිල ගණන් වෙනස්වන බිත්තර සහ කුකුල් මස් කර්මාන්තය https://youtu.be/-xhVYcOUXVQ

27 මී මැසි පාලනය තාක්ෂණික පුහුණුව - 01 - මී පැණි නිස්සාරණය https://youtu.be/xDYTDA1T_z4

28 පහතරට තෙත් කලාපයට වී ගොවිතැන එපා ද? https://youtu.be/ipHqiP6t-SI

29 මී මැසි පාලනය තුළින් අමතර ආදායමක් උපයන්න ඔබටත් පුළුවන් https://youtu.be/aUkocGWcRQc

30 මොකක්ද මේ ගෝලීය අගයදාමය? https://youtu.be/nIWrHBv-FG8

31 කිරි ගොවීන් ලක්ෂපතියන් කරන ඩී ටෙක් DEE Tech ව්‍යාපෘතිය හැදුන හැටි https://youtu.be/IODVoN4VH8c

32 අසාර්ථක නොවන්න ආරක්ෂිත ගෘහයක් හදන හැටි - ආචාර්ය මනෝජ් කොඩිකාර https://youtu.be/qoywWNsjVgI

33 පොලිටනල් තුළ බෝග වගාව නිවැරදි ව කරන හැටි - ආචාර්ය මනෝජ් කොඩිකාර https://youtu.be/ElD9hRQdunU

34 ඇන්තූරියම් වලින් සල්ලි හොයන්නෙ මෙහෙමයි https://youtu.be/PuyJaBL6fKY

35 දෙළුම් වගාවෙන් ලක්ෂ ගණන් උපයමු https://youtu.be/9ssro_WG-yM

36 නව බද්ධ බත් පත ට කෙසේ බලපායි ද? https://youtu.be/KdJD_UGbaoM

37 லட்சக்கணக்கில் வருமானம் தரும் நிலக்கடலை விதை உற்பத்தி https://youtu.be/YvUh4_pjwCE

38 දියුණුවට මග - "ධනාත්මක ලෙස ආකල්ප වෙනස් කිරීම වැදගත්" https://youtu.be/Tfo6SrJZWEE

## 2.6 පුස්තකාලය

පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන පුද්ගලයින්ගේ සහ සංවිධානවල ප්‍රයෝජනය සඳහා කෘෂිකාර්මික අංශයට අදාළ තොරතුරු එක්රැස් කිරීම, ගොනු කිරීම සහ තොරතුරු අවශ්‍යතා සැපයීම වේ. වර්ෂය තුළ කාර්ය මණ්ඩලයේ විමර්ෂණ අවශ්‍යතා වෙනුවෙන් ග්‍රන්ථ 164ක් ද විමර්ශන කෘති 16ක් සහ වාර ප්‍රකාශන 05ක් ද නිකුත් කර තිබේ. වර්ෂය තුළ පුස්තකාලය ට පැමිණි බාහිර පාඨකයන් සංඛ්‍යාව 76කි.

- **පොත්,සඟරා සහ වාර ප්‍රකාශන අත්පත් කර ගැනීම**

වර්ෂය තුළ ග්‍රන්ථ 27ක් පුස්තකාල එකතුව ට අත්පත් කර ගෙන ඇත. දේශීය සහ විදේශීය ආයතනවලින් විශාල වාර සඟරා, පුවත් හසුන්, වාර්ෂික වාර්තා ප්‍රමාණයක් හුවමාරු හෝ පරිත්‍යාග වශයෙන් ලැබී තිබේ.

- **පුස්තකාල සේවා**

පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ බාහිර පාඨක ඉල්ලීම් පරිදි තොරතුරු සහ ප්‍රලේඛන සේවාවන් වන සාහිත්‍ය ගවේෂණය, විමර්ශන සේවා, කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම් සහ ඡායා පිටපත් සේවාවන් සපයන ලදී.

පුස්තකාලය තුළ නවීන වයිෆයි පහසුකම ලබා ගැනීමත් සමඟ අන්තර්ජාල පාදක තොරතුරු පහසුකම් සඳහා වූ ප්‍රවේශය පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා තවදුරටත් පුළුල් කරන ලදී. පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර පාඨකයින් සඳහා විවිධ විෂයයන් යටතේ පවත්වා ගෙන යන පුවත්පත් ලිපි එකතුව ක්ෂණික විමර්ශනය සඳහා අඛණ්ඩ අනුක්‍රමණිකගත කොට ඇත.

- **අන්තර් පුස්තකාල සහයෝගීතාවය (ILC)**

යම්කිසි පුස්තකාල ද්‍රව්‍යක් මෙම පුස්තකාලයේ හෝ වෙනත් විශේෂ පුස්තකාලයක නොමැති විට අන්තර් පුස්තකාල සහයෝගීතා ක්‍රමය මඟින් පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගැනීමේ පහසුකම මෙම පුස්තකාලය සතුව පවතී. එය ආයතනික මට්ටමෙන් සිදු විය යුතු අතර අන්තර් පුස්තකාල සහයෝගීතාව සඳහා ඉල්ලුම් කරන පුස්තකාල මුලින්ම එකඟතාවයකට/ නීති පද්ධතියකට යටත් ව අත්සන් කොට පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගත හැකි ය. තව ද, මෙම ආයතනයේ පර්යේෂණ අවශ්‍යතාවයන් සඳහා විද්‍යුත් ලිපි මඟින් විශ්ව විද්‍යාල අතර විද්‍යුත් ලිපි, විද්‍යුත් ලියකියවිලි හුවමාරු කර ගැනීම ද සිදු කරනු ලබයි.

- **පුස්තකාල ප්‍රවර්ධන වැඩසටහන්**

මෙම පුස්තකාලය පිළිබඳ අත් පත්‍රිකා විශ්ව විද්‍යාල සිසුන් හා පුස්තකාලය ට පැමිණි පරිශීලකයින් අතර බෙදා හරින ලදී

## 2.7 බාහිර සහයෝගිතාවයන්

බාහිර හවුල්කාරිත්ව සම්බන්ධතා පුළුල්වීම සහ ආයතනය බොහෝ අන්තර්ජාතික ආයතන සමඟ සබඳතා නැවත ගොඩනගා ගැනීම.

| | ආයතනයේ නම | යෙද වූ මුදල (රු) |
|---|---|---|
| 01 | DevPro Guaranty Ltd -Web | 1,090,000.00 |
| 02 | DevPro Guaranty Ltd. SMEs 2004/25 | 30,000.00.00 |
| 03 | ජාතික අලුත් සහල් මංගල්‍ය 2024 | 500.000.00 |
| 04 | ආහාර හා කෘෂිකාර්මික සංවිධානය | 7,520,000.00 |
| 05 | ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය | 3,670,000.00 |
| 06 | unique land use GmbH | 2,200,000.00 |

01. DevPro Guarantee Ltd හි මූල්‍ය ප්‍රතිපාදන මත 2024 ජුනි මාසයේ දී Govimina.com, kamalanam.com වෙබ් අඩවි ද්විත්වය සංවර්ධනය කරන ලදි. මෙම වෙබ් අඩවි සංවර්ධනය කිරීමේ අරමුණ වූයේ කෘෂිකර්මාන්තය හා සම්බන්ධ අන්තර් රාජ්‍ය ආයතනවල කාලීන තොරතුරු, ආයතනයේ පර්යේෂණ හා වෙළෙඳපොළ තොරතුරු සිංහල හා දමිළ පාඨකයින් වෙත වඩාත් තිරසාර ලෙස සන්නිවේදනය කිරීමට නව මාධ්‍ය භාවිතාවන් යොදා ගැනීමයි.




02. Devpro Gurantee Ltd හි මූල්‍යාධාර මත 2024 වර්ෂයේ දී 'ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කාන්තා ව්‍යවසායකයින් අතර ධාරිතා වර්ධනය සහ ජාලකරණය තුළින් ව්‍යාපාරික අවස්ථා සහ කර්මාන්ත සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම' නම් ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.




**අරමුණු:**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල කාන්තාවන්ගේ ආදායම් මට්ටම් ඉහළ නැංවීම සහ අදාළ ක්ෂේත්‍රවල ඔවුන්ගේ තිරසාරභාවය වැඩි දියුණු කිරීමයි. මෙම කාන්තා ව්‍යවසායකයින් අතර ධාරිතා වර්ධනය, මූල්‍ය ආධාර සඳහා පහසුකම් සැලසීම සහ ආයතනික ජාලකරණය තුළින් ව්‍යාපාරික අවස්ථා සහ කර්මාන්ත සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සාක්ෂාත් කර ගැනීමට නියමිත ය.

**ඉලක්ක කණ්ඩායම:**

මොනරාගල, බදුල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කයන් හි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් (ලියාපදිංචි සහ ලියාපදිංචි නො කළ ව්‍යාපාර දෙකම). MSME තෝරා ගැනීම සහ බලමුළු ගැන්වීම HARTI විසින් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා සිදු කරනු ලැබේ. කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන MSME සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සිදුකරයි.

ව්‍යාපෘතිය විසින් මූල්‍ය ආයතන, රජයේ දෙපාර්තමේන්තු, පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීන්, කලාපීය සහ ජාතික මට්ටමෙන් විශ්ව විද්‍යාල වැනි සහායක පාර්ශ්වකරුවන් බලමුළු ගැන්වීම සිදුකරයි.

**ක්‍රියාකාරකම්:**

1. සියලුම රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන සහ MSME අංශයේ සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන බැංකු සහ මූල්‍ය ආයතන අතර අන්තර්-නියෝජිත යාන්ත්‍රණයක් (ව්‍යාපෘතියේ පොදු අරමුණ සඳහා ක්‍රියා කරන) නිර්මාණය කිරීම තුළින් MSME, විශේෂයෙන් කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන සහ කාන්තා ව්‍යවසායකයින්ගේ ධාරිතා වර්ධනය.

2. MSME අංශයේ සේවය කරන MSME, විශේෂයෙන් කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන සහ කාන්තා ව්‍යවසායකයින් ජාලගත කිරීම සහ බලමුළු ගැන්වීම.

3. MSME අංශයේ සංවර්ධනයට අදාළ මූල්‍ය, අපනයන, තාක්ෂණය ඇතුළු පවතින සම්පත් පිළිබඳ අත්පොතක් (MSME පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික මග පෙන්වීම පිළිබඳ) සහ සඟරාව/සම්පත් පොතක් ප්‍රකාශයට පත් කිරීම සහ වෙබ් අඩවියක්, YouTube නාළිකාවක් සහ සමාජ මාධ්‍ය වේදිකා පවත්වාගෙන යාම.

4. MSME අංශයේ සංවර්ධනය සඳහා පවතින සම්පත් සහ අවස්ථා මෙන් ම සමාජ මාධ්‍ය වේදිකා හරහා කාන්තා ව්‍යවසායකයින් වෙනුවෙන් ව්‍යාපාර සහ වෙළෙඳපළ අවස්ථා පුළුල් කිරීම පිළිබඳව ජාතික මාධ්‍ය (රූපවාහිනී සහ පුවත්පත්) සහ සමාජ මාධ්‍ය වේදිකාවල (වෙබ් අඩවි, ෆේස්බුක්, YouTube සහ අනෙකුත් මාධ්‍ය) ප්‍රචාරනය කිරීම.

5. MSME අංශයේ කාන්තා ව්‍යවසායකයින් සඳහා උපදේශන, ජාලකරණය, මඟ පෙන්වීම සහ සහාය ලබා දෙමින් පැය 24 පුරාම ක්‍රියාත්මක සිංහල මාධ්‍ය උපදේශන සේවාවක් සංවර්ධනය කිරීම.

6. මොනරාගල, බදුල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික්කයක ට එක් වැඩමුළුවක් බැගින්, MSME සංවර්ධනය ට සම්බන්ධ ආයතන සහ සංවිධාන සඳහා ධාරිතා වර්ධනය සහ සම්බන්ධත වැඩමුළු පැවැත්වීම.

**ප්‍රතිඵල:**

1. සියලුම කොටස්කරුවන්/ආයතන (රාජ්‍ය ආයතන, බැංකු, රාජ්‍ය නොවන සංවිධාන, විශ්වවිද්‍යාල/පර්යේෂණ ආයතන, මාධ්‍ය) එක් වේදිකාවකට ගෙන ඒම, එමඟින් එවැනි ආයතනවල ඇති සම්පත් සහ සේවාවන් හඳුනා ගැනීම සහ එම කොටස්කරුවන් අතර සම්බන්ධීකරණය වර්ධනය කිරීම.

2. පැය 24 පුරා ක්‍රියාත්මක තොරතුරු මධ්‍යස්ථානය (ක්ෂණික දුරකථන අංකය), වෙබ් අඩවි, සමාජ මාධ්‍ය සහ අනෙකුත් මාධ්‍ය කටයුතු හරහා දැනුවත්භාවය ඇති කිරීම තුළින්, කාන්තා ව්‍යවසායකයින්ට ජාලය සංවර්ධනය කිරීමට සහ අදාළ ආයතන/පාර්ශවකරුවන්ගෙන් සහාය සහ පහසුකම් ලබා ගැනීමට හැකියාව වැඩි කෙරේ.

3. දිස්ත්‍රික් මට්ටමේ සාකච්ඡා/රැස්වීම්, MSME සඳහා සහාය වීම, කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යවසායන් වෙත ඔවුන්ගේ සේවාවන් වැඩි අවධානයක් යොමු කරමින් ලබා දීමට පෙළඹෙනු ඇත. කොටස්කරුවන් සමඟ පැවැත්වේ. ප්‍රකාශන (අත්පොත සහ සඟරා) කාන්තා ව්‍යවසායකයින්ගේ දැනුම සහ දැනුවත්භාවය තවදුරටත් වැඩි දියුණු කරනු ඇත. බැංකු ඇතුළු විවිධ කොටස්කරුවන් සමඟ ඇති සම්පත් භාවිතා කිරීමට කාන්තා ව්‍යවසායකයින්ට මඟ පෙන්වීම සිදු කෙරේ.

4. සජීවී රූපවාහිනී වැඩසටහන්, පුවත්පත් ලිපි සහ සමාජ මාධ්‍ය වේදිකාවල වීඩියෝ ප්‍රචාරණය, MSME අංශයේ කාන්තා ව්‍යවසායකයින්ගේ දැනුවත්භාවය සහ දැනුම වැඩි දියුණු කරනු ඇත.

5. කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන MSME සංවර්ධනය පිළිබඳ මනා දැනුමක් ඇති දක්ෂ පුද්ගලයෙකු දුරකථනයෙන් සහ මාර්ගගත මුලපිරීම් හරහා කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන MSME ව්‍යාපාරවල ගැටළු වලට පිළිතුරු සැපයීම සඳහා පූර්ණ කාලීන ව යෙදවීම.

6. ප්‍රතිපත්ති සම්පාදකයින් ට සහ MSME පිළිබඳ අනෙකුත් තීරණ ගැනීමේ ආයතනවල ට ප්‍රයෝජනවත් වන ප්‍රතිපත්ති කෙටි විස්තර සහ මාර්ගෝපදේශ සංවර්ධනය කර ඉදිරිපත් කිරීම.

## 2. ආහාර හා කෘෂිකාර්මික සංවිධානය

ගුණාත්මක තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, තත්ත්ව සහතික කිරීම සහ අලෙවිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා FAO-DOA-HARTI සහයෝගීතා ව්‍යාපෘතිය යටතේ සංවිධානය කළ "බීජ නිෂ්පාදන අංශයේ පාර්ශ්වකරුවන්ගේ තාක්ෂණික ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා වන පුහුණු වැඩසටහන් මාලාව"

පුහුණු කණ්ඩායම: බීජ නිෂ්පාදනය, තත්ත්ව සහතික කිරීම සහ බීජ සහ රෝපණ ද්‍රව්‍ය අලෙවිකරණයට සම්බන්ධ වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්; සහ බීජ නිෂ්පාදනය සහ අලෙවිකරණයට සම්බන්ධ ගොවීන්

පුහුණු වැඩසටහනේ අරමුණ : මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ බීජ නිෂ්පාදනය, සහතික කිරීමේ ක්‍රියාවලිය සහ දැනුම ව්‍යාප්තිය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගේ ධාරිතාව වැඩි කිරීම; මෙන් ම බීජ නිෂ්පාදනය සහ අලෙවිකරණය පිළිබඳ බීජ නිෂ්පාදකයින්ගේ දැනුම වැඩි දියුණු කිරීමයි.

**පුහුණු වැඩසටහනට අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය;**

- තිරසාර සංවරධන ඉලක්ක අංක 02: කුසගින්න තුරන් කිරීම-
- දැරිය හැකි මිලකට ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය කාලෝචිත ලෙස ගොවීන් වෙත ලැබීම සහතික කිරීම මඟින් ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීමට දායකවීම

**පුහුණුව ලබා දුන් ආයතනය හෝ කණ්ඩායම:**

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය සහ බීජ සහතික කිරීමේ සේවය යන අංශ මඟින් සම්පත්දායකත්වය ලබාගත් අතර වැඩසටහන් සම්බන්ධීකරණය සහ සංවිධානය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මඟින් සිදු කරන ලදී.

**පුහුණු වැඩසටහන් පැවැත් වූ ස්ථාන සහ දින:**

- වයඹ පළාත - වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, බතලේගොඩ - 2024 ඔක්තෝබර් 07 සහ 08
- මධ්‍යම පළාත - සේවා සංසකරණ අභ්‍යාස ආයතනය, ගන්නෝරුව - 2024 ඔක්තෝබර් 21 සහ 22
- ඌව පළාත - කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල - 2024 නොවැම්බර් 21 සහ 22
- දකුණු පළාත - සේවා සංසකරණ අභ්‍යාස ආයතනය, අඟුණුකොළපැලැස්ස - 2024 නොවැම්බර් 28 සහ 29
- උතුරු පළාත - 2025 මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිත ය
- නැගෙනහිර පළාත - 2025 අප්‍රේල් මාසයේ දී පැවැත්වීමට නියමිත ය

**ස්ථාන හයක ගොවි පුහුණු -** 2025 මාර්තු සිට මැයි දක්වා පැවැත්වීම ට නියමිත ය

**සහභාගී වූ සංඛ්‍යාව;**

වයඹ පළාත - සහභාගිවන්නන් 30

- මධ්‍යම පළාත - සහභාගිවන්නන් 38
- ඌව පළාත - සහභාගිවන්නන් 32
- දකුණු පළාත - සහභාගිවන්නන් 30 දෙනෙක්

**වැඩමුළුවේ ප්‍රධාන අරමුණ ට අදාළ  අපේක්ෂිත ප්‍රතිඵල:**

- බීජ නිෂ්පාදනයට යොමුවන ගොවීන්ට දෙමුහුන් බීජ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම ලබා දිය හැකි සහ  ප්‍රවර්ධනය කළ හැකි කෘෂි ව්‍යාප්ති නිලධාරීන්ගෙන් සමන්විත පුහුණු කණ්ඩායම් නිර්මාණය කිරීම
- තෝරාගත් බෝග සඳහා දෙමුහුන් බීජ නිෂ්පාදනය ට ගොවීන් පිරිසක් අලුතින් එකතු කිරීම/වීම.
- තෝරාගත් බෝගවල දෙමුහුන්කරණ ක්‍රියාවලිය සහ බීජ පනතට අදාල ව  බීජ නිෂ්පාදකයින් වෙත දැනුම් දිය යුතු ප්‍රධාන ඇතුළත් වීඩියෝ වැඩසටහ් නිෂ්පාදනය කිරීම.

**පුහුණු වැඩසටහන අවසානයේ සහභාගීවූවන්ට ලැබෙන ප්‍රතිලාභ :**

- තෝරාගත් බෝගවල දෙමුහුන් බීජ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගේ සහ බීජ නිෂ්පාදකයින්ගේ දැනුම සහ කුසලතා වැඩිදියුණු වීම.

**වැඩසටහන පිළිබඳ සහභාගීවූවන්ගේ ප්‍රතිචාර;**

(එ) රු.2,971,456 ක් වටිනා ප්‍රකාශන පොත්වලින් විශාල ප්‍රමාණයක් නැවත භාවිතා කළ නොහැකි පරිදි විනාශ වී හෝ දූර්වර්ණ වී ඇති බව හඳුනා ගෙන තිබුණද අදාල පොත් තොගයෙන් ඉවත් කිරීමට හෝ ඒ වෙනුවෙන් අවශ්‍ය වෙන් කිරීම්, කිරීමෙන් තොරව ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ .පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ

විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

| නීතිරීති / විධානයට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 381(1) | රාජකාරී බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතු වුවත්, ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ජංගම බැංකු ගිණුම් 04ක් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි මෙහෙයුම් අත්පොතෙහි 3 පරිච්ඡේදයේ 3.4 (ix) වගන්තිය | වැඩ බලන පත්වීමක් වසරක් නොඉක්මවන කාල සීමාවකට සීමා විය යුතු වුවත්, ආයතනයේ සේවය කරන නිලධාරීන් 06 දෙනෙකුට වසර ගණනාවක සිට වැඩ බැලීමේ රාජකාරී වල නිරත වීම වෙනුවෙන් රු.2,063,343 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අංක මු.අ.01/2015/01 හා 2015 මැයි 15 දිනැති චක්‍රලේඛයේ 7 (ආ) වගන්තිය | ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී වීනයේ පැවති පුහුණු වැඩ සටහනක් සඳහා 2024 නොවැම්බර් 01 සිට 14 දක්වා සහභාගී වීම වෙනුවෙන් අනියම් දීමනා සඳහා එක්සත් ජනපද ඩොලර් 375 ට සමාන රු.112,678ක අත්තිකාරම් මුදලක් දින 15ක කාලයක් සඳහා ගෙවා තිබුණි. මෙම වැඩසටහනට සහභාගී වීම වෙනුවෙන් වීන අනුග්‍රාහක ආයතනය විසින් දෛනික වියදම් සඳහා රු.84,000 කට සමාන යුවාන් 2,100 ක් ගෙවා තිබුණි. ඒ අනුව චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඇය හිමිකම් නොලබන රු.84,000 ක මුදල දිවයිනට පැමිණ මසක් ඇතුළත ආයතනය වෙත ගෙවිය යුතු වුවත්, 403 දරන පාලක මණ්ඩල රැස්වීමේදී වාරික 36 කින් ගෙවීමට මෙම චක්‍රලේඛයට පටහැනිව අනුමැතිය ලබා දී තිබුණි. |

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

(අ) ආයතනය සඳහා 2019 මැයි 27 දින 228 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර තිබුණද, තනතුරු 13 කට අදාල කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර ගෙන නොතිබුණි.

(ආ) ආයතනයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනුමත තනතුරු සඳහා වාර්ෂිකව කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු වුවත්, ආයතනය විසින් 2019 වර්ෂයෙන් පසුව කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.43,189,356 ක් වන අතර ඉන් විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂය රු.17,915,464 ක්ව තිබුණි. මෙම විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂයෙන් රු.12,643,448 ක මුදලක් 2002 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයක් වන අතර එම මුදල අය කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. තවද 2021 වර්ෂයේදී ආයතනයට නොදන්වා විශ්ව විද්‍යාලයක කථිකාචාර්ය තනතුරක් සඳහා ඉවත්ව ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.5,272,016 ක මුදල අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ඈ) ගෙවිය යුතු රු.2,158,880 ක ශේෂය වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන අතර එම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඉ) ලෝක ආහාර සංවිධානයෙන් 1984 වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙස ලද රු.600,000 ක් වූ ලොරි රථය ගිණුම්ගත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ආයතනය වෙත පවරා ගෙන නොතිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

**Fin/Aud/Qry/2024 ARI/B/HARTI/FA/01/24/35/01**

**<u>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංකය 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>**

2025.05.30 දිනැතිව අංක **ARI/B/HARTI/FA/01/24/35/01** යටතේ යොමුකරන ලද උක්ත වාර්තාවට අදාල කරුණු පැහැදිලි කිරීම පහත පරිදි වේ.

**1.2. තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

අ) පිලිගතිමි

ඉදිරියේදි නිවැරදි ලෙස වර්ගිකරණය කිරිමට කටයුතු කරමි.

ආ) සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව ගණනයකර ගිණුම්ගත කර ඇත. විගණනය විසින් පෙන්වාදි ඇති පරිදි මෙම ප්‍රමිතිය ප්‍රකාරව අනෙකුත් හෙලිදරවු කිරිමද ඉදිරියේදි සිදුකරමි.

ඇ) "කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ආරක්ෂක නිලධාරින් යැයි පවසන නිලධාරින් වෙත ආයතනය සතු නේවාසිකාගාර කාමර 05ක් ලබාදිම සම්බන්ධව" අධ්‍යක්ෂතුමා විසින් 2019/07/10 දිනැති අංක R/INFO/5 දරණ ලිපිය මගින් කමිටුවක් පත් කර තිබු අතර එම කමිටු වාර්තා කමිටුව විසින් 2019.09.02 අධ්‍යක්ෂකතුමා වෙත යොමු කර ඇත.එම කමිටු වාර්තාව පදනම් කර ගනිමින් 2020.09.03 පැවති විගණන හා කලමනාකරණ කමිටුව වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කරමින් රු. 8895470/- ආදායමක් ලෙස ගිණුම්ගත කිරිමට නිර්දේශ සඳහා ඉදිරිපත් කර ඇත. එම විගණන හා කලමනාකරණ කමිටුවේ නිර්දේශය අනුව මූල්‍ය ප්‍රකාශන වල මෙම තොරතුරු හෙලිදරවු කර ඇත.2024 වාර්ෂික මූල්‍ය ප්‍රකාශයේ සටහන් 1.8(iii) යටතේ හෙලිදරවු කර ඇත.

ඇ) පිලිගතිමි.

ඉ) G 36 - වෙනස රු. 468,703.00

2-4 ව්‍යාපෘතියට අදාලව EPF හා ETF ඇතුලුව උපචිත වියදම් ලැයිස්තුවේ රු. 438757.38 ක් ඇතුලත් කර ඇත. ගොවිය යුතු පර්යේෂණ හා පුහුණු වියදම් ලැයිස්තුවේ G 36 යටතේ එක් එක් ව්‍යාපෘතින් සඳහා එකතුව රු. 718,554.52 ක් ඇතුලත් කර ඇත. මුළු එකතුව EPF,ETF ආයතන අඩුකිරිම වවුචරයට අමුනා ඇති උපලේඛණය පරිදි රු.1157311.90 කි. ඒ අනුව ගිනුම් ගත කිරිම නිවැරදිය.

G 83 - වෙනස රු. 1000.00 - එකඟ වෙමි.

P - වෙනස රු. 30875.00

CT 472 හා CR 603 ව්‍යාපෘතින්ට අදාල විමර්ශන වැටුප් හා ඊට අදාල ETF 3% ද උපලේඛණයට ඇතුලත් කර ගිනුම් ගතකර ඇත. (EPF 25% - 27500.00 ETF 3% - 3300, මුද්දර ගාස්තු වු රු. 75 ද අඩුකිරිමට පෙර වියදම ගිනුම් ගත කරනු ලබයි.) ඒ අනුව ගිනුම්ගත කිරිම නිවැරදිය.

ඊ) ආයතනයට භාහිර ව්‍යාපෘති වලින් වැබ්ලට් 103 ලැබී තිබුනද එම නියෝජිත ආයතන ටැබ්ලට් 103 ලබාදීමට අදාලව ගිවිසුමේ සඳහන් කර නොතිබුන අතර ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරිමේදී අවශ්‍යතාව මත ලබාදී තිබුණි නමුත් මෙම ටැබ්ලට් 103 පරිහරණය කරන බැවින් මෙහි වෙළඳපොල අගය මත 2024 වර්ෂයේ මුල්‍ය වාර්තාවල ඇතුලත්කර පාලක මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරිමට පෙර විගණන හා කලමනාකරණ කමිටුව වෙත නිර්දේශ ලබා ගැනිමට ඉදිරිපත් කරන ලදි. එහිදි ලද නිර්දේශය මත මුල්‍ය වාර්තාවල සටහනක් මගින් පමණක් ඉදිරිපත් කල අතර ප්‍රත්‍යාගණන වාර්තාවේ ඇමුණුමක් ලෙස මෙම වත්කම්වල අයිතිය ආයතනය වෙත පවරා නොතිබුණ වත්කම් පිළිබඳ තොරතුරු හෙළිදරවු කරන ලදි. විගණකාධිපතිගේ නිර්දේශය මත මෙම ටැබ්ලට් 2025 වර්ෂයේ ගිණුම් ගත කිරිමට අවශ්‍ය කටයුතු කර ඇත.

උ) පිලිගතිමි.
2023 වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපත්තිය පදනම් කර ගනිමින් ක්ෂය ගණනය කර තිබූ බැවින් එය නිවැරදි කිරිමට මෙම වර්ෂයේදි කටයුතු නොකල අතර ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපත්තිය මෙම වර්ෂයේදි සංශෝධනය කරන ලදි.

ඌ) පිලිගතිමි.

එ) පිලිගතිමි
මේ වනවිටත් ඊට අදාල පියවර ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකරමින පවති.

2.වෙනත් නෛතික හා නියාමන පිළිබද වාර්තාව

2.2.2

අ) අයතනය අරම්භයේ සිටම මෙම ජංගම ගිණුම් 04 පවතිනබව වාර්ෂික ගිණුම් පරික්ෂා කිරිමේදි නිරික්ෂණය වේ.මෙම ගිණුම් 04 අරම්භ කිරිම සඳහා මහාභාණ්ඩාගාරයෙන් ලබාගත් අනුමැතිය පිලිබද ලිපිලේඛන සොයා ගැනිමට නොහැකිවී ඇත. මේ සම්බන්ධයේන් ඉදිරියේදි මහාභාණ්ඩාගාරයෙන් උපදේස් ලබා ගැනිමට කටයුතු කරමි.

ආ) මෙම ආයතනයේ වසර කීපරයක සිට පවතින සංඛ්‍යාන නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අවස්ථාව නොතිබුණු බැවින් එම තනතුරේ රාජකාරී ඉටුකර ගැනීමට පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි එම වැඩ බැලීම් සඳහා පත් කිරීම් එකී තනතුරු වලට සුදුස්සන් බඳවා ගන්නා තෙක් අදාල අනුමැතිය පාලක මණ්ඩලය වෙතින් ලබාගෙන ඇත..

ඇ) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සාගරිකා හිටිහාමු මහත්මිය චීනයේ පැවති පුහුණු වැඩසටහන් සඳහා 2024 නොවැම්බර් 01 සිට 14 දක්වා සහභාගි විය. ඇයට අනියම් දීමනා (Incidental Allowance) ලෙස අනුග්‍රාහක ආයතනය විසින් දෛනික වියදම් සඳහා ලබා දුන් යුවාන් 2100 ක් (රු.84,000/-) වේ. මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛණය අනුව එකවර ගෙවිය යුතු නමුත් මෙම නිලධාරිණිය විසින් එම මුදල එකවර ගෙවීමට මුල්‍ය ශක්තිකයක් නොමැති බවත් වාරික 36 න් එම මුදල ගෙවීම සඳහා කටයුතු කර දෙන ලෙසත් අධ්‍යක්ෂතුමා වෙත ඉල්ලීමක් කර තිබිණි. ඇයගේ ඉල්ලීම පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර ඇයගේ පසුගිය සේවා කාලය හා ඉදිරියට ඇති සේවා කාලය සළකා බලා රජයට අවාසියක් හෝ අලාභයක් නොවන පරිදි එම නිලධාරිනියගේ මුල්‍ය දුෂ්කරතාවය පිළිබඳව ඇති ප්‍රායෝගික තත්ත්වය සළකා මාසික වාරික 36 න් ගෙවීමට පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. කෙසේ නමුත් මින් ඉදිරියට කුමන හේතුවක් මත හෝ එවැනි සහන ලබා දීමට කටයුතු නොකරන බව ද සඳහන් කරමි.

2.3 වෙනත් කරුණු

අ) 2019 මැයි 27 වන දින 228 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර එවා ඇත. (Cadre list) කෙසේ නමුත් කාර්ය මණ්ඩලයේ ඉල්ලීම

පරිදි නැවත එම ලේඛණය සංශෝධනය කර ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කරන ලද අතර එහි සංශෝධනයක් ලැබෙන තෙක් 2012 වර්ෂයේ සකස් කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය භාවිතා කරනු ලැබේ. අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය මගින් උපදෙස් දී ඇති පරිදි නව කාර්ය මණ්ඩල ඇස්තමේන්තුවක් (සංශෝධන සහිතව) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එම කාර්ය මණ්ඩල ඇස්තමේන්තුව ලැබුණු විගස නව බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කර ඇත.

ආ) වාර්ෂික කාර්යක්ෂමතා කඩඉම් විභාග අවශ්‍යතාවය අනුව පැවැත්වීමට ඉදිරියේ දී කඩිනමින් කටයුතු කරනු ලැබේ.

ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂය රු. 17,915,464 හා මෙම ශිෂ්‍යත්ව ණයගැතියන් සම්බන්ධයෙන් මේ දක්වා කටයුතු කර නොතිබීම සම්බන්ධයෙන් පහත පරිදි පැහැදිලි කිරීම කළ හැක.

දැනට ඇති ශිෂ්‍යත්ව ණය ගැතියන් හා මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග.

| | | |
|---|---|---|
| 1. රංජනී අතුකෝරල මිය | 731,521.00 | ඇයගේ ශ්‍රී ලංකාවේ ඥාතීන් හමුවී විස්තර ලබා දීම නිසා මේ වන විට ඕස්ට්‍රේලියාවේ පදිංචි රංජනී අතුකෝරල 2025 දෙසැම්බර් මස වන විට මෙම මුදල ගෙවන බව දන්වා තිබේ. |
| 2. පී. ඩී. ජේ. ආනන්ද | 2,759, 754.28 | වර්තමාන ලිපිනය නොමැති නිසා නඩුව ඉදිරියට පවත්වා ගෙන යා නොහැක. |
| 3. ගෞරි ශංකර් | 3,654,110.67 | වර්තමාන ලිපිනය නොමැති නිසා නඩුව ඉදිරියට පවත්වා ගෙන යා නොහැක. |
| 4. පී. ඩී. ආර්. කුමාරසිරි | 18,433.49 | ඇපකරුවන් ගෙවීම සිදු කරයි. අවසන් වාරිකය ගෙවීමට නියමිතය. |
| 5. සී. ගාමිණී වික්‍රමසිංහ | 4,392,878.10 | අවසන් තීන්දුවට අනුව ගාමිණී වික්‍රමසිංහ නොගෙවීම නිසා රිට් ආඥාවක් ලබා ගැනීමට දැනට වර්ෂ කිහිපයක සිට නීතිපති දැනුවත් කළ ද එය ක්‍රියාත්මක නොවීය. 2024 වර්ෂයේ දී කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් මාර්ගයෙන් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපතිව දැනුවත් කළ ද එය සිදු නොවීය. ඒ අනුව නැවත සිහි කැඳවීමක් සිදු කිරීමට නියමිතය. |
| 6. ඊ. ඒ. සී. ප්‍රියංකර | 5,272,016.00 | 2022 වර්ෂයේ ඉවත්ව ගිය මෙම නිලධාරියාට විරුද්ධව නඩු කටයුත්තක් සඳහා 2023 වර්ෂයේ නීතිපති වෙත දන්වා ඇත. මේ වන විට නඩු නිමිත්ත අවසන් කර ඊ. ඒ. සී. ප්‍රියංකර හා ඔහුගේ ඇපකරුවන් දෙදෙනා වෙත එන්තර වාසි යවා ඇත. නමුදු එක් ඇපකරුවෙක් හට, එම ඇපකරුගේ වර්තමාන ලිපිනය වෙනස් වීම නිසා එන්තර වාසි ලැබී නැත. ඒ සම්බන්ධයෙන් නීතිපති දැනුවත් කර ඇත. නඩුව ගොනු වෙමින් පවතී. |

මේ සම්බන්ධයෙන් ආයතනය ක්‍රියාත්මක වන අතර මේ වන විට ඇපකර නොගෙවූ ශිෂ්‍යත්ව ලාභීන් 06කට අඩු වී ඇත්තේ ආයතනය විසින් පසුගිය වර්ෂ 05 දී ගනු ලැබූ ක්‍රියාමාර්ග බැවිනි. දැනට ඉතිරි වී ඇති නොගෙවූ ශිෂ්‍යත්ව ඇපකර 03ක්ම වර්තමාන ලිපිනයන් නොමැති නමුදු ආයතනය විසින් තවදුරටත් ඔවුන් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

ඈ) වර්ෂ 05 වැඩි ණයහිමි ශේෂය වන රු. 2,324,342.85 සැකසී ඇති ආකාරය පහත පරිදි වේ.

| | |
|---|---|
| | රු. |
| - නැවත ගෙවියයුතු තැන්පතු | - 115,462.00 |

| | |
|---|---|
| - ආපනශාලා තැන්පතු | - 50,000.00 |
| -සේවයෙන් ඉවත්වූ සේවකයින් ගෙවිය යුතු මුදල | - 189,150.61 |
| -රඳවාගත් තැන්පතු | - 136,526.06 |
| -ණයහිමියෝ | - 57,703.75 |
| - ගෙවියයුතු පාරිතෝෂික | - 126,912.50 |
| -දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යය | -1,000,000.00 |
| -ව්‍යාපෘති වලට අදාල ණයහිමි ශේෂය | - 648,587.75 |
| | 2,324,342.85 |
| | =========== |

**සේවයෙන් ඉවත්වූ සේවකයින් ගෙවිය යුතු මුදල**

ටී. රවිචන්ද්‍රන් මහතා - රු. 150,015.00

මෙම රවිචන්ද්‍රන් මහතා විදේශ ශිෂ්‍යත්ව ණයගැතියෙකුගේ ඇපකරුවෙකුවේ. එබැවින් ඔහුට ගෙවියයුතු පාරිතෝෂික මුදල් ආයතනය විසින් නොගෙවා ඇත.

එන්.එස්. වික්‍රමආරච්චි මහතා -රු. 39,135.61

ආයතනයෙන් ගෙවියයුතු මුදල වන රු. 39,135.61 සම්බන්ධයෙන් මොහු දැනුවත් කලද එම මුදල ලබාගැනීමට ඉදිරිපත් වී නොමැත.

රඳවාගැනීමේ ගාස්තු

මෙම රඳවා ගැනිමේ ගාස්තු ආයතනයේ ඉදිකිරිම් සඳහා වන අතර මෙතෙක් එම අයතන විසින් එම රඳවාගැනිමේ ගාස්තු ලබාගැනීමට ඉදිරිපත්වී නොමැත.

ගෙවිය යුතු පාරිතෝෂික - රු. 126,912.50

පාරිතෝෂික ගෙවිය යුතු වට්නාකම ලෙස ගණනය කර ඇත්තේ ජීවන වියදම් දීමනාව මත ගෙවිය යුතු හිඟ පාරිතෝෂික මුදලය. මෙම ණයහිමියන්ගෙන් දෙදෙනෙකු විදේශ ශිෂ්‍යත්ව ණයගැතියන්ගේ ඇපකරුවන්වේ. එච්.කේ.එස්. ප්‍රේමලාල් මහතා ආයතනයේ ණයගැතියෙකු වේ. එබැවින් මෙම මුදල් මෙතෙක් නිරවුල්කර නොමැත.

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රු.1,000,000.00

මෙම ශේෂය පැල්වෙහෙර නිවාඩු නිකේතනය වෙනුවෙන් ආයතනය ගෙවිය යුතු බදු මුදලයි. මේ සම්බන්ධයෙන් දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලිඛිතව දැනුවත්කර ඇති නමුත් මෙතෙක් පැහැදිලි පිලිතුරක් ලබාදී නොමැත.

ව්‍යාපෘති වලට අදාල ණයහිමි ශේෂයන් 2025 වර්ෂතුල නිරවුල් කිරිමට කටයුතු කරමි.

ඉ) එම වාහන අපහරණය කිරීම සඳහා අදාල චක්‍රලේඛණ ප්‍රකාරව කමිටුවක් පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඉතිරි කටයුතු කඩිනමින් සිදුකරනු ලැබේ.

**මහාචාර්ය එ.එල්.සන්දික**
**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි**

# 04 වැනි පරිච්ඡේදය
# කාර්යසාධක දර්ශක

ප්‍රකාශන

| පර්යේෂණ වාර්තා | කාර්ය පත්‍රිකා | වාර ප්‍රකාශන |
| --- | --- | --- |
| 04 | | 05 |

පුවත් හසුන

02

ව්‍යාපෘති

| පර්යේෂණ ඒකාබද්ධ අරමුදල් | පර්යේෂණ මූල්‍යාධාර (බාහිර) | පුහුණු |
| --- | --- | --- |
| 12 | 04 | 04 |

වෙබ් අඩවි 03

සමාජ මාධ්‍ය

ෆේස්බුක් පරිශීලකයින්

Youtube - උඩුගත කළ වීඩියෝ - 38

# 05 වැනි පරිච්ඡේදය
# තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීමේ කාර්යසාධනය

## ප්‍රගතිය - ක්‍රියාකාරී සැලැස්ම - 2024

**තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග**

සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් හරහා, පසුගිය කාර්තුවේ දත්ත රැස් කිරීමේ ක්‍රම උපායමාර්ගික සැලසුම් කිරීම තුළින් පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂා කළ තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ළඟා වීමට අප ආයතනයට හැකි විය.

| තිරසාර සංවර්ධන ඉලක්කය | ඉලක්කය | ජයග්‍රහණ පිළිබඳ දර්ශක | මේ දක්වා ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50%- 74% | 75%-100% |
| සියලු ස්ථානයක ම පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | පෝෂක ආහාර මෙනු සඳහා වියදම් සහ ඉවසිය හැකිභාවය: පෝෂණ තත්ත්ව විශ්ලේෂණය සහ බහු-මාර්ගික ප්‍රතිපත්ති හා පද්ධති වෙනස්කම්වල දෙසට පියවර ගැනීමේ තීරණ කිරීම ශක්තිමත් කිරීමට විවේචනාත්මක ආකාරය. | පර්යේෂණ වාර්තා | | | ✓ |
| ආහාර සුරක්ෂිතතාව ළඟා කර ගැනීම, පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | ශ්‍රී ලංකාවේ නාගරික අංශයේ පාසල් ළමුන්ගේ ආහාර පරිභෝජන රටාව :සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු සඳහා පවතින බාධක, බලපෑම හා විභවතා පිළිබඳ අධ්‍යයනය | පර්යේෂණ වාර්තා | | ✓ | |
| | ශ්‍රී ලංකාවේ තිරසාර ජීවනෝපාය ඉහළ නැංවීම සඳහා කෘෂි-සංචාරක කර්මාන්තය යොදාගැනීම | පර්යේෂණ වාර්තා | | ✓ | |
| | නවක කෘෂි ව්‍යාපාරයන් හි ප්‍රගමනය: තිරසාර ව්‍යවසායකත්ව සඳහා ඵලදායී මැදිහත්වීම් සැලසුම් කිරීම | පර්යේෂණ වාර්තා | | | |

| තිරසාර සංවර්ධන ඉලක්කය | ඉලක්කය | ජයග්‍රහණ පිළිබඳ දර්ශක | මේ දක්වා ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | **0% - 49%** | **50%- 74%** | **75%-100%** |
| ආහාර සුරක්ෂිතතාව ළඟා කර ගැනීම, පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | | | | ✓ | |
| | අඹ සහ අන්නාසි අගය දාමවල ගොවීන් සහ එකතුකරන්නන් අතර වන ගිවිසුම් පිළිබඳ අධ්‍යයනය | පර්යේෂණ වාර්තා | | ✓ | |
| | ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය හා තිරසරභාවය පිළිබඳ අධ්‍යයනය | පර්යේෂණ වාර්තා | | ✓ | |
| | පොහොරවලින් ඔබ්බ ට :ඉහළ වී නිෂ්පාදනයක් සඳහා තිරසර පෝෂක කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය | පර්යේෂණ වාර්තා | | ✓ | |
| | පහත රට තෙත් කලාපයේ සහල් මූලික පාරිසරික පද්ධතියේ සහභාගී සංරක්ෂණය සහ නිෂ්පාදන ශක්තිමත් කිරීම | පර්යේෂණ වාර්තා | | ✓ | |
| | වර්මි කොම්පෝස්ට් සහ කාබනික ද්‍රව පොහොර නිෂ්පාදනය සහ ගොවිතැනේ යෙදීම ප්‍රවර්ධනය කිරීම | පර්යේෂණ වාර්තා | | ✓ | |
| | පලතුරු සහ එළවළු සැපයුම් දාමවල ප්ලාස්ටික් කූඩ භාවිතය: එහි කාර්යක්ෂමතාවය ඇගයීම | පර්යේෂණ වාර්තා | | ✓ | |
| | ඩිජිටල් විභවය අගුළු හැරීම: ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති ප්‍රගතිය සඳහා වන අභියෝග සහ උපායමාර්ග | පර්යේෂණ වාර්තා | | ✓ | |
| **දේශගුණික විපර්යාස සහ එහි බලපෑම්වල ට එරෙහි ව සටන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම** | ශ්‍රී ලංකාවේ වී ගොවිතැන කෙරෙහි දේශගුණික තත්ත්වයන් හි ඔරොත්තු දීමේ හැකියාවන් සඳහා වන පුරෝකථනයන් ට ගොවීන්ගේ අනුගත වීම අධ්‍යයනය | පර්යේෂණ වාර්තා | | ✓ | |

## ප්‍රගතිය - ක්‍රියාකාරී සැලැස්ම - 2024

**2024 වර්ෂයට වෙන් කල මුදල - රු. 30,000,000.00**

**පර්යේෂණ අධ්‍යයන සහ පුහුණු වැඩසටහන් සහ එහි ප්‍රගතිය 2024. 12.31 දක්වා**

| අ/ආ | වැඩසටහන | මූල්‍ය (රු.මිලියන) | | භෞතික (%) | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය | ඉලක්ක | ප්‍රගතිය |
| 1 | **කෘෂිකාර්මික අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවේ ප්‍රගතිය සඳහා වන අභියෝග සහ විභවතා: කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින්** | 0.8 | 0.502 | 70 | 60 |
| 2 | ශ්‍රී ලංකාවේ තිරසාර ජීවනෝපාය ඉහළ නැංවීම සඳහා කෘෂි-සංචාරක කර්මාන්තය යොදාගැනීම | 1.2 | 1.282 | 100 | 75 |
| 3 | නවක කෘෂි ව්‍යාපාරයන්හි ප්‍රගමනය: තිරසාර ව්‍යවසායකත්වය සඳහා ඵලදායී මැදිහත්වීම් සැලසුම් කිරීම | 1.68 | 1.71 | 100 | 75 |
| 4 | ශ්‍රී ලංකාවේ නාගරික අංශයේ පාසල් ළමුන්ගේ ආහාර පරිභෝජන රටාව: සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු සඳහා පවතින බාධක, බලපෑම හා විභවතා පිළිබඳ අධ්‍යයනය | 1.1 | 1.145 | 100 | 75 |
| 5 | ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන: ක්‍රියාකාරීත්වය සහ තිරසාරභාවය | 2.09 | 1.76 | 55 | 50 |
| 6 | අඹ සහ අන්නාසි අගය දාමවල ගොවීන් සහ එකතුකරන්නන් අතර වන ගිවිසුම් පිළිබඳ අධ්‍යනය | 1.5 | 1.09 | 100 | 75 |
| 7 | පොහොරවලින් ඔබ්බට: ඉහල වී නිෂ්පාදනයක් සඳහා තිරසර පෝෂක කළමනාකරණය පිලිබඳ අධ්‍යනය | 1.52 | 1.331 | 100 | 75 |
| 8 | ශ්‍රී ලංකාවේ වී ගොවිතැන කෙරෙහි දේශගුණික තත්ත්වයන්හි ඔරොත්තු දීමේ හැකියාවන් සඳහා වන පුරෝකථනයන්ට ගොවීන්ගේ අනුගත වීම අධ්‍යනය | 1.2 | 1.138 | 100 | 75 |
| 9 | පෝෂක ආහාර මෙනු සඳහා වියදම් සහ ඉවසිය හැකිභාවය: පෝෂණ තත්ත්ව විශ්ලේෂණය සහ බහු-මාර්ගික ප්‍රතිපත්ති හා පද්ධති වෙනස්කම්වල දෙසට පියවර ගැනීමේ තීරණ කිරීම ශක්තිමත් කිරීමට විවේචනාත්මක ආකාරය. | 0.5 | - | 100 | 75 |
| 10 | පහත රට තෙත් කලාපයේ සහල් මූලික පාරිසරික පද්ධතියේ සහභාගී සංරක්ෂණය සහ නිෂ්පාදන ශක්තිමත් කිරීම | 0.5 | 0.390 | 100 | 70 |
| 11 | ගොවිතැනේදී වර්මි-කොම්පෝස්ට් සහ කාබනික ද්‍රව පොහොර නිෂ්පාදනය සහ යෙදීම ප්‍රවර්ධනය කිරීම. | 0.8 | 0.751 | 100 | 100 |
| 12 | පළතුරු සහ එළවළු සැපයුම් දාමවල ප්ලාස්ටික් කූඩ භාවිතය: එහි කාර්යක්ෂමතාවය ඇගයීම | 0.93 | 0.958 | 100 | 60 |
| 13 | T- 476 කෘෂිකාර්මික ව්‍යවසායකයින් ලෙස දියුණු වීමට ඇති අවස්ථා පිළිබඳව ග්‍රාමීය තරුණ ප්‍රජාවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් | 1.2 | 1.094 | 100 | 100 |
| 14 | T- 473 කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන (දෙවන අදියර) | 0.2 | 0.193 | 100 | 100 |

| අ/ආ | වැඩසටහන | මූල්‍ය (රු.මිලියන) | | භෞතික (%) | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය | ඉලක්ක | ප්‍රගතිය |
| 15 | T-468/T- 469/T-470 ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යාම | 1.4 | 1.64 | 100 | 100 |
| 16 | T- 471/T-475 ගොවි සංවිධාන ශක්තිමත් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 2.2 | 1.764 | 100 | 100 |
| 17 | සම්මන්ත්‍රණ සහ වැඩමුළු | 0.4 | 0.4 | 100 | 100 |
| 18 | ආයතනයේ ප්‍රකාශන | 0.4 | 0.076 | 100 | 50 |
| 19 | මාධ්‍ය කටයුතු | 1.644 | 1.393 | 100 | 100 |
| 20 | පර්යේෂණ හා පුහුණු කටයුතු අධීක්ෂණය කිරීම. | 0.770 | 0.390 | 100 | 100 |
| 21 | වත්කම් - උපකරණ | 8.0 | 5.7 | 100 | 80 |
| | **TOTAL** | **30.0** | **24.55** | | |

# 06 වැනි පරිච්ඡේදය:
# මානව සම්පත් පැතිකඩ

**2024 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩල තත්ත්වය**

| 2024 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩල තත්ත්වය | | | | |
|---|---|---|---|---|
| | 31.12.2023 දිනට තත්ත්වය | වසර තුළ විශ්‍රාම යැම් සේවයෙන් ඉවත් වීම් | බඳවා ගැනීම් | **2024.12.31** දිනට තත්ත්වය |
| අධ්‍යක්ෂ | 1 | 1 | 1 | 1 |
| අතිරේක අධ්‍යක්ෂ | - | - | - | - |
| අංශ ප්‍රධානීන් | 6 | - | - | 6 |
| පර්යේෂණ කාරය මණ්ඩලය | 20 | 3 | 1 | 18 |
| පරිපාලන කාර්යමණ්ඩලය | 7 | 1 | - | 6 |
| පුස්තකාල ජොෂ්ඨ කාර්යමණ්ඩලය | 1 | - | - | 1 |
| දත්ත සංවර්ධන බැංකුව | - | - | - | - |
| පරිගණක ඒකකය | - | - | - | - |
| ප්‍රකාශන ඒකකය | 5 | 2 | - | 3 |
| සංඛ්‍යාන කාර්යමණ්ඩලය | 12 | - | 1 | 13 |
| තාක්ෂණික කාර්යමණ්ඩලය | 2 | - | - | 2 |
| ලිපිකරු, රහස්‍ය ලේකම් සහ සමාන්තර ශ්‍රේණි කාර්යමණ්ඩල | 34 | 2 | - | 32 |
| මෙහෙයුම් සහ සමාන්තර ශ්‍රේණි | 38 | 3 | 3 | 38 |
| **එකතුව** | 126 | 12 | 6 | 120 |

**කාර්යමණ්ඩල පුහුණුව**

2024 වර්ෂයේ දී ආයතනය විසින් රුපියල් මිලියන 6ක් ඒකාබද්ධ අරමුදලින් වෙන් කරන ලදී. කෙසේ වෙතත්, රටේ පැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් මහා භාණ්ඩාගාරය විසින් 2024 වසරේ පුහුණු වියදම් සීමා කළ අතර. එම වර්ෂය තුළ පුහුණුවීම් සඳහා වැය කළ මුදල රුපියල් 1,682,248.00 කි.

පහත පර්යේෂණ නිලධාරීහු පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නිරත වූහ.

- ඉන්දිකා එදිරිසිංහ, පර්යේෂණ නිලධාරී - ආචාර්ය උපාධිය, පුත්‍රා විශ්ව විද්‍යාලය, මැලේසියාව.
- උත්පලා ජයසිංහ, පර්යේෂණ නිලධාරී - ආචාර්ය උපාධිය, ටසුකුබා විශ්ව විද්‍යාලය, ජපානය.
- රිෆානා බුහාරි, පර්යේෂණ නිලධාරී - ආචාර්ය උපාධිය, වෙස්ටන් සිඩ්නි විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාව.
- රසිකා විජේසිංහ, පර්යෝෂණ නිලධාරී - පශ්චාත් උපාධිය (ශාස්ත්‍රපති), යුනිවර්සිටි කැනඩා වෙස්ට්, කැනඩාව.
- දිනූෂා රත්නායක, පර්යේෂණ නිලධාරී - පශ්චාත් උපාධිය (ශාස්ත්‍රපති), කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව.

**විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම (වැඩසටහන්/ සම්මන්ත්‍රණ/ වැඩමුළු/ රැස්වීම්).**

- එන්. පී. ජී. සමන්ත, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී - ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලද සංචාරයේ නියෝජිතයෙක් වශයෙන් 2024 පෙබරවාරි 12 සිට 18 දක්වා ඉන්දියාවේ සංචාරයකට සහභාගී වීම.
- එස්. පී. ප්‍රනාන්දු, පර්යේෂණ නිලධාරී - චීනයේ පැවති " Food Security and Repletion of Post Production Loss for Belt and Road Countries under the Global Development Initiatives" සැසිය සඳහා 2024 අප්‍රේල් 16 සිට මැයි 01 දක්වා සහභාගි විය.
- අයි. පී. පී. එම්. විජේසිංහ, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී - චීනයේ පැවති "Agricultural Standardization Co – Operation between China and South Asian Countries" සැසිය සඳහා 2024 මැයි 12 සිට 27 දක්වා සහභාගී විය.
- ඒ. කේ. ඒ. දිසානායක සහ ජේ. ඒ. යූ. පී. ජයසිංහ යන පර්යේෂණ නිලධාරීන් - දකුණු කොරියාවේ පැවති, කොරියානු ජාකපන්තෝ සහයෝගිතා ඒජන්සිය (KOIKA) විසින් සංවිධානය කරන ලද "උද්භිත විද්‍යා කර්මාන්තයේ ධාරිතා සංවර්ධනය" වෙනුවෙන් පැවති පුහුණු වැඩසටහන සඳහා 2024 ජූනි 08 සිට 21 දක්වා සහභාගී විය.
- ඩී. ටී. පී. එස්. ධර්මවර්ධන, පර්යේසණ නිලධාරී - ඉන්දියානු රජයේ අනුග්‍රහයෙන් (ITEC) පැවති "ආහාර බෝග ආරක්ෂා කිරීම සඳහා පළිබෝධනාශක සහ ඒවායේ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම" යන මැයින් වූ පුහුණු වැඩසටහනක් සඳහා 2024 අගෝස්තු 22 සිට සැප්තැම්බර් 04 දක්වා සහභාගී විය.
- සාගරිකා හිටියාමු, ජ්‍යෙෂ්ඨ පර්යේෂ නිලධාරී - චීන රජයේ අනුග්‍රහයෙන් පැවති "සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා නිවර්තන කෘෂි සංචාරක සංවර්ධනය සහ සැලසුම්කරණය" යන මැයින් වූ පුහුණු වැඩසටහනක් සඳහා 2024 නොවැම්බර් 01 සිට 14 දක්වා සහභාගී විය.
- ජී. වී. එන්. අයෝමි, පර්යේෂණ නිලධාරී - මැලේසියානු රජයේ අනුග්‍රහයෙන් පැවති "ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය කරා ග්‍රාමීය සංචාරක ව්‍යාපාරය" යන මැයින් වූ පුහුණු වැඩසටහනක් සඳහා 2024 ඔක්තෝම්බර් 09 සිට 17 දින දක්වා සහභාගී විය.
- දුමින්ද ප්‍රියදර්ශන, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී - ආසියානු ඵලදායිතා සංවිධානය විසින් පාකිස්ථානයේ දී සංවිධානය කරන ලද "කෘෂිකාර්මික යාන්ත්‍රික ආකෘති මිනුම් සලකුණු කිරීම" පිළිබඳ වැඩමුළුව සඳහා 2024 නොවැම්බර් 11 සිට 14 දක්වා සහභාගී විය.

# 07 වන පරිච්ඡේදය
# අනුකූලතා වාර්තාව

| අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යකරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| **1.** මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | | | |
| 1.1 සමාලෝචනය කරන ලද වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ නියමිත දිනට ඉදිරිපත් කර තිබීම. | √ | | |
| **2.** විගණනය සඳහා ප්‍රතිචාර දැක්වීම | | | |
| 2.1 විගණකාධිපතිවරයා විසින් නියම කරන ලද දිනට විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම. | √ | | |
| 2.2 විගණකාධිපතිවරයා විසින් ඉකුත් වසරවල නිකුත් කරන ලද විගණන විමසුම්/ විගණන ඡේදවල පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීම. | √ | | |
| **1.** සැලසුම් | | | |
| 1.1 ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | √ | | |
| 1.2 සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට අනුමත කර ගැනීම. | √ | | |
| 1.3 සමාලෝචිත වර්ෂයේ අයවැය සඳහා නියමිත දිනට අනුමැතිය ලබා ගැනීම. | √ | | |
| 1.4 නියමිත දිනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම. | √ | | |
| **2.** ගාස්තු පාලනය | | | |
| 2.1 සෑම වසර පහක ට වරක් ගාස්තු අය කෙරෙන දේපළ තක්සේරු කර තිබීම. | | | තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| 2.2 සමාලෝචිත වසර සඳහා බිල්ගත කර ඇති ආදායමෙන් 70% ඒම වසර තුළ දී ම ඒකතු කර ගැනීම<br><br>2.3 හිඟ හිටි ගාස්තු අය කරවා ගැනීම සඳහා වොරන්ට් බලපත්‍ර නිකුත් කොට තිබීම. | √<br><br>අදාළ නොවේ. | | |

| අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යකාරක ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| **3. කුලී පාලනය** | | | |
| 3.1 වාර්ෂික ව කුලියට දී තිබෙන සියලුම දේපළ (මස් වෙළඳසැල්/ මාලු වෙළෙඳසැල් /පොදු සති පොළවල් ) සමාලෝචිත වසර තුළ දී කුලියට දීම. | අදාළ නොවේ | | |
| 3.1.1 කුලියට දෙනු ලබන දේපළ සම්බන්ධයෙන් ගිවිසුම්වල ට එළඹ සිටීම. | අදාළ නොවේ | | |
| 3.1.2 වාර්ෂිකව කුලියට දෙනු ලබන දේපළවලින් අයවිය යුතු බදු අයකර ගැනීම | අදාළ නොවේ | | |
| 3.1.3 හිඟ හිටි මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | අදාළ නොවේ | | |
| 3.1.4 දීර්ඝ කාලයක් සඳහා කුලියට දීම ට නියමිත ව පැවති දේපළ (පොදු වෙළඳපළ කඩ) කුලියට දීම. | අදාළ නොවේ | | |
| 3.1.5 දීර්ඝ කාලයක් සඳහා කුලියට දීම ට නියමිත ව දේපළ සම්බන්ධයෙන් ගිවිසුම්වල ට එළඹ සිටීම. | අදාළ නොවේ | | |
| **4. ව්‍යාපාර බදු සහ වෙළෙඳ බලපත්‍ර පරිපාලනය** | | | |
| 4.1.1 සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපාරික බදු හා වෙළෙඳ බලපත්‍ර ගාස්තු ඒකතු කිරීමට සමීක්ෂණයක් පවත්වා තිබීම | අදාළ නොවේ | | |
| 4.1.2 බලපත්‍ර ලබාගෙන නොමැති ව්‍යාපාරික ස්ථානවල ට ඒරෙහි නඩු පැවරීම | අදාළ නොවේ | | |
| **5. විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 5.1 අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පැවැත්වීම | ✓ | | |
| **6. බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 6.1.1 නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා සූදානම් කිරීම | √ | | |
| 6.1.2 සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට නැවත පැමිණෙමින් පැවති අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කොට පැවතීම | √ | | |
| 6.2 බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා සැලසුම් කළ යුතුව පැවති ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට ඒම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කිරීම | √ | | |
| **7. වත්කම් කළමනාකරණය** | | | |
| 7.1 සියලු වත්කම් ලේඛනගතකොට පැවතීම | √ | | |
| 7.2 සියලුම වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම | √ | | |
| 7.3 සියලුම වත්කම් අත්පත් කරගෙන සිටීම | √ | | |

| අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යකරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| 7.4 රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව , භාණ්ඩ සමීක්ෂණ පවත්වන ලද අතර අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | √ | | |
| 7.5 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිද කිරීම | √ | | |
| 7.6 ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 77න අනුව සිදුකොට තිබීම | | | අපහරණය කිරීමට අංශය කටයුතු සිදු කරමින් පවතී. |
| **8.** වාහන කළමනාකරණය | | | |
| 8.1 සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | √ | | |
| 1.1 වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කොට පැවතීම | | | අපහරණය කිරීමට කටයුතු යොදා ඇත. |
| 1.1 වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කොට තිබීම | √ | | |
| 1.2 සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ 103, 104, 109 හා 110 ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කොට තිබීම | √ | | |
| 1.2.1 2016.12.29 දිනැති අංක 2016/ 30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාර ව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කොට පැවතීම | √ | | |
| 1.3 ආයතනයේ වාහන නඩත්තු ලේඛනයක් යාවත්කාලීන ව පවත්වා ගෙන යාම | √ | | |
| 1.4 ආයතනයේ ඉන්ධන ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | √ | | |
| අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය | අනුකූල නොවේ නම් | අනුකූල නොවීම අනාගතයේ දී |

| | (අනුකූල වේ /නොවේ) | ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යාකරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| **2. කාර්ය මණ්ඩල කළමනාකරණය** | | | |
| 2.1 අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ ගෙවීම් සිදු කිරීම | √ | | |
| කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තුව ලිඛිත ව ලබා දීම | √ | | |
| 2.2 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට පැවතීම | √ | | |
| **3. නවතම යාවත්කාලීන කිරීම් සහිත ව පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම** | | | |
| 3.1 ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය | √ | | |
| 3.2 ස්ථාවර වත්කම් ලේඛනය | √ | | |
| 12.3 කොන්ත්‍රාත් ලේඛනය | - | | |
| 12.4 විගණන විමසුම් ලේඛනය | √ | | |
| 12.5 චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය | √ | | |
| 12.6 ඉන්වෙන්ට්‍රි ලේඛනය | √ | | |
| 12.7 පාරිභෝගික භාණ්ඩ ලේඛනය | √ | | |
| 12.8 හානි - පාඩු ලේඛනය | අදාළ නොවේ | | |
| 12.9 උපපත්‍රිකා පොත් ලේඛනය | අදාළ නොවේ | | |
| 12.10 අත්තිකාරම් ලේඛනය | √ | | |
| 12.11 කර්මාන්ත/ ව්‍යාපාරික බදු | අදාළ නොවේ | | |
| 12.12 ණයගැති ලේඛනය | √ | | |
| 12.13 ණයහිමි ලේඛනය | | | ව්‍යාපෘති වෙනුවෙන් පවත්වා ගෙන යයි. |
| 13.14 ටෙන්ඩර් මණ්ඩල තීරණ ලේඛනය | √ | | |
| 12.15 වීදි ලාම්පු ලේඛනය | අදාළ නොවේ | | |
| 12.16 මැණුම් පොත | අදාළ නොවේ | | |
| 12.17 මාර්ග ලේඛනය | අදාළ නොවේ | | |
| 12.18 ඉඩම් කට්ටි බදු ලේඛන | අදාළ නොවේ | | |
| 12.19 ගොඩනැගිලි අයදුම්පත්‍ර ලේඛනය | අදාළ නොවේ | | |
| 12.20 අනකූලතා ඇගයුම් ලේඛනය | අදාළ නොවේ | | |
| අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය | අනුකූල නොවේ නම් | අනුකූල නොවීම අනාගතයේ දී |

| | | (අනුකූල වේ /නොවේ) | ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යක ණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **4.** | **අපද්‍රව්‍ය කළමනාකරණය** | | | |
| 4.1 | ජාතික ප්‍රතිපත්තිය අනුව අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස්කොට පැවතීම | √ | | |
| 4.2 | කුණු කසල වෙන්කොට සහා සීමාව තුළ ඒකතු කිරීම | √ | | |
| **5.** | **පාරිසරික කටයුතු** | | | |
| 5.1 | ප්‍රදේශය තුළ අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම හේතුවෙන් පරිසරයට හානි වී නො තිබීම | √ | | |
| 5.2 | ප්‍රදේශයේ කර්මාන්තශාලාවලින් පිටවන අහිතකර අපද්‍රව්‍ය නිසා පරිසරයට සිදුවන හානිය පාලනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම | අදාළ නොවේ | | |
| **6.** | **අතුරු අවස්ථා** | | | |
| 6.1 | මහනගර සභා, ප්‍රාදේශීය සභා ආඥා පනතේ 272 වගන්තිය ප්‍රකාර ව අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ යුතු කාර්යයන් සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට පැවතීම | අදාළ නොවේ | | |
| 6.2 | ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් සභාව විසින් සිදු කළ යුතු ක්‍රියාකාරකම් වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ සඳහන් කොට පැවතීම | අදාළ නොවේ | | |
| 6.3 | ඒම ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම | අදාළ නොවේ | | |
| **7.** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 7.1 | තොරතුරු දැනගැනීමේ පනත අනුව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ නිසි ලේඛනයක් පවත්වා ගෙන යාම | √ | | |
| 7.2 | ආයතනය පිළිබඳ තොරතුරු ඒහි වෙබ් අඩවිය හරහා ලබා දී, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සැළසීම | √ | | |
| 7.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10වැනි වගන්ති ප්‍රකාර ව වසරකට දෙවතාවක් හා වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම | √ | | |
| **8.** | **ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම** | | | |
| 8.1 | සභාවට ලැබෙන සියලුම ගොඩනැගිලි සැලසුම් වාර්තා කිරීමට ලේඛනයක් යාවත්කාලීන ව පවත්වා ගෙන යාම | අදාළ නොවේ | | |
| 8.2<br>8.3 | අයදුම්පත්වල ගැටලු සම්බන්ධයෙන් දින 05ක් ඇතුළත අදාළ පුද්ගලයන්ට දැනුම් දීම<br>අයදුම්පත් ලැබීමෙන් සතියක් ඇතුළත පවත්වනු ලබන සැලසුම් කමිටුවේ ප්‍රථම රැස්වීමට අයදුම්පත ඉදිරිපත් කොට තිබීම | අදාළ නොවේ | | |
| 8.4 | පුරවැසි ප්‍රඥප්තියෙහි සඳහන් නියමිත දිනට (සති 8ක් තුළ) ගොඩනැගිලි සැලසුම්වලින් 80%කට වඩා අනුමත කිරීම | අදාළ නොවේ | | |

| අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යක ණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| **9.** පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| 9.1 අංක 05/2008 හා 05/2008 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | අදාළ නොවේ | | |
| 9.2 ඒම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කිරීම | අදාළ නොවේ | | |
| **10. මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 10.1 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම | | | සකස් කරමින් පවතී. |
| 10.2 කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයක ට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කිරීම | | පැය 03-06 අතර කාලයකි. | |
| 10.3 ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කොට පැවතීම | | අත්සන් කර නොමැත. | |
| 10.4 මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම | √ | | |
| **11. විද්‍යුත්- පළාත් පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම** | | | |
| 2018.07.19 දිනැති පළාත් පාලන චක්‍රලේඛ අංක 2018/e-Local Government-01 ට අනුව අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම | | | සකස් කරමින් පවතී. |
| අන්තර්ජාලය හරහා ගෙවීම් සිදුකිරීමට පුරවැසියන්ට පහසුකම් සැලසීම. | | | 2023 සිට ක්‍රියාත්මක යි. |
| පාරිභෝගිකයින් ට හිතකර සේවාවක් සැපයීම සඳහා පෙරටු කාර්යාල (front offices) හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන හඳුන්වා දීම | අදාළ නොවේ | | |